209 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 209 - இல. 2
**Volume 209 - No. 2**

2012 ජුනි 06 වන බදාදා
2012 யூன் 06, புதன்கிழமை
**Wednesday, 06th June, 2012**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශ :**

ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතා
ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මහතා

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம்:**

மாண்புமிகு இரத்ன தேசப்பிரிய சேனாநாயக்க

மாண்புமிகு டபிள்யு.ஐ. பர்னாந்து

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
The Hon. Ratna Deshapriya Senanayake
The Hon. W.I. Fernando

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 ජුනි 06 වන බදාදා***
*2012 ஜூன் 06, புதன்கிழமை*
*Wednesday, 06th June, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி..ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2000, 2001, 2002, 2003, 2004 සහ 2005 වර්ෂ සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තා. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

(i) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 ජූනි 20 දිනැති අංක 1711/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

(ii) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 64 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 නොවැම්බර් 01 දිනැති අංක 1730/9 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

(iii) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 නොවැම්බර් 02 දිනැති අංක 1730/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග;

(iv) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 නොවැම්බර් 23 දිනැති අංක 1733/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග; සහ

(v) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමඟ කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2011 නොවැම්බර් 23 දිනැති අංක 1733/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

(i) 2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2011 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2011 වර්ෂය සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව. [සමාජ සේවා අමාත්‍ය ගරු ෆීලික්ස් පෙරේරා මහතා වෙනුවට ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### பலன புத்தர் சிலை அமைப்புச் சப (கூட்டிணைத்தல்) சட்டமூலம்
### ORGANIZATION FOR THE CREATION OF BALANA BUDDHA STATUE (INCORPORATION) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ 'ඒ' ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2012 ජුනි 07 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2012 யூன் 07, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "A", to be considered upon Thursday, 07th June, 2012.*

### ද.මු. දසනායක සමාජ සේවා හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### த.மு. தசநாயக்க சமூக சேவைகளும் அறக்கட்டளை தர்ம ஸ்தாபனமும் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### D.M DASSANAYAKE SOCIAL SERVICES AND CHARITY FOUNDATION (INCORPORATION) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, මම ද.මු. දසනායක සමාජ සේවා හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ "ඒ" ස්ථාවර කාරක සභාවේ වාර්තාව හා එහි කාර්ය සටහන් ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ද.මු. දසනායක සමාජ සේවා හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව විසින් සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත."

***පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2012 ජුනි 07 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2012 யூன் 07, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee "A", to be considered upon Thursday, 07th July, 2012.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බද්දේගම, පිළගොඩ, නලින් ජයසිංහ මාවත, දයානන්ද කඩේ බාරේ යන ලිපිනයෙහි පදිංචි එම්. චන්ද්‍රා විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අම්බලන්ගොඩ, අලුත්වල දකුණ, රත්මැහැර ජනපදය යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. ජේමදාස මහතාගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා - පැමිණ නැත.

**ගරු ජීවන් කුමාරණතුංග මහතා (තැපැල් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)

ගරු කථානායකතුමනි, මම මොරටුව, උයන, ලේඩි ඩී සොයිසා පටුමග, නො. 80 යන ලිපිනයෙහි පදිංචි ක්‍රිසාන්ත ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - පැමිණ නැත.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා - පැමිණ නැත.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)

ගරු කථානායකතුමනි, මම කඩුගන්නාව, රාජාවත්ත, නො. 225 යන ලිපිනයෙහි පදිංචි එච්.පී. ඇග්නස් නෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

ගරු කුමාර වෙල්ගම මහතා - පැමිණ නැත.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே — விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු කථානායකතුමනි, මම නාවලපිටිය, බෙලි පාර, නො. 54 යන ලිපිනයෙහි පදිංචි එස්.එල්. පාතිමා රියානා සෙයියදූ ලෙබ්බෙ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) රාගම, දඩුවත්ත, නො. 182 යන ලිපිනයෙහි පදිංචි කේ. අනිල් ක්‍රිස්ටි ඩයස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) රාජගිරිය, කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, ආයතන අංශය යන ලිපිනයෙහි සේවය කරන ආර්.එම්. අමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) නිට්ටඹුව, වේබඩගල්ල, නො. 66/3/3 යන ලිපිනයෙහි පදිංචි එල්.ජී.එස්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) රුවන්වැල්ල, ඉහළ මොරාවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. සිරිපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාවනැල්ල, දනාගම වත්ත, නො. 63 යන ලිපිනයෙහි පදිංචි කේ.වී. මියුලින් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(6) රුවන්වැල්ල, යටන්වල, ගල්කොටුවේ ගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.කේ.එල්.ආර්. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) වරකාපොල හරහා, වේරගල, පහළ මායින් තොලුව යන ලිපිනයෙහි පදිංචි ඩී. රෝහිණී නිමල් ජයතිස්ස මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) රාජගිරිය, කොළඹ විශ්වවිද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, පාලන අංශය යන ලිපිනයෙහි සේවය කරන කේ.ජී.බී.එම්. හේරත් මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය වූ ගුරුවරුන් : වැටුප්
அதிபர் சேவைக்கு உள்ளீர்க்கப்பட்ட ஆசிரியர்கள்: சம்பளம்
TEACHERS ABSORBED INTO PRINCIPALS' SERVICE : SALARIES

1116/'11

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ගුරු සේවයේ යෙදී සිටිය දී විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ තරග විභාගයට ඉදිරිපත් වී, සමත් වීමෙන් පසු විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය වූ විදුහල්පතිවරුන් කලින් සේවයට වඩා පහළ වැටුපක් ලබන බවත්;

(ii) එම හේතුව නිසා ඔවුන් දැඩි මානසික හා ආර්ථික අපහසුතාවන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැඩි කැපවීමකින් පාසල් කළමනාකරණ කටයුතුවල නියුක්තව සිටින එම පිරිස මීට පෙර ගුරු සේවයේ දී ලැබූ වැටුප් තලයට වැඩි වැටුප් තලයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් සකසනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஆசிரிய சேவையில் ஈடுபட்டிருக்கையில், அதிபர்களை ஆட்சேர்ப்பதற்கான போட்டிப் பரீட்சைக்குத் தோற்றி, சித்தியடைந்ததன் பின்னர், அதிபர் சேவைக்கு உள்ளீர்க்கப்பட்ட அதிபர்கள், முன்னைய சேவையை விடக் குறைந்த சம்பளத்தைப் பெறுகிறார்கள் என்பதையும்;

(ii) மேற்படி காரணத்தினால் அவர்கள் மிகுந்த உள ரீதியான மற்றும் பொருளாதார நெருக்கடிகளுக்கு முகம் கொடுத்துள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மிகுந்த அர்ப்பணிப்புடன் பாடசாலை முகாமைத்துவ நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள இக்குழுவினரை இதற்கு முன்னர் ஆசிரிய சேவையில் பெற்ற சம்பள மட்டத்தை விட உயர்வான சம்பள மட்டத்தில் அமர்த்துவதற்கு நடவடிக்கை எடுப்பாரா?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) தற்போது அதற்கான முறைமையொன்று தயாரிக்கப்பட்டுள்ளதா?

(iii) அவ்வாறின்றேல், அத்தகைய முறைமை யொன்று உருவாக்கப்படும் கால எல்லை யாது?

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) principals who were absorbed into the Principals' Service while serving in the Teachers' Service subsequent to the passing of the competitive examination to recruit principals, are paid a lower salary than that of their previous service; and

(ii) they are subject to severe mental agony and economic hardships as a result?

(b) Will he inform this House-

(i) whether action will be taken to place this group, who are engaged in school administrative activities with immense dedication, in a higher salary scale than the scale they received previously while serving in the Teachers' Service;

(ii) whether a scheme has been prepared for this purpose by now;

(iii) if not, the time frame in which such a scheme will be prepared?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) අනුරූපී වැටුප් පියවරෙහි පිහිටුවනු ලබන හෙයින් වර්තමානයේ එම තත්ත්වය නොපවතී.

(ii) දැන් එය මඟ හැරී ඇත.

(ආ) (i) දැනටමත් කටයුතු කර තිබේ.

(ii) ඔව්.

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟතාව මත 2011/24 චක්‍රලේඛය මඟින් ගුරු සේවයේ ලබමින් සිටි වැටුපට වැඩි ඊළඟ වැටුප් පියවරේ තබා වැටුප් සැකසීමට උපදෙස් දී ඇත.

(iii) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරන්නේ, ගුරු සේවයේ ඉහළම වැටුප් තලයට පැමිණි කෙනෙක් විභාගය සමත් වෙලා විදුහල්පති සේවයට ඇතුළත් වුණාම එම ගුරු සේවයේ ඉහළ වැටුපට සමාන වැටුපක් ලැබෙනවාය කියායි. නමුත් මීට කලින් එහෙම නොලැබුණු පිරිසක් ඉන්නවා. දැන් ඒ අය විශ්‍රාම ගනිද්දී හම්බ වෙන්නේ ගුරු සේවයේ තිබුණු ඉහළ වැටුපද නැත්නම් විදුහල්පති සේවයේදී ලැබුණු පහළ වැටුපද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

වැටුප හදා ගත්තේ නැත්නම් පහළ වැටුප තමයි හම්බ වෙන්නේ. ඉහළ වැටුප හම්බ වෙන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඒක තමයි. ඒක හදා දෙන එක-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඒ ගුරුවරයා ඉල්ලීමක් කළාම අපට හදා දෙන්නට පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පැහැදිලියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අතීතයට බලපාන විධියට මේ වැටුප හදා දෙනවාද? ඒ කියන්නේ, විදුහල්පති සේවයේ ස්ථාපනය කළ දිනයට බලපාන විධියට මේ වැටුප හදා දෙනවාය කියා ඔබතුමාට වගකීමක් ඇතිව මේ ගරු සභාවේ දී කියන්න පුළුවන් ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමා අහන්නේ දෙවන අතුරු ප්‍රශ්නය ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ඔව්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

එහෙම ඉහළ, පහළ යන එක තමන්ගේ වැඩක්. කෙසේ නමුත් ඉල්ලීමක් කළොත් හදා දෙන්නට පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මම මේ ලිපිය ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ලැබෙන්නට සලස්වනවා. මේ මිරිස්ස මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා ගැනයි කියන්නේ. සාමාන්‍යයෙන් අප දන්නවා, 10වන ශ්‍රේණියේ සහ ඉන් ඉහළ ශ්‍රේණිවල දරුවන්ට නිල ඇඳුම සඳහා දිග කලිසමකට තමයි රෙදි ලැබෙන්නේ කියලා. එහෙම ලැබෙද්දීත් මේ විදුහල්පතිතුමා 10වන ශ්‍රේණියේ දරුවන්ට කොට කලිසම් ඇඳගෙන එන්නය කියා බල කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්නයට අදාළව -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම මේ විදුහල්පතිතුමා ගැන කියන්නේ. විදුහල්පති සේවය ගැන නේ මා ප්‍රශ්නය අසා තිබෙන්නේ. එම නිසා අදාළයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදුහල්පතිතුමා බල කරනවා, ඉස්කෝලයේ නිල ඇඳුම වශයෙන් දිග කලිසම් අඳින්න රෙදි දීලත් කොට කලිසම් අඳින්නය කියා. මේක බරපතළ ප්‍රශ්නයක්. කරුණාකර ඔබතුමා මේ ගැන පරීක්ෂණයක් කරනවා ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඒ ගැන පරීක්ෂණයක් කරන්නට පුළුවන්. තමුන්නාන්සේ පාසල පැත්තේ ගියාද? දෙමව්පියන්ට කියන්න එවැනි වැරදි නියෝග පිළිපදින්නට එපාය කියා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නැහැ, මම දැන් ඔබතුමාට දෙනවා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. එම ප්‍රශ්නයට පිළිතුරයි අවශ්‍ය වන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

හොඳයි, මා ඒ ගැන බලන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒ ගැන බලන්න. මොකක් හරි හේතුවක් ඇති, එහෙම කියන්න.

## කැලණිතිස්ස ද්විත්ව බලාගාරය : ලාභය හෝ අලාභය
## களனிதிஸ்ஸ இரட்டை மின்வலு நிலையம் : இலாப நட்டம்
KELANITISSA DUAL POWER STATION : PROFIT/LOSS

1563/'11

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) වර්ෂ 2010 මැයි මස සිට මේ දක්වා කැලණිතිස්ස ද්විත්ව බලාගාරයේ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) අලාභ ලැබීමක් සිදුවූයේ නම්,
- (i) එයට හේතුව කවරේද;
- (ii) එම අලාභය දරනු ලබන අය කවුරුන්ද;
- (iii) ඒ සඳහා වගකිව යුත්තේ කවුරුන්ද;
- (iv) එම අලාභය ජනතාවට දැරීමට සිදු වූයේ නම්, ඒ සඳහා සහනයක් ජනතාවට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010 ஆம் ஆண்டு மே மாதம் முதல் இற்றை வரை களனிதிஸ்ஸ இரட்டை மின்வலு நிலையத்தின் இலாபம் அல்லது நட்டம் எவ்வளவென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) நட்டம் ஏற்பட்டிருப்பின்,
- (i) அதற்கான காரணம் யாதென்பதையும்;
- (ii) மேற்படி நட்டத்தை தாங்கிக்கொள்பவர்கள் யாரென்பதையும்;
- (iii) இதற்குப் பொறுப்புக்கூறவேண்டியவர்கள் யாரென்பதையும்,
- (iv) மேற்படி நட்டத்தை மக்கள் ஏற்றுக்கொள்ள நேரிட்டிருப்பின் அதற்கான நிவாரணம் மக்களுக்கு வழங்கப்படுமா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House of the profit earned or loss incurred by the Kelanitissa dual power station from May 2010 up to now?

(b) If a loss has been incurred, will he inform this House -
- (i) the reason for it;
- (ii) the persons who bear that loss;
- (iii) the persons responsible for that loss; and
- (iv) whether people will be provided with some kind of relief if they had to bear the loss?

(c) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு, எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය ඩීසල් හෝ නැප්තාවලින් ක්‍රියාත්මක වන මෙගා වොට් 110ක ගෑස් තලබමනයක් සහ එමඟින් උත්පාදනය වන අධික තාපය මඟින් ජලය වාෂ්ප බවට හරවා තවත් මෙගා වොට් 55ක තලබමනයක් ක්‍රියාත්මක කරමින් මෙගා වොට් 165ක මුළු ධාරිතාවක් පද්ධතියට ලබා දෙයි. මෙහි ගෑස් තලබමනය (මෙගා වොට් 110) 2002.01.19 සිට පද්ධතියට එකතු කර ඇති අතර, වාෂ්ප තලබමනය (මෙගා වොට් 55) 2003.03.27 දින සිට පද්ධතියට එකතු කර ඇත.

කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය බලාගාරය ඇතුළුව බලය බෙදා හැරිය හැකි ආකාරයේ බලාගාර 24ක් ලංකා විදුලිබල මණ්ඩලය සිය විදුලිබල පද්ධතිය පවත්වාගෙන යාමට ක්‍රියාත්මක කරන අතර, එක් එක් බලාගාරවල ලාභය හෝ අලාභය වෙන වෙනම ගණනය කිරීමක් සිදු නොවේ. සමස්ත විදුලිබල පද්ධතිය තුළ ක්‍රියාත්මක වන මෙම බලාගාර 24 කිසියම් අවස්ථාවක පද්ධති අවශ්‍යතා සපුරන ආකාරයට විදුලිබල ඉල්ලුම සැපයීමට ක්‍රියාත්මක කරන අතර, වෙන් වෙන් වූ ආදායම් හා පිරිවැය ගණනය කිරීමකින් සිදු වන, ලාභ අලාභ තත්ත්වයන් මත ක්‍රියාත්මක නොකරයි. තනි බලාගාරයක ලාභය හෝ පාඩුව ගණනය කිරීම සංකීර්ණ වන අතර එක් එක් බලාගාරය මඟින් විදුලිය නිපදවීම සඳහා වන පිරිවැය පමණක් සංසන්දනය කිරීම කළ හැකි වේ. මේ අනුව කැලණිතිස්ස ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරයේ විවෘත ගෑස් තලබමන (මෙගා වොට් 110) මඟින් 2010 අගෝස්තු 26 වන දින සිට 2010 දෙසැම්බර් දක්වා විදුලිබල ඒකක මෙගා වොට් 66,400ක් නිපදවීමට වැය වූ පිරිවැය සමඟ සලකන විට රුපියල් මිලියන 3750ක අතිරේක වැය බරක් ඉන්ධන වෙනුවෙන් දැරීමට සිදු වී තිබේ. 2011 වසරේ දී ද්විත්ව චක්‍රයේ වාෂ්ප කොටස ජනන පිරිවැය සඳහා යොදා ගත්තේ දෙසැම්බර් මසදී පමණි.

(ආ) (i) වාෂ්ප තලබමනයේ රොටරය සහ ඊට සම්බන්ධිත කොටස් කිහිපයක් අබලන් වීම නිසා 2010.08.26 දින වාෂ්ප තලබමනය අක්‍රිය තත්ත්වයට පත් විය.

ඒ හේතුව නිසා ඉන්ධන භාවිතයෙන් තොරව උත්පාදනය කළ හැකි මෙගාවොට් 55ක විදුලි ධාරිතාවක් පද්ධතියට අහිමි වීමෙන් මූල්‍ය අලාභයක් ලං.වි.ම.ට සිදු වී ඇත. එය රුපියල් මිලියන 374.5ක් ලෙස ගණන් බලා ඇත. මෙය අක්‍රිය වීමෙන් ඉන්ධන සඳහා පමණක් ඒකකයකට රු. 5.64ක් අතිරේක වශයෙන් වැය වී ඇත. (විවෘත පද්ධතියේදී ඒකකයක ඉන්ධන පිරිවැය රු. 16.36කි. ඒකාබද්ධ චක්‍රීය පද්ධතියේදී ඒකකයක ඉන්ධන පිරිවැය රු. 10.72කි.)

(ii) මේ පිළිබඳව පත් කළ මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්ලිව්. පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව විසින් කිසියම් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් වග කිව යුතු යැයි නිශ්චය කර නැත. එමෙන්ම කොටි ත්‍රස්තවාදීන් විසින් 2008.10.28 දින කැලණිතිස්ස බලාගාරයට එල්ල කළ ප්‍රහාරයේ වක්‍ර ප්‍රතිඵලයක් ලෙස හා වසර 2003 දී සිදු කළ කඩිනම් සමජනන - synchronizing - ක්‍රියාවලියේ අඩු පාඩු නිසා හෝ මෙම වාෂ්ප තලබමනයේ රෝටරය සහ අනුබද්ධ කොටස් අබලන් තත්ත්වයට පත් විය හැකි බව විදේශ නියෝජිතයන් සමඟ සාකච්ඡාවේදී පෙනී ගියේය.

(iii) ඉහත (ආ)(ii) හි පිළිතුරම අදාළ වේ.

(iv) විදුලි ඒකකයක් පාරිභෝගිකයාට විකිණීමේ ජනන ඒකකයක පිරිවැයට අඩු මිලක් පාරිභෝගිකයාගෙන් ගාස්තු වශයෙන් අය කරන බැවින්, එම පාඩුව ජනතාවට දැරීමට සිදු වී නැත. එය විදුලිබල මණ්ඩලය විසින් දරා ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන්නේ කැලණිතිස්ස ද්විත්ව චක්‍ර බලාගාරය මාස 7ක් තිස්සේ වහලා තිබීමෙන් වෙච්ච පාඩුව වන රුපියල් කෝටි 140 ලංකා විදුලිබල මණ්ඩලය මඟින් දරා ගන්නවා කියලා. හැබැයි මණ්ඩලයේ පාඩු ටික එන්නේ ජනතාව මතට නේ. ඒ කමිටු වාර්තාවේම තිබෙනවා, ඒකකයකට ශත 25 ගණනේ ජනතාවට දරන්න සිද්ධ වන තත්ත්වයක් ඇති වුණා කියලා. ඉතින් මම ඔබතුමාගෙන් අහන්නේ, මේ කාරණය ඔබතුමා පිළිගන්නවාද, නැද්ද කියලායි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමා කැලණිතිස්ස විදුලි බලාගාරය විදුලිය නිපදවන්න ඉන්ධන වැය කළත් ඒකකයක ඉන්ධන පිරිවැය රුපියල් 16.32ක් -ඒ අවස්ථාවේදී- යනවා. අපිට පුළුවන්නම් උත්පාදනය වන අධික තාපය ජල වාෂ්ප බවට හරවා පාවිච්චි කරන්න තව සියයට 50ක අතිරේක විදුලි බලයක් ගන්න පුළුවන්. ඒක නිසා තමයි මෙගාවොට් 55ක තව විදුලි ඒකකක ප්‍රමාණයක් එන්නේ.

යම් ප්‍රශ්නයක් මත ඒ වාෂ්ප එන්ජිම ඇද වුණා. එසේ ඇද වෙච්ච නිසා ඒක නවත්වන්න සිදු වුණා. ඒ වාෂ්ප එන්ජිමක් තිබුණා නම් විදුලි ඒකකයක් රුපියල් 10.72කට ගන්න තිබුණා. ඒ කියන්නේ වාෂ්ප එන්ජිම නැතිව ඉන්ධන එන්ජිම විතරක් දුවනකොට විදුලි ඒකකයක් සඳහා රුපියල් 5.64ක මුදලක් වැඩියෙන් වැය වෙනවා. ඒ අනුව තමයි අපි මිලියන 375ක ප්‍රශ්නයක් තිබෙනවාය කියා ගණන් හදා පෙන්නුවේ. හැබැයි අපි මේ කාල වකවානුව තුළ වෙනත් ක්‍රියා මාර්ග මඟින් රුපියල් 15,000ක පමණ මේ අවුරුද්දේ විදුලිබල මණ්ඩලයේ අතිරේක වියදම් ඉතිරි කර ගෙන තිබෙනවා. ඒ නිසා අපට මේක අවශෝෂණය කර ගන්න පුළුවන්. මොකද, 2003 දී තිබුණු විදුලිබල අර්බුදය නිසා අපි කඩිනමින් මේ බල පද්ධතියට commissioning අරගෙන තිබෙනවා. හත් වතාවක්ම විදේශ විශේෂඥයන් ගෙන්වා සම්පූර්ණයෙන්ම අපි මේක බැලුවා. ඒ නිසා ආපු උත්තරය තමයි මේ අවස්ථාවේදී තිබුණු බරපතළ අඩු පාඩුකම් නිසා එහෙම වුණාය කියන එක. පහු ගිය අවුරුද්දේ ඉඳලා දැන් මේක ක්‍රියාත්මකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විධියට ඔබතුමා විදුලි පරිභෝජනය අඩු කිරීම සම්බන්ධයෙන් වැදගත් වැඩ පිළිවෙළ ගණනාවක් ඉටු කර තිබෙනවා. මම හිතන්නේ අදත් ඔබතුමා කොටුවේ බැහැලා පත්‍රිකා බෙදා තිබෙනවා. ඇමතිතුමා හැටියට ඔබතුමා ඒ අන්දමට ජනතාව දැනුවත් කරන තැනට පත් වෙලා

තිබෙනවා. ඒ ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. හැබැයි ඔබතුමා එහෙම විදුලි පරිභෝජනය අඩු කරන්නය, ගමේ ළමයින්ට ලයිට් නිවන්නය, පොඩි දරුවන් ඇමතිවරු කරනවාය, විදුලිබල ඇමතිවරු වෙන්නටය කියන අතරේ, ලංකාවේ ලොකු ළමයින්ගේ කට්ටිය රජවරු වෙන්න රගර් ගහනවා, වොට් 1000 බල්බ් දමලා. මම අහන්නේ ඒවා නවත්වන්න ඔබතුමා පියවරක් ගන්නේ නැද්ද කියන එකයි. පොඩි දරුවන්ට ලයිට් නිවන්නය කියනවා. ලොකු කට්ටිය වොට් 1000 බල්බ් දමා ගෙන රගර් ගහනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු මන්ත්‍රීතුමා, ඉන්දියාවේ දිල්ලි නගරය, නොයිඩා නගරය, ඩකා නගරය, පාකිස්තානයේ රාවල්පිණ්ඩි නගරය, කරච්චි නගරය යන හැම නගරයකම මිනිස්සු පාරට බැහැලා ඉන්නවා, පැය 12ක්, 13ක් විදුලිය කපනවාය කියලා. මේ කලාපයේ විසිහතර පැයම විදුලිය දෙන්නේ අපි විතරයි. 1996 දී විදුලිය පාරිභෝගිකයන් 13,00,000ක් සිටියදී මාස 4ක් පැවවාම පැය 7ක් විදුලිය කපන්න සිද්ධ වුණා. අද අවුරුද්දක් තිස්සේ වතුර නැතුව තිබෙන තත්ත්වය තුළ වුණත් විසිහතර පැයම විදුලිය දෙනවා. මොකද, අපේ අතිගරු ජනාධිපතිතුමා 2005 දී තීන්දුවක් ගත්තා, කැළණිතිස්සේ ද්විත්ව චක්‍ර බලාගාරයක් ඇති කරන්න, පුත්තලමේ ගල් අඟුරු බලාගාරයක් ඇති කරන්න. නමුත් අපි පිළිගන්නවා, මේ ඉල්ලුම යම් කිසි ප්‍රමාණයකට පාලනය කරන්න ජනතාවගේ සහාය අවශ්‍යයි කියලා. මේ පාර්ලිමේන්තුවේත් සියලුම සේවකයන් අමතා ඒ සම්බන්ධයෙන් වැඩසටහනක් පවත්වා අපි මේ කටයුත්ත කර ගෙන යනවා. ඒකට ඔබතුමන්ලාගේත් සහයෝගය අපි බලාපොරොත්තු වනවා.

අපි බලාපොරොත්තු වුණා, මෙගාවොට් 2200ක, 2300ක අධික විදුලි ඉල්ලුමක් එයි කියලා. අපට කියන්න සන්තෝෂයි, අපට ඒක පාලනය කරන්න පුළුවන් වුණු එක ගැන. ඒ තුළින් රුපියල් මිලියන 13,000ක අතිරේක පිරිවැයක් දරන්න නියමිතව තිබුණු ඒ බලාගාර පද්ධතිය මිල දී ගැනීම වළක්වා ගන්න අපට පුළුවන් වුණා. ඕනෑ කෙනකුට මුදල් වියදම් කරලා rugby වාගේ ඕනෑ ක්‍රීඩාවක් කරන්න පුළුවන්. නමුත් පොදුවේ හැම කෙනාගෙන්ම අපි ඉල්ලා සිටිනවා, මේ කාලයේ හැකි තාක් විදුලිය පරිභෝජනය පාලනය කර ගන්න කියලා. මොකද, light කපන්න මේ ආණ්ඩුව ලැස්ති නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා. මා ඇහුවේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒවා ගැන ප්‍රවේශම් වන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ගමේ අහිංසක, දුප්පත් දරුවාට lights off කරන්න කියලා ඔහුව විදුලි ඇමති කරනවාය කියනවා. මෙහේ ප්‍රීති සින්ටායි, අර සින්ටායි, මේ සින්ටායි ගෙන්වලා වොට් 1,000 bulbs දමලා rugby ගහනවා. මා ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, කරුණාකරලා ඒකටත් වෙන ව්‍යාපෘතියක් හදලා, ඒක කරන කට්ටිය එක්කෝ රජවරු කරන්න, එහෙම නැත්නම් වෙන ඇමතිවරු බවට පත් කරන්න කියලා.

## බුත්තල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කඩ කාමර : අවිධිමත් ටෙන්ඩර්

## புத்தள பிரதேச சபைக் கட்டிட விற்பனைக் கூடங்கள் : முறையற்ற கேள்விப்பத்திரங்கள்

## STALLS IN BUTTALA PRADESHIYA SABHA BUILDING: IMPROPER TENDERS

2001/'11

5\. **ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) බුත්තල නගරයේ ඉදි කර ඇති නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි වෙළඳ කුටි 17න් ධීවර සංස්ථාවට වෙන් කළ අංක 11 දරන වෙළඳ කුටිය හැරුණු කොට, අංක 4 සිට 17 දක්වා වෙළඳ කුටි සියල්ලම ටෙන්ඩර් කැඳවා එක් වෙළඳ කුටියක් රුපියල් ලක්ෂ 20ක පමණ මුදලකට ලබා දුන් බවත්;

(ii) අංක 1, 2 සහ 3 යන වෙළඳ කුටි සභාවේ අනාගත අවශ්‍යතාවන් සඳහා යෙදවීම පිණිස ටෙන්ඩර් මඟින් ලබා නොදීමට මාසික සභා රැස්වීමේදී තීරණයකට එළැඹි බවත්;

(iii) පසුව එම වෙළඳ කුටි තුන වෙනුවෙන් තම හිතවතුන් ඉදිරිපත් කළ එක් වෙළඳසැලකට රුපියල් ලක්ෂ 10ක් වැනි අවම වටිනාකමින් යුත් ටෙන්ඩර්පත් පිළිගෙන ඇති බවත්;

(iv) විනිවිදබවින් තොරව සිදු කරන ලද ඉහත ටෙන්ඩර් කැඳවීම තුළින් එම ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී ඇති බවත්;

(v) එම අයථා ටෙන්ඩර් කැඳවීම තුළින් විශාල මූල්‍ය වංචාවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தள நகரில் நிர்மாணிக்கப்பட்டுள்ள புதிய பிரதேச சபைக் கட்டிடத்தில் அமைந்துள்ள 17 விற்பனைக்கூடங்களில் கடற்றொழில் கூட்டுத் தாபனத்தின் மீன் விற்பனைக் கூடத்திற்காக ஒதுக்கப்பட்ட 11 ஆம் இலக்க விற்பனைக் கூடத்தைத் தவிர, இலக்கம் 4 தொடக்கம் இலக்கம் 17 வரையுள்ள விற்பனைக் கூடங்கள் அனைத்தும் கேள்விப்பத்திரங்கள் கோரப்பட்டு விற்பனைக்கூடமொன்று ரூபா 20 இலட்சம் வீதம் வழங்கப்பட்டதென்பதையும்;

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

(ii ) 1,2,3 ஆம் இலக்க விற்பனைக்கூடங்கள் சபையின் எதிர்கால தேவைக்காகப் பயன்படுத்தும் பொருட்டு கேள்விப்பத்திரம்மூலம் வழங்காமலிருப்பதற்கு சபையின் மாதாந்த கூட்டத்தில் தீர்மானிக்கப்பட்டதென்பதையும்;

(iii ) பின்னர் மேற்படி மூன்று விற்பனைக் கூடங்களுக்காக தமது நண்பர்கள் சமர்ப்பித்த ஒரு விற்பனைக் கூடத்திற்கு ரூபா 10 இலட்சம் போன்றதொரு ஆகக்குறைந்த பெறுமதியைக் கொண்ட கேள்விப்பத்திரங்கள் ஏற்றுக்கொள்ளப் பட்டனவென்பதையும்;

(iv ) வெளிப்படைத்தன்மையின்றி மேற்கொள்ளப்பட்ட மேற்படி கேள்விப் பத்திரம் கோரலால் மேற்படி பிரதேச சபைக்கு கிடைக்க வேண்டிய பெருமளவு வருமானம் இழக்கப் பட்டுள்ளதென்பதையும்;

(v ) மேற்படி மோசடியான கேள்விப் பத்திரம் கோரலின் ஊடாக பெருமளவு நிதி மோசடி இடம் பெற்றுள்ளதென்பதையும் அவர் அறிவாரா?

(ஆ) மேற்படி கேள்விப் பத்திரம் கோரல் தொடர்பாக பக்கச்சார்பற்ற விசாரணை ஒன்றை நடத்துவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் குறிப் பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Local Government and Provincial Councils:

(a) Is he aware that-

(i) all the stalls from number 4 to 17, out of the 17 stalls built in the new Pradeshiya Sabha building in the Buttala town, except stall number 11 which has been reserved for the stall of the Fisheries Corporation, have been given for about Rupees 20 lakhs each offer calling for tenders;

(ii) a decision was arrived at, in the monthly meeting of the Sabha not to give stalls number 1,2 and 3 through tenders since such stalls will be required for future needs of the Sabha;

(iii) later tenders submitted by their friends with a low value, Rs. 10 lakhs each in relation to the above three stalls have been accepted;

(iv) the aforesaid Pradeshiya Sabha has lost a huge income owing to the above calling of tenders that was done without any transparency; and

(v) a massive financial fraud has taken place through this improper calling of tenders?

(b) Will he state whether he will make arrangements for an impartial inquiry to be initiated in relation to the above calling of tenders?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) බුත්තල නගරයේ ඉදි කර ඇති නව ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේ වෙළඳ කුටි 17ක් නොව 16ක් පමණක් ඇති අතර, එයින් ධීවර සංස්ථාවට වෙන් කළ අංක 11 දරන වෙළඳ කුටිය හැරුණු විට ඉතිරි කඩ කාමර 15 ටෙන්ඩර් කැඳවා ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර තිබූ වැඩිම වටිනාකම්වලට ලබා දී ඇත.

(ii) නැත.

2011.07.28 දින පැවැති මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ අංක 08.4 යෝජනා අංක 01 මඟින් බිම් මහලේ අංක 11 කඩ කාමරය ධීවර අමාත්‍යාංශය සඳහා වෙන් කර ඉතිරි සියල්ල ටෙන්ඩර් කිරීම සුදුසු බවට සහා සම්මතයක් ලබා ගෙන ඇත. එමෙන්ම අංක 1, 2, 3 කඩ කාමර සඳහා එක් කඩ කාමරයකට ටෙන්ඩර්පත් 03 බැගින් කඩ කාමර 03ක් සඳහා ටෙන්ඩර්පත් 09ක් නිකුත් කර ඇත.

(iii) අංක 1, 2, 3 කඩ කාමර සඳහා ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් ඉල්ලුම්පත් අතරින් වැඩිම වටිනාකම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර්පත් පිළිගෙන මෙම කඩ කාමර බදු දී ඇත.

(iv) නැත.

ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශයේ ඌව වෙල්ලස්ස සංවර්ධන වැඩසටහන යටතේ මෙම ගොඩනැඟිල්ල ඉදි කර ඇති බැවින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය ආර්ථික) විසින් මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති, අධ්‍යක්ෂ (සැලසුම්) මොණරාගල, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ඌව පළාත්), බුත්තල ප්‍රාදේශීය ලේකම් යන සාමාජිකයන්ගෙන් සමන්විත ටෙන්ඩර් මණ්ඩලය පත් කර ඇති අතර, එම ටෙන්ඩර් මණ්ඩලය මඟින් ටෙන්ඩර් කැඳවීම සිදු කර බදුකරුවන් තෝරා ගෙන ඇත. මෙම ටෙන්ඩර් කැඳවීමේදී ඉල්ලුම්පත් 90ක් නිකුත් කර තිබුණි.

තවද, මෙම කඩ කාමරවල අවම ලන්සුව තීරණය කිරීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද තක්සේරු වටිනාකම අනුව අවම ලන්සුව හා මාසික කුලිය තීරණය කොට, ටෙන්ඩර් දැන්වීම් භාෂා තුනෙන්ම සකස් කොට දිනමිණ, ඩේලි නිවුස්, තිනකරන් යන පුවත් පත්වල ප්‍රසිද්ධ කර විධිමත් ටෙන්ඩර් පටිපාටියක් යටතේ ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇත. මෙමඟින් රු. 20,311,450ක ආදායමක් ලැබී ඇත.

(v) මේ තුළින් කිසිදු මූල්‍ය වංචාවක් සිදු වී නොමැති අතර වැඩිදුර පරීක්ෂණ තවදුරටත් කෙරෙමින් පවතී.

(ආ) ඔව්.

(ඇ) පැන නොනඟී.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ඔබතුමාගේ පිළිතුරෙන් පැහැදිලි වෙනවා, දෙවතාවකට මේ කඩ ටෙන්ඩර් කරලා තිබෙනවා කියලා. මුල් වතාවේ ටෙන්ඩර් කරපු ටික වැඩි මිලකට ගියා. ඔබතුමාම කිව්වා පස්සේ ටෙන්ඩර්පත් තුන බැගින් නිකුත් කළා කියලා. ඒකෙන්ම පෙනෙනවා සැලසුම් සහගතව ඒ ටෙන්ඩර් දාලා තිබෙනවාය කියලා. පළමුවැනි වතාවේ ලක්ෂ විස්සෙන් එහා ගිය ඒවා දෙවැනි වතාවේ ගිහිල්ලා තිබෙන්නේ ලක්ෂ දහයටයි. ඔබතුමා කොහොමද කියන්නේ මෙතැන වංචාවක් සිදු නොවුණා කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු මන්ත්‍රීතුමනි, පුවත් පත්වල - [බාධා කිරීමක්] පළමුවැනි වතාවට ටෙන්ඩර් කළාම කඩවලට විශාල ඉල්ලුමක් තිබෙනවා. ඊට පස්සේ දෙවැනි වතාවට ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් වුණේ නැත්නම් මොකක්ද කරන්නේ?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු ඇමතිතුමනි, අපි අහන්නේ මේකයි. පළමුවැනි වතාවේ කඩ තුනක් ඇරෙන්න අනෙක් ටික ටෙන්ඩර් කළා. ඒවා ලක්ෂ විස්සෙන් එහා ගණනකට ගියා. දෙවැනි වතාවේ කඩ තුනක් සඳහා ටෙන්ඩර් කැඳවන විට බොහොම සීමා සහිතව තුන් දෙනෙකු තමයි ටෙන්ඩර් දාලා තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
සීමා සහිත ටෙන්ඩර් නොවෙයි නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ඒක පත්තරේ දාලා නැහැ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක පත්තරේ දාලා තිබෙනවා. ඉදිරිපත් වෙලා තිබෙන්නේ සීමා සහිත ප්‍රමාණයක්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
දෙවැනි වතාවේ මේක පත්තරේ දාලා නැහැ. පැහැදිලිවම පෙනෙනවා, මෙතැන වංචාවක් වෙලා තිබෙනවාය කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පොඩ්ඩක් ඉන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මේ සිදු වන වංචා වහන්න එපා කියලායි අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා කියන්නේ දෙවැනි වර පත්තරයේ දැම්මේ නැහැ කියලාද? ඒ පිළිබඳව මම දන්නේ නැහැ. මම ඒ ගැන සොයා බලා, එහෙම වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
පැහැදිලිව පෙනෙනවා ටෙන්ඩර් කරන්නේ නැතිව මේක දුන්නේ කියලා. පළමුවෙනි වතාවේ එක් කඩ කාමරයක් රුපියල් ලක්ෂ විස්සකට වැඩිය ගිහින් තිබෙනවා. දෙවෙනි වතාවේ ලක්ෂ දහයට දීලා තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මට එවලා තිබෙන උත්තරයේ තිබෙන්නේ අංක 1, 2 සහ 3 දරන කඩ කාමර සඳහා එක් කඩ කාමරයකට ටෙන්ඩර් පත් තුන බැගින් කඩ කාමර තුන සඳහා ටෙන්ඩර් පත් 9ක් දැනට නිකුත් කරලා තිබෙනවා කියලා. ඉන් පසුව අංක 1 දරන කඩ කාමරය සඳහා ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පත් අතුරින් වැඩිම වටිනාකම-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
තුන බැගින් කිව්වාම එතැනින්ම පැහැදිලි වෙනවා වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමා කියනවා පත්තරයේ දාලා නැහැ කියලා. පත්තරයේ දාන්නේ නැතිව ටෙන්ඩර් කරන්න විධියක් නැහැ නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ඒකයි ප්‍රශ්නය. ඒක නිසා තමයි මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ පිළිබඳව මට දැන් කියන්නට පුළුවන්කමක් නැහැ. මම පළාත් පාලන හා පළාත් සභා ඇමතිතුමාට කියන්නම් ඒ ගැන පරීක්ෂා කර බලා ඔබතුමාට දන්වන්න කියලා. දැන් ඔබතුමා කියන්නේ මේවා පත්තරයේ දැම්මේ නැහැ කියන එකයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මෙතැන වංචාවක් වෙලා තිබෙනවා කියලා මම කියන්නේ. වංචාව වහන්නේ නැතිව, වංචාවට පරීක්ෂණයක් කරලා-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, නැහැ. වංචාවක් වෙලා කියන්නේ ඔබතුමාගේ උපකල්පනය අනුව නේ. නමුත් මට නිලධාරීන් උත්තරය එවලා තිබෙන්නේ මේ සඳහා ටෙන්ඩර් කැඳවලා තිබෙනවා කියලායි. ඔබතුමා පිළිගන්නවාද ටෙන්ඩර් කැඳෙව්වා කියන එක?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
පළමුවෙනි ටිකට කැඳෙව්වා. දෙවෙනි ටිකට කැඳෙව්වේ නැහැ. සීමා සහිත-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම කැඳවලා නැත්නම්, ටෙන්ඩර් කැඳෙව්වා කියන ඒ නිලධාරින්ට විරුද්ධව යම් යම් පියවර ගන්න පුළුවන්. එහෙම නම් ඔබතුමා ඒ පිළිබඳව පැමිණිලි කරන්න. [බාධා කිරීම්]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, වංචාවක් වෙලා තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මට නිලධාරින් කියලා එවලා තිබෙනවා ටෙන්ඩර් කැඳෙව්වා කියලා. ඔබතුමා කියනවා ටෙන්ඩර් කැඳෙව්වේ නැහැ කියලා. ඉතින් අපි පරීක්ෂා කරලා බලමු ඔබතුමා හරිද, නිලධාරින් කියන දේ හරිද කියන කාරණය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ ගැන සොයා බලන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඔබතුමාගේ ප්‍රශ්නයේ අංක 1, 2 සහ 3හි කඩ කාමර ගැන විශේෂයෙන් කියලා නැහැ.

දැන් අපි තමයි උත්තරය දුන්නේ ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාවලිය ගැන.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -2089/'11- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය : පාසල් අයදුම්කරුවන්
### க.பொ.த. சாதாரண தரப் பரீட்சைகள்: பாடசாலை விண்ணப்பதாரர்கள்
### GCE (ORDINARY LEVEL) EXAMINATIONS : SCHOOL CANDIDATES

2103/'11

7. **ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් වූ පාසල් අයදුම්කරුවන්ගෙන්,

(i) එම විභාගයේ විෂයයන් 8ම සමත් සිසුන් සංඛ්‍යාව;

(ii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය අනුව එම විභාගය සමත් සිසුන් සංඛ්‍යාව;

(iii) ගණිතය, මව් භාෂාව, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයයන් අසමත් වූ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වාර්ෂිකව, දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) රජයේ පාසල්වල ගණිතය, මව් භාෂාව, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයයන් ඉගැන්වීම සඳහා සිටින ගුරුවරු සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිංහල මාධ්‍ය හැරුණු කොට ඉංග්‍රීසි මාධ්‍ය ද භාවිතා කරන ජාතික හා පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල එක් එක් විෂය ඉගැන්වීමට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2005 தொடக்கம் 2010 ஆம் ஆண்டு வரை க.பொ.த. சாதாரண தரப் பரீட்சைக்குத் தோற்றிய பாடசாலை விண்ணப்பதாரர்களில்

(i) அந்தப் பரீட்சையில் 8 பாடங்களிலும் சித்தியடைந்த மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) சிங்களம், தமிழ், ஆங்கில மொழி மூலங்களுக்கு ஏற்ப சித்தியடைந்த மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) கணிதம், தாய்மொழி, ஆங்கிலம் மற்றும் விஞ்ஞானம் ஆகிய பாடங்களில் சித்தியடையாத மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்

வருடாந்த ரீதியாக மாவட்ட அடிப்படையில் வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) அரச பாடசாலைகளில் கணிதம், தாய்மொழி, ஆங்கிலம் மற்றும் விஞ்ஞானம் ஆகிய பாடங்களை

கற்பிப்பதற்காக உள்ள ஆசிரியர்களின் எண்ணிக்கை மாவட்ட அடிப்படையில் வெவ்வேறாக எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(இ) (i) சிங்கள மொழியைத் தவிர ஆங்கில மொழி மூலத்தையும் பயன்படுத்தும் தேசிய மற்றும் மாகாண சபை பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் ஒவ்வொரு பாடத்தையும் கற்பிக்க இருக்கும் ஆசிரியர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state separately in relation to each district and each year -

(i) the number of students who have obtained passes for all eight subjects;

(ii) the number of students who have got through the exam on the basis of medium of instruction, namely Sinhala, Tamil and English; and

(iii) the number of students who have failed mathematics, first language, English and science;

(iv) out of the school candidates who sat for GCE (Ordinary Level) Examination from the year 2005 to 2010?

(b) Will he state separately at district level, the number of teachers available for teaching mathematics, first language, English and Science in Government schools?

(c) Will he state-

(i) the number of national schools and provincial council schools which are using English medium in addition to Sinhala medium; and

(ii) separately, the number of teachers available in the aforesaid schools to teach each of the subjects?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) විස්තර ඇමුණුම I මඟින් දක්වා ඇත.

(ii) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සඳහා සිංහල/ ඉංග්‍රීසි හා දෙමළ/ඉංග්‍රීසි වශයෙන්ද (ද්වි මාධ්‍ය අයදුම්කරුවන්) පෙනී සිටි බැවින්, මාධ්‍ය තුන අනුව පමණක් වෙන වෙනම ගණනය කර නොමැති බව විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 16/01/54/2012 සහ 2012.03.19 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. එය ඇමුණුම IIහි සඳහන්ව ඇත.

(iii) මව් භාෂාව (සිංහල භාෂාව හා සාහිත්‍ය) පිළිබඳ විස්තර ඇමුණුම III මඟින් දක්වා ඇත.

මව් භාෂාව (දෙමළ භාෂාව හා සාහිත්‍ය) පිළිබඳ විස්තර ඇමුණුම IV මඟින් දක්වා ඇත.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විස්තර ඇමුණුම V මඟින් දක්වා ඇත.

ගණිතය පිළිබඳ විස්තර ඇමුණුම VI මඟින් දක්වා ඇත.

විද්‍යාව පිළිබඳ විස්තර ඇමුණුම VII මඟින් දක්වා ඇත.

(ආ) විස්තර ඇමුණුම VIII මඟින් දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) (i) රජයේ පාසල්වල 6වන ශ්‍රේණියේ සිට ඉහළට ක්‍රියාත්මක වන ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහන යටතේ විද්‍යාව, ගණිතය, සමාජ විද්‍යාව යන විෂයයන් සහ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය යන විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වෙන අතර, සෙසු විෂයයන් එම පාසලේ ප්‍රධාන ඉගැන්වීම් මාධ්‍ය අනුව සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඉගැන්වීම සිදු කෙරේ.

ඒ අනුව තෝරා ගත් විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වෙන ද්වි භාෂා අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක වන ජාතික හා පළාත් සභා පාසල් සංඛ්‍යාව 858කි.

එය සකස් වී ඇත්තේ

* ජාතික පාසල් 262ක් හා
* පළාත් සභා පාසල් 596ක් ලෙසය.

(ii) ඉංග්‍රීසි මාධ්‍යයෙන් එක් එක් විෂයයන් ඉගැන්වීම සඳහා සිටින ගුරුවරුන් සංඛ්‍යාව පහත දැක්වේ.

| **විෂය** | **සිටින සංඛ්‍යාව** |
|---|---|
| විද්‍යාව | 1024 |
| ගණිතය | 679 |
| සමාජ විද්‍යා විෂයයන් | 276 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 114 |
| එකතුව | 2093 |

(ඈ) අදාළ නොවේ.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ඇමුණුම - I

*සභාමේසය මත තබන ලද ඇමුණුම්:
* சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :
*Annexes tabled:

## G.C.E. (O.L.) Examination

## Passed in eight Subjects & nine Subjects

| | District | Passed in 8 Subjects 2005 | | Passed in 8 Subjects 2006 | | Passed in 8 Subjects 2007 | | Passed in 9 Subjects 2008 | | Passed in 9 Subjects 2009 | | Passed in 9 Subjects 2010 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | No | % | No | % | No | % | No | % | No | % | No | % |
| 1 | Colombo | 13749 | 44.94 | 13,551 | 44.59 | 14,911 | 46.02 | 6,340 | 21.11 | 7,435 | 23.25 | 7,247 | 23.00 |
| 2 | Gampaha | 7,912 | 30.37 | 7,831 | 31.17 | 9,115 | 33.16 | 2,920 | 11.65 | 5,234 | 19.27 | 3,817 | 13.92 |
| 3 | Kalutara | 4,437 | 28.85 | 3,938 | 27.04 | 4,584 | 29.47 | 1,372 | 9.69 | 2,898 | 19.02 | 2,229 | 14.26 |
| 4 | Kandy | 6,399 | 27.68 | 5,718 | 26.26 | 6,686 | 28.35 | 2,323 | 11.03 | 3,499 | 15.43 | 2,880 | 12.65 |
| 5 | Matale | 1,395 | 17.62 | 1,312 | 17.47 | 1,599 | 21.05 | 458 | 6.65 | 908 | 11.93 | 659 | 8.68 |
| 6 | Nuwara Eliya | 1,355 | 12.35 | 1,341 | 12.84 | 1,540 | 13.23 | 533 | 5.24 | 870 | 7.47 | 797 | 7.00 |
| 7 | Galle | 4,685 | 26.71 | 4,872 | 28.52 | 5,432 | 30.34 | 1,666 | 10.25 | 2,662 | 16.13 | 2,061 | 11.90 |
| 8 | Matara | 3,431 | 24.00 | 3,338 | 24.30 | 3,770 | 27.22 | 1,136 | 8.83 | 2,051 | 15.30 | 1,549 | 11.41 |
| 9 | Hambantota | 1,894 | 17.69 | 1,964 | 18.67 | 2,371 | 22.83 | 518 | 5.35 | 1,383 | 13.42 | 931 | 8.98 |
| 10 | Jaffna | 2,314 | 20.50 | 2,004 | 20.04 | 2,509 | 23.99 | 717 | 7.96 | 1,187 | 10.76 | 1,009 | 10.10 |
| 11 | Kilinochchi | 109 | 5.14 | 131 | 6.76 | 177 | 7.88 | 22 | 1.23 | - | - | 43 | 1.51 |
| 12 | Mannar | 194 | 13.75 | 177 | 13.34 | 275 | 19.86 | 78 | 7.16 | 91 | 5.87 | 106 | 6.22 |
| 13 | Vavuniya | 524 | 23.62 | 501 | 21.79 | 650 | 26.57 | 185 | 7.97 | 302 | 10.21 | 233 | 7.31 |
| 14 | Mullaitivu | 116 | 6.70 | 93 | 6.19 | 171 | 8.91 | 22 | 1.30 | 1 | 0.08 | 31 | 1.50 |
| 15 | Batticaloa | 1,205 | 21.04 | 1,105 | 18.87 | 1,389 | 21.40 | 415 | 6.50 | 729 | 9.31 | 629 | 8.63 |
| 16 | Ampara | 1,727 | 19.72 | 1,654 | 18.82 | 2,288 | 24.49 | 707 | 7.68 | 1,173 | 10.93 | 1,047 | 10.38 |
| 17 | Trincomalee | 893 | 16.52 | 725 | 15.09 | 897 | 16.86 | 295 | 5.79 | 498 | 7.27 | 515 | 7.95 |
| 18 | Kurunegala | 6,572 | 24.69 | 6,010 | 23.79 | 7,321 | 28.95 | 2,043 | 9.00 | 3,903 | 15.59 | 3,051 | 12.25 |
| 19 | Chilaw | 2,055 | 21.07 | 2,018 | 21.03 | 2,418 | 23.93 | 761 | 7.91 | 1,371 | 13.22 | 998 | 9.61 |
| 20 | Anuradhapura | 2,496 | 17.04 | 2,070 | 15.46 | 2,674 | 18.52 | 752 | 5.96 | 1,656 | 11.34 | 1,130 | 7.90 |
| 21 | Polonnaruwa | 911 | 14.65 | 849 | 14.08 | 1,045 | 16.37 | 330 | 5.53 | 644 | 9.71 | 492 | 7.76 |
| 22 | Badulla | 2,533 | 17.89 | 2,489 | 17.46 | 2,978 | 19.66 | 904 | 6.85 | 1,607 | 11.09 | 1,287 | 8.89 |
| 23 | Monaragala | 1,000 | 11.71 | 869 | 10.31 | 1,057 | 12.26 | 223 | 3.16 | 609 | 7.23 | 427 | 4.87 |
| 24 | Ratnapura | 3,561 | 18.44 | 3,442 | 17.80 | 3,874 | 20.18 | 1,004 | 6.22 | 2,126 | 12.08 | 1,390 | 8.09 |
| 25 | Kegalle | 3,034 | 22.82 | 2,952 | 23.72 | 3,461 | 26.40 | 984 | 8.72 | 1,925 | 15.27 | 1,381 | 10.55 |
| | **Island** | **74,501** | **24.21** | **70,954** | **23.94** | **83,192** | **26.64** | **26,708** | **9.49** | **44,762** | **14.42** | **35,939** | **11.57** |

Research & Development Branch
Department of Examinations
* Form 2008 9 Subjects Were Made Compulsory

ඇමුණුම - II

ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE
පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்லை
Pelawatta, Battaramulla.

දුරකතන / தொலைபேசி / Telephone: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo

මගේ අංකය / எனது இல / MY No: 16/01/54/2012
ඔබේ අංකය / உமது இல / Your No: ..................
දිනය / திகதி / Date: 2012.03.19
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address: www.doenets.lk
E-mail : examd@sltnet.lk

සහකාර ලේකම් (පාලන)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

**පාර්ලිමේන්තු ප්‍රශ්න අංක 2013/11**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) අංක ED/1/24/1/1 හා 2012.03.09 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව සකස් කරන ලද පිළිතුරු අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

එහි අංක (ii) කොටසින් අසා ඇති පරිදි මාධ්‍ය අනුව පාසල් අයදුම්කරුවන් සමත් සංඛ්‍යාව ඉල්ලා ඇතත්, දැනට අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා පාසල් [illegible]මිකරුවන් සිංහල/ඉංග්‍රීසි හා දෙමළ/ඉංග්‍රීසි වශයෙන් ද (ද්විමාධ්‍ය අයදුම්කරුවන්) පෙනී සිටින බැවින් මාධ්‍ය තුන අනුව පමණක් වෙන වෙනම ගණනය කර නොමැති බව කාරුණික ව දන්වමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

පිටපත : ඩබ්ලිව්.කේ.එන්. විජේතුංග
අධ්‍යාපන අධ්‍යක්ෂ

ඇමුණුම - III

## G.C.E. (O.L.) Examinations - 2005 - 2010
## Number of School Candidates Failed in Sinhala Language & Litt.

| | District | 2005 | | 2006 | | 2007 | | 2008 | | 2009 | | 2010 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Failed | | Failed | | Failed | | Failed | | Failed | | Failed | |
| | | No | % | No | % | No | % | No | % | No | % | No | % |
| 1 | Colombo | 3,905 | 14.23 | 4,093 | 14.96 | 4,080 | 13.96 | 3,300 | 12.30 | 4,846 | 16.85 | 3,962 | 13.82 |
| 2 | Gampaha | 4,889 | 19.44 | 4,822 | 19.90 | 4,707 | 17.75 | 3,906 | 16.27 | 5,323 | 20.24 | 4,338 | 16.37 |
| 3 | Kalutara | 2,355 | 16.64 | 2,548 | 19.11 | 2,404 | 16.88 | 2,046 | 16.06 | 1 | 100.00 | 2,266 | 15.64 |
| 4 | Kandy | 2,930 | 15.50 | 3,256 | 18.42 | 3,231 | 17.17 | 2,689 | 16.44 | 2,183 | 19.50 | 2,818 | 15.23 |
| 5 | Matale | 1,555 | 22.78 | 1,450 | 22.55 | 1,521 | 23.40 | 1,159 | 20.06 | 1,612 | 25.08 | 1,288 | 19.70 |
| 6 | Nuwara Eliya | 1,180 | 18.77 | 1,489 | 25.24 | 1,353 | 21.69 | 1,331 | 25.94 | 1,327 | 22.93 | 1,137 | 19.34 |
| 7 | Galle | 3,014 | 17.29 | 3,418 | 20.10 | 3,471 | 19.41 | 3,384 | 21.15 | 3,913 | 23.68 | 3,404 | 19.61 |
| 8 | Matara | 2,593 | 18.32 | 2,664 | 19.63 | 2,431 | 17.81 | 2,486 | 19.84 | 2,948 | 22.42 | 2,197 | 16.32 |
| 9 | Hambantota | 2,204 | 20.58 | 2,432 | 23.09 | 2,354 | 22.47 | 2,499 | 26.04 | 2,494 | 24.04 | 2,220 | 21.15 |
| 10 | Jaffna | - | - | 1 | 100.00 | - | - | - | - | 3,750 | 20.87 | - | - |
| 11 | Kilinochchi | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 12 | Mannar | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 13 | Vavuniya | - | - | 58 | 30.69 | 26 | 12.32 | 41 | 20.60 | 58 | 23.20 | 35 | 13.78 |
| 14 | Mullaitivu | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 15 | Batticaloa | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 16 | Ampara | 877 | 20.55 | 809 | 18.67 | 1,127 | 23.74 | 1,075 | 23.99 | 1,270 | 25.64 | 969 | 19.56 |
| 17 | Trincomalee | 437 | 24.30 | 432 | 26.65 | 309 | 18.76 | 431 | 30.18 | 655 | 33.03 | 434 | 22.63 |
| 18 | Kurunegala | 3,746 | 14.85 | 3,819 | 16.04 | 2,997 | 12.65 | 3,069 | 14.59 | 4,226 | 18.04 | 3,016 | 12.86 |
| 19 | Puttalam | 1,289 | 16.80 | 1,296 | 17.29 | 1,207 | 15.39 | 1,221 | 16.16 | 1,492 | 18.67 | 1,416 | 17.40 |
| 20 | Anuradhapura | 2,585 | 18.55 | 3,015 | 23.69 | 2,902 | 21.15 | 2,518 | 21.35 | 3,543 | 25.86 | 2,540 | 18.70 |
| 21 | Polonnaruwa | 1,344 | 22.11 | 1,542 | 26.75 | 1,283 | 20.97 | 1,354 | 24.10 | 1,833 | 29.04 | 1,309 | 21.65 |
| | Electrician | 1 | Hettiarachchige Chandrasiri | 21,181.00 | 3,000.00 | 1,000.00 | | | | | 21,181.00 |
| | Secretary | 1 | A. V. Susanthi | 25,655.00 | 3,000.00 | 1,500.00 | | | | | 25,655.00 |
| | Administrative Assistant | 1 | G. Yasadewa Liyanaathukorala | 23,865.00 | 5,000.00 | 1,500.00 | 7,500.00 | | | | 23,865.00 |
| | Stores Assistant | 1 | K.C.Sudasinghe | 19,272.00 | 2,000.00 | 1,500.00 | | | | | 19,272.00 |
| | Curator | 1 | H M A B Herath | 30,000.00 | 16,250.00 | 3,000.00 | | | | | 30,000.00 |
| | Office Assitant cum Driver | 1 | Pradeep Pieris | 10,750.00 | | 1,000.00 | 7,500.00 | | | | 10,750.00 |
| | Labourer | 8 | Labourer 08 | 92,125.00 | 16,000.00 | | 30,000.00 | | | | 92,125.00 |
| | Head Groundsman | 1 | Head Groundsman 01 | 23,650.00 | 3,000.00 | 1,000.00 | 3,750.00 | | | | 23,650.00 |
| | Groundsman | 6 | Groundsman 06 | 102,990.00 | 12,000.00 | | 22,500.00 | | | | 102,990.00 |
| | Groundswoman | 3 | Groundswoman 03 | 53,295.00 | 6,000.00 | | 11,250.00 | | | | 53,295.00 |
| | Stadium Manager | 1 | S. M. Ranasinghe | 50,117.00 | | 5,000.00 | 15,000.00 | 20,000.00 | | | 50,117.00 |
| | Administrative Officer | 1 | M.G.M.D. Kumara Senaratne | 21,151.00 | | 1,500.00 | | | | | 21,151.00 |
| | Labour Supervisor | 1 | L.A.J. Roshan Wickremasinghe | 21,151.00 | | 1,500.00 | | | | | 21,151.00 |
| | Stores Assistant | 1 | A A L T Abeysinghe | 11,700.00 | | | 3,800.00 | | | | 11,700.00 |
| | Curator | 1 | S.G. Menaka Sampath | 33,810.00 | 15,000.00 | 3,000.00 | | | | | 33,810.00 |
| | Labourer | 27 | Labouere 27 | 317,790.00 | | | 102,600.00 | | | | 317,790.00 |
| | Stadium Manager | 1 | M. Panthaka Fernando | 30,000.00 | 15,000.00 | 2,500.00 | | | | 10,000.00 | 15,000.00 |
| | Labourer | 4 | Labouere 04 | 33,000.00 | | | 15,000.00 | | | | 33,000.00 |
| | Curator | 1 | Chatura Ekanayake | 30,000.00 | 16,250.00 | 3,000.00 | | | | | 30,000.00 |
| | Administrative Executive | 1 | H C B Wickremarachchi | 25,000.00 | 5,000.00 | 2,000.00 | | | | | 25,000.00 |
| | Curator | 1 | Asitha Sanjaya Wijayasinghe | 33,810.00 | 15,000.00 | 3,000.00 | | | | | 33,810.00 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Curator | 1 | D R S Dissanayake | 30,000.00 | 16,250.00 | 3,000.00 | | | | | 30,000.00 |
| | Administrative Assistant | 1 | Dhanuka Liyanagama | 17,738.00 | 5,000.00 | 2,000.00 | 7,500.00 | | | | 17,738.00 |
| | Curator | 1 | H.H.P. Kumara Subasinghe | 29,138.00 | 16,250.00 | 3,000.00 | | | | | 29,138.00 |
| | Physiotherapist | 1 | R A K Janaka | 75,000.00 | 25,000.00 | 3,000.00 | | | | | 75,000.00 |
| | Curator | 1 | U A S Sampath | 30,000.00 | 16,250.00 | 3,000.00 | | | | | 30,000.00 |
| | Groundsman | 1 | I G Alagasamy | 26,187.00 | | | 7,500.00 | | | | 26,187.00 |
| | Labouere | 2 | Labouere 02 | 23,650.00 | 4,000.00 | | 7,500.00 | | | | 23,650.00 |
| | Indoor Net Supervisor | 1 | J A D J P K Gunawardena | 15,000.00 | | 1,500.00 | | | | | 15,000.00 |
| | Watcher Cum Labourer | 1 | A L A U J Abeyratne | 10,000.00 | | | | | | | 10,000.00 |
| | | 251 | | | | | | | | | 11,893,938.30 |

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, මේ බඳවා ගත් අය සම්බන්ධව ප්‍රශ්න ගණනාවක් අපි මීට පෙර මතු කෙරුවා. විශේෂයෙන් ඔබතුමන්ලා සම්මුඛ පරීක්ෂණ තියලා නැහැ, සමහර බඳවා ගැනීම්වලට. ඔබතුමාගේ කාලයේ නොවෙයි, මේක සිද්ධ වුණේ. ඊට පෙර. ඒ වාගේම-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මගේ කාලයේ ක්‍රිකට් පාලක මණ්ඩලයට කිසිම සේවකයෙක් බඳවා ගෙන නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්. ඔබතුමාගේ කාලයේ තවම ඒක පටන් ගත්තේ නැහැ. ඒකයි මම කිව්වේ. ඔබතුමාත් වැඩේ පටන් ගන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මම පත් වෙලා දැනට අවුරුදු එකහමාරක් ගත වෙලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මේ ආයතනයේ අවුරුදු 55ට වැඩි සේවකයන් ඉන්නවා. ඒ අය පස් දෙනෙකුට වැඩිය ඉන්නවා. සාමාන්‍යයෙන් ක්‍රිකට් ආයතනයේ නීතිරීති එක්ක දැන් ඒ අයට කටයුතු කරන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. ඒ පිළිබඳව හොයා බලලා ඔබතුමා යම් කිසි ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියලා මා අහන්න කැමැතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

අපි මේ වෙන කොට කොන්ත්‍රාත් කාලය අවසන් වුණු සේවකයෝ 49 දෙනෙක් ඉවත් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, 2011 වසරේ World Cup තරගාවලිය වෙන කොට තිබුණු අපේ ගණන් හිලවු තමයි මම මුලින් කිව්වේ. මේ වෙන කොට අපි සේවකයින් හතළිස් ගණනක් ඉවත් කර තිබෙනවා. Contracts අවසන් වෙන, අනවශ්‍ය සේවකයන් සියලු දෙනා ඉවත් කරනවා. අපි මේ සේවකයන් සියයට 60ක් ඉවත් කරලා සියයට 40කට අඩු කරනවා ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, දැනට ඔබතුමන්ලා සමඟ contract එක තිබෙන කෙනෙක් ගනිමු. උදාහරණයක් වශයෙන් ෂේන් දුල්ලෑව මහත්මයා ගනිමු. එතුමා T20 ක්‍රිකට් තරගාවලියේ ආරක්ෂක ප්‍රධානියා විධියට තමයි වැඩ කටයුතු කෙරුවේ. ලබන නොවැම්බර් මාසයේ තමයි එතුමාගේ කොන්ත්‍රාත් කාලය අවසන් වන්නේ. දැන් ඔබතුමන්ලා එතුමා ඉවත් කර තිබෙනවා. එතුමාට තව කාලයක් තියෙද්දී එතුමා ඉවත් කරන්න කටයුතු කළේ ඇයි?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ඔබතුමා අහන කාරණය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. නමුත් මම උත්තරය දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මේ මහත්මයා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සේවකයෙක් නොවෙයි. ඒක තමයි පළමුවෙනි කාරණය. ඔහු T20 World Cup තරගාවලියට තාවකාලිකව -මාස හයක කාලයකට- ගත්ත සේවකයෙක්. ඔහු ආරක්ෂක නිලධාරි ප්‍රධානියෙක් හැටියට -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ලබන නොවැම්බර් මාසයේ තමයි ඔහුගේ සේවා කාලය අවසන් වන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ලබන නොවෙයි, මේ අවුරුද්දේ නොවැම්බර් මාසයේ. ඔහු බඳවා ගත්තේ මාස හයකට ගරු මන්ත්‍රීතුමනි. T20 World Cup තරගාවලියටයි ඔහු අරගෙන තිබෙන්නේ. ඒකට අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ සම්බන්ධයක් නැහැ.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ICC Office එකෙන් තමයි මේ වැඩ කටයුතු කළේ. සම්මුඛ පරීක්ෂණයෙන් අපි එයාව තෝරා ගෙන පත්වීම දෙන්න කියලා දන්වා යැව්වා. ICC එක අපෙන් අහලා එවලා තිබුණා ඔහුට වැඩිය හොඳ සුදුසුකම් තිබෙන අය සිටියදී ඇයි ඔහුව පත් කරන්නේ කියලා. ඒ කියන්නේ ඔහු පත් කරන්න එපා කියලා ICC එක කියලා තිබුණා. නමුත් අපි වාර්තා කීපයක් අරගෙන ඔහු ඒ තනතුරට පත් කරන්න කටයුතු කළා. ඒ තනතුරට පත් කළාට පස්සේ ඔහු අපේ T20 World Cup එකේ security system එක ගැන reports දෙකක් යැව්වා. ඔහු විසින් සකස් කරන ලද ඒ සියලුම වාර්තා අසාර්ථකයි කියලා ICC එකෙන් අපට දන්වා එවා තිබෙනවා. ඒ නිසා අපට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සමාවෙන්න ගරු කථානායකතුමනි. මට තත්පරයක් දෙන්න.

අපේ security arrangement එක හරියට හැදුවේ නැත්නම් T20 World Cup එක අපට අහිමි වෙයි. අපි ඔහුට විටින් විට උපදෙස් දුන්නා ඒ කටයුත්ත හරියට කරන්න කියලා. නමුත් ඒක හරියට වුණේ නැති නිසා අපට සිද්ධ වුණා ඔහු ඉවත් කරලා ඒ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුණ, ඊළඟට හිටි හොඳම නිලධාරියා මේ තනතුරට පත් කරන්න. හැබැයි ඔහුට මාසයක වැටුපක් ඉදිරියට ගෙවලා තමයි ඔහු අයින් කළේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නොවැම්බර් මාසය වෙන තුරු?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, නැහැ. මාසයක් ඉස්සරහට. ගරු මන්ත්‍රීතුමනි, මෙයාව ගත්තේ මාස හයකට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, ක්‍රිකට් ගැනම කථා කරන නිසා මම මේ ප්‍රශ්නයත් අහන්නම්. පසු ගිය දා සූරියවැව තිබුණු 20/20 ක්‍රිකට් තරගාවලියේ ටිකට් එකක් රුපියල් 100ක් වුණා. ඊළඟට පැවැත්වෙන පල්ලෙකැලේ ක්‍රිකට් තරගාවලිය නැරඹීමේ ප්‍රවේශ පත්‍රයක් රුපියල් 300ක් කරලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක මේ ප්‍රශ්නයට අදාළ වන්නේ කොහොමද ගරු මන්ත්‍රීතුමනි?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමාට කැමැති නම් උත්තර දෙන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම ඔබතුමාට හිතෙන හිතෙන දේවල් අහන්න බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කමක් නැහැ. අපි අහමු. කැමැති නම් උත්තර දෙයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, එතකොට මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට හොඳ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කමක් නැහැ. එතුමා උත්තර දෙනවා, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මට පෙනෙන්නේ සම්ප්‍රදාය තවම ඉගෙන ගන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, රුපියල් පනහේ ටිකට් එක පල්ලේකැලේට රුපියල් 300 දක්වා වැඩි කළේ ඇයි කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ එක එක් කෙනා- [බාධා කිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැඟිටින්නේ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අස්වර් මන්ත්‍රීතුමා, මොකක්ද, රීති ප්‍රශ්නය?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, according to the Standing Orders, a Member must not ask any questions outside the main Question that has been posed. I draw your attention to Standing Order No. 28 (2) which states, I quote:

"(2) A supplementary question must not introduce matter not included in the original question."

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. අපි ප්‍රශ්න අංක 11ට යනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

එතුමාට උගන්වන්න ඕනෑ, කොහොමද Supplementary Questions අහන්නේ කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, ඇමතිතුමා කැමැති නම් පිළිතුරු දෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කැමැත්තට අනුව කටයුතු කරන්න නම් කරුණාකරලා දෙදෙනාම සභාවෙන් පිටතට යන්න.

ප්‍රශ්න අංක 11-2090/'11 - (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 12-2105/'11-(1), ගරු රෝසි සේනානායක මහත්මිය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතිය : විදේශීය හා දේශීය ශ්‍රමිකයන්

## நுரைச்சோலை அனல் மின் நிலைய நிர்மாணக் கருத்திட்டம்: வெளிநாட்டு, உள்நாட்டுத் தொழிலாளர்கள்

## NORACHCHOLAI COAL POWER PLANT CONSTRUCTION PROJECT : FOREIGN AND LOCAL WORKERS

1552/'11

13\. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමේදී ශ්‍රම පිරිවැය කොපමණද යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ සේවයේ නියුතු වූ විදේශීය හා දේශීය ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට රැගෙන ආ රට හෝ සමාගම මඟින් එම ශ්‍රමිකයන්ට ලබා දුන් තනතුරු නාමයන් කවරේද;

(iii) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ යෙදුණු ශ්‍රමිකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවූ දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மின் வலு, எரிசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) நுரைச்சோலை அனல் மின் நிலைய கருத்திட்ட நிர்மாணப்பணிகள் முடிவுற்ற போது உள்ளவாறு ஊழியர் செலவை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) நுரைச்சோலை அனல் மின் நிலைய நிர்மாணக் கருத்திட்டத்தில் வேலைக்கு அமர்த்தப்பட்ட வெளிநாட்டு தொழிலாளர்கள் மற்றும் உள் நாட்டுத் தொழிலாளர்களின் எண்ணிக்கையை வெவ்வேறாகவும்;

(ii) வெளிநாட்டுப் பணியாளர்களுக்கு அவர்களை வரவழைத்த நாட்டினால் அல்லது கம்பனி யினால் வழங்கப்பட்ட பதவிப் பெயர்களையும்;

(iii) நுரைச்சோலை அனல் மின் நிலைய நிர் மாணக் கருத்திட்டப் பணியாட்கள் சார்பில் வழங்கிய ஊழியர் சேமலாப நிதி மற்றும் ஊழியர் நம்பிக்கைப் பொறுப்பு நிதி ஆகியவற்றின் பெறுமதிகளையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Power and Energy:

(a) Will he inform this House the labour cost as at the completion of the construction of Norachcholai coal power plant project?

(b) Will he state --

(i) the number of foreign workers and local workers employed in the Norachcholai coal power plant construction project separately;

(ii) the designations given to the foreign workers by the country or company by which they were brought to Sri Lanka; and

(iii) the values of the EPF and ETF paid on behalf of the workers of the Norachcholai coal power plant construction project?

(c) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු කථානායකතුමනි, නොරොච්චෝලේ නොහොත් පුත්තලම ලක්විජය බලාගාරය පියවර දෙකකින් සමන්විතයි. ඒ නිසා දෙවැනි පියවරේ කටයුතු තවම අවසන් වෙලා නැහැ. පළමු පියවර පමණයි අවසන් වෙලා තිබෙන්නේ. සමස්ත ව්‍යාපෘතිය තවමත් ක්‍රියාත්මකයි. ඒ නිසා එතුමාගේ ප්‍රශ්නයට පළමු පියවර සඳහා පමණක් පිළිතුරු ලබා දෙනවා.

(අ) පුත්තලම ලක්විජය නොහොත් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ඉදිකිරීම් කටයුතු EPC (ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ) කොන්ත්‍රාත්තුවක් මත සිමෙක් චීන සමාගම මඟින් සිදු කරන ලදී.

මෙම ඉදි කිරීම සඳහා ශ්‍රම බලකාය යොදවන ලද්දේ චීන කොන්ත්‍රාත්කරු විසිනි. ශ්‍රමිකයන් බහුතරයක් චීන ජාතිකයන් වූ අතර ඉතිරි පිරිස දේශීය ශ්‍රමිකයන් වූහ.

සේවකයන් සඳහා කොපමණ මුදලක් ගෙවන ලද්දේද යන්න පිළිබඳව අප අමාත්‍යාංශය විසින් සහ විදුලිබල මණ්ඩලය විසින් පවත්වාගෙන යන ව්‍යාපෘතියට ඒ පිළිබඳ දැනුමක් නැත. එබැවින් ව්‍යාපෘතිය අවසන් කිරීමේ ශ්‍රම පිරිවැය ගැන ව්‍යාපෘතිය නොදනී.

(ආ) (i) ව්‍යාපෘතිය තුළ සේවය කළ විදේශීය / දේශීය ශ්‍රමිකයන් සංඛ්‍යාව කලින් කලට වෙනස් විය. කෙසේ වෙතත්, ඉදි කිරීම් කටයුතුවල උපරිම අවස්ථාවේ සිටි ශ්‍රමිකයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| | | |
|---|---|---|
| චීන ජාතිකයින් | - | 1900 (75%) |
| දේශීය ශ්‍රමිකයින් | - | 600 (24%) |

(ii) වීසා අයදුම් කිරීමේදී සේවා යෝජකයා විසින් ශ්‍රමිකයින් වෙත ලබා දෙන ලද තනතුරු නාමයන් වූයේ ඉංජිනේරු, තාක්ෂණ ශිල්පී, කළමනාකරුය.

(iii) සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල පිළිබඳ කටයුතු කොන්ත්‍රාත්කරු වන ඉදි කිරීම් සමාගමේ වගකීමක් වන අතර අප අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලබන ව්‍යාපෘතිය සතුව මේ පිළිබඳ තොරතුරු නොමැත.

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර සම්බන්ධයෙන් ඔබතුමාගේ උත්තරය තුළින් අපට පේනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන මෙවැනි වැඩ පිළිවෙළක් තුළින් පිට රට -චීන- කොම්පැනියකට වැඩ කරන්න 1,900ක පිරිස ගෙනැල්ලා ලාංකික ශ්‍රමය පැත්තකට දමා තිබෙන බව. ඔබතුමා විශේෂයෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාව ගැන කථා කරන ඇමතිවරයකු වශයෙන් මෙවැනි චීන කුමන්ත්‍රණකරුවන්ට විරුද්ධව කටයුතු කර නැද්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මා පළමුවෙන්ම මෙය කියන්නට ඕනෑ. මෙතැන කිසිම කුමන්ත්‍රණකරුවෙක් නැහැ. චීන ජාතික ශ්‍රමිකයින් ඉන්නවා. ගරු කථානායකතුමනි, මේ පුත්තලම ගල් අඟුරු බලාගාරය සම්බන්ධයෙන් වෙච්ච ආරම්භක ගිවිසුම අත්සන් කළේ 2005 ජුනි 6වන දා. මා මේ ඇමති ධුරයට එන්නට අවුරුදු 6කට විතර කලින්.

ඒ අවස්ථාවේදී මේ ගිවිසුම අත්සන් කළේ, ඒ ගල් අඟුරු බලාගාරය රටට අත්‍යවශ්‍ය වුණු නිසායි; මෙහි ඉංජිනේරුමය කටයුතු, මෙය පවත්වාගෙන යාමේ කටයුතු යනාදී සියල්ලම නිම කර අපට භාර දෙන පදනමිනුයි. එහෙම නැතිව අප ඒකේ කොටස් අරගෙන අපේ අමාත්‍යාංශය මැදිහත් වෙලා, ලංවිම මැදිහත් වෙලා ඒකේ කොටස් කරන්න නොවෙයි. අප කරන්නේ අධීක්ෂණය පමණයි. ව්‍යාපෘතියේ ඒ අත්සන් කර තිබෙන ගිවිසුමට අනුකූලව මේ කටයුත්ත කෙරෙනවා ද නැද්ද කියන එක අධීක්ෂණය කිරීම පමණයි අප කරන්නේ. ඊට අමතරව තාක්ෂණික වශයෙන් ව්‍යාපෘතිය හරියට කෙරෙනවාද කියා උපදේශක සේවාවක් පවත්වාගෙන යනවා, පෝරි ආයතනය විසින්. මේකේ සම්පූර්ණයෙන්ම ඉංජිනේරුමය කටයුතු සහ අනෙක් කටයුතු කරන්නේ චීන සමාගම. දේශීය පිරිස් ඒ සඳහා බඳවා ගෙන තිබෙන්නේත් ඒ ඇත්තෝයි. ඒක ඒ ගිවිසුමේම අඩංගු කාරණා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතරු ප්‍රශ්නය වන්නේ මෙයයි. මා හිතන හැටියට මේ පළමුවන අදියර අවසන් වුණේ මාස හතකට, අටකට ඉස්සෙල්ලායි. මගේ මිත්‍ර ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කියනවා, ඒ පැත්තේ හැම දවසකම වාගේ මෙය කැඩී තිබෙනවාය කියා. කැඩුණාට පස්සේ එය හරියාකාරව ක්‍රියාත්මක කරන්න දවස් 45ක් විතර යනවාලු. ඒ වාගේම ඔබතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් තුළින් කියා තිබුණා, දවස් 40 කට එහි අලාභය කෝටි 4ක් 5ක් විතර වෙනවාය කියා. ගරු ඇමතිතුමා, කරුණාකර කියන්න මෙය හදන්නත් ඉස්සෙල්ලා මේ තරමටම කැඩෙනවා නම්, මේ තරම් සල්ලි කන්දරාවක් ගෙවලා රටට ලැබුණු දායාදය මොකක් ද කියා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

රටට ලැබුණු දායාදය මෙයයි. ගරු කථානායකතුමනි, පසු ගිය පෙබරවාරි 18වන දා ඇති වෙච්ච ඒ තත්ත්වයෙන් පස්සේ, අලුතෙන් ආරම්භ කළාට පස්සේ මේ ගල් අඟුරු බලාගාරය අද වෙන තුරු එක මිනිත්තුවක්වත් නතර නොවී ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ ගල් අඟුරු බලාගාරය නොඑන්න මේ වැසි

නැති තත්ත්වය තුළ, සියයට 20කට අඩු ප්‍රමාණයකට ජලය පත් වී තිබෙන මේ මොහොතේ කිසි සේත්ම අඛණ්ඩව විදුලිය සැපයුමක් ලබා දෙන්නට බැහැ.

අද මේ මුළු කලාපයේම පැය විසි හතර තුළම විදුලිය ලබා දෙන එකම රට බවට අපේ රට පත් වෙලා තිබෙන්නේ මේ පුත්තලම ගල් අඟුරු බලාගාරයෙන් ලැබෙන සියයට 20ක විදුලි බලය නිසායි. එසේ නොවන්නට අති විශාල විදුලි කප්පාදුවකට - අපි අර 1995 සිට 2009 පමණ දක්වා කාලය තුළ අත් විඳපු එම තත්ත්වයට - ආපසු යන්න තිබුණා. එහෙම වුණා නම් කවදාවත් ලංකාවේ සියයට 8ක ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්නට ලැබෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිණිස මා කියන්නට ඕනෑ, අද බංගලිදේශයේ අඛණ්ඩ විදුලි සැපයුමක් දෙන්න නම් සාමාන්‍ය විදුලි මිල වාගේ දෙගුණයක් ගෙවන්න කියලා -විදුලි ඒකකයකට ලංකාවේ මුදලින් රුපියල් 22ක් ගෙවන්න කියලා- ඉල්ලලා තිබෙනවා. ඉතින් ඒ වාගේ තත්ත්වයක් නැතිව ඒ අඛණ්ඩ විදුලි සැපයුම සහතික කරන්නට පුළුවන් වෙලා තිබෙන්නේ මේ බලාගාරය නිසායි. මෙය විශාල බලාගාරයක්; අලුත් අත් දැකීමක්. මේ බලාගාරය හදනවාට විරුද්ධ වුණු අය අද මේ ගැන කථා කරන්නේ නැහැ. නමුත් අපි ඒ අත් දැකීම අරගෙන, එහි තිබෙන අඩු පාඩු සකස් කර ගැනීමට කටයුතු කරලා තිබෙනවා. මේ සඳහා විශේෂඥ කොමිටියක් පත් කරලා, එහි වාර්තාව අපිට ලැබිලා තිබෙනවා. අනාගතයේ දී එවැනි තත්ත්වයන් ඇති නොවන්නට අපි කටයුතු කරගෙන යනවා. මේ සම්බන්ධයෙන් ඕනෑම පැහැදිලි කිරීමක් කරන්නට අපි සැදී පැහැදී සිටිනවා. පසු ගිය දා අපි පවත්වපු උපදේශක කාරක සභාවේ දී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගැන විමසුවා. අපි ඒ පිළිබඳව දැනුම් දුන්නා. මේ පිළිබඳව ඕනෑ තරම් කට කථා කියන්නට පුළුවන්.

අපේ පළමුවැනි ජල විදුලි බලාගාරය හදන්න අපි පටන් ගත්තේ 1921 දී. 1951 දී තමයි එය විවෘත කළේ. අවුරුදු 30ක් ගත වුණා, ඒ විදුලි බලාගාරය සාර්ථක කර ගන්නට. එය අපේ රටේ පළමුවැනි ජල විදුලි බලාගාරය. ඉතින් ඒ වාගේ මේ අලුත් අත් දැකීම සාර්ථක කර ගන්නට අපි පියවරෙන් පියවර කටයුතු කරගෙන ගිහින් දැන් මේ කාර්යය අපි ඉෂ්ට කර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ බලාගාරය ගල් අඟුරු තුළින් දුවන්න හදපු එකක් මිස ඩීසල් පාවිච්චි කරලා විදුලිය නිපදවන්න හදපු එකක් නොවෙයි. ඒක මතක තියා ගන්න. ඒ වාගේම අවුරුද්දෙන් මාස හතකට පුත්තලමට ගල් අඟුරු ගෙනෙන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා වියදම් අධික මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ත්‍රිකුණාමලයට ගිහිල්ලා එහෙන් තමයි නැවත පුත්තලමට ගල් අඟුරු ගෙනෙන්නේ. ඔබතුමා කරුණාකරලා කියන්න, - මේක පැය 24 තුළම වැඩ කරනවා කිව්වා නේ. - ගල් අඟුරුවලින් දුවනවා කියන මේ බලාගාරය ඩීසල්වලින් දුවන්නේ නැද්ද කියලා. ඒ අවට ප්‍රදේශයේ සිටින අයට විදුලිය ලැබෙන්නේ නැති බව දන්නේ නැද්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නොදැනුවත්කම ගැන මා හරියට අනුකම්පා කරනවා. ඔබතුමා යම් යම් විෂය ක්ෂේත්‍රයන් ගැන විශේෂඥයකු වන්නට ඇති. හැබැයි ඔබතුමාට මේ ක්ෂේත්‍රයේ තිබෙන නොදැනුවත්කම ගැන මා අනුකම්පා කරනවා. මොකද, ඕනෑම ගල් අඟුරු බලාගාරයක් ආරම්භ කරන්නේ ඩීසල්වලින්, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ start-up එක ගන්නේ ඩීසල්වලින්. ඉන්පසුව තමයි ගල් අඟුරුවලින් දුවන්නේ. ඉතින් මෙතුමාගේ මේ තාක්ෂණය පිළිබඳ දැනුමේ දුර්වලකම, නොදැනුවත්කම නිසා රටේ ජනතාව මුළා කරන්නට දෙන්න බැහැ. තමන් නොදන්නා කාරණයක් ගැන දන්නා විධියට කථා කරන්නට ඕනෑ නැහැ. මෙතුමාට වෙනත් කාරණා ගැන විශේෂඥභාවයක් ඇති. මේ ලෝකයේ තිබෙන සෑම ගල් අඟුරු බලාගාරයක්ම ඔහොමයි. ඒ වාගේම කියන්නට ඕනෑ, ත්‍රිකුණාමලයේ කිසිම තැනක ගල් අඟුරු ගොඩගහලා නැහැයි කියන එක. අපි පුත්තලමෙන් තමයි ගල් අඟුරු ගොඩදමන්නේ. [බාධා කිරීම්] ඔය පසුපස සිටින අය දෙන ලණු කන්නේ නැතිව ඉන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඇමතිතුමා, මෙය අලුත් දෙයක් නිසා සියලුම මන්ත්‍රීවරුන් එහි කැඳවා ගෙන ගොස් එය පෙන්වන්නට සූදානම් කරන්න. එතකොට හොඳයි. [බාධා කිරීම්]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මේ බලාගාරය බලන්නට එන්නය කියා අපි ඔබ සියලු දෙනාටම ආරාධනා කරනවා. මේ බලාගාරය විසි හතර පැයම විවෘත කරලා තිබෙනවා. ගල් අඟුරු පුත්තලමේ බාන්නේ. පුත්තලමේ ඉන්න අයවත් ඒවා නොදන්නවා නම් අපි ඒ ගැන කනගාටු වනවා. අපි ඒ පිළිබඳව සාර්ථකව කටයුතු කරලා තිබෙනවා. එදා අපට පළමුවැනි ගල් අඟුරු නැව බාන්න දවස් 23ක් ගියා. අද දවස් හතෙන් අපි ඒක කරනවා. අපේ අය ඒ ශක්තිය අරගෙන තිබෙනවා. අපි ඒ ගැන සතුටු වනවා. අපි යම් අලුත් තත්ත්වයකට ගමන් කරනවා. ලබන අවුරුද්ද වෙන කොට මේ ධාරිතාව දෙගුණයක් කරන්න අපි කටයුතු කරනවා. සභාව නොමඟ යවන්න එපා, නොදන්න කරුණු ගැන කථා කරලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මොකක්ද මට කියලා දුන්නේ?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
නොදන්නාකම පෙන්වා දුන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 -1870/'11-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රීලන්කන් ගුවන් සේවය : ප්‍රගතිය
## ஸ்ரீ லங்கன் விமான சேவை : முன்னேற்றம்
## SRILANKAN AIRLINES : PROGRESS

2091/'11

15. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රීලන්කන් ගුවන් සේවය සාර්ථක තත්ත්වයකින් ක්‍රියාත්මක වන්නේද;

(ii) වර්ෂ 2005-2010 අතර කාල සීමාව තුළ එම ගුවන් සේවය සාර්ථක ක්‍රියාකාරීත්වයක් පෙන්වා තිබේද;

(iii) ඉහත කාල සීමාවේදී ශ්‍රීලන්කන් ගුවන් සේවය ලබා ඇති ප්‍රගතිය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது ஸ்ரீ லங்கன் விமான சேவை வெற்றிகரமாக செயற்படுகின்றதா;

(ii) 2005 தொடக்கம் 2010 ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் இவ்விமான சேவை வெற்றி கரமான செயற்பாட்டைக் காட்டியுள்ளதா;

(iii) மேற்படி காலப்பகுதியில் ஸ்ரீ லங்கன் விமான சேவை பெற்றுக்கொண்டுள்ள முன்னேற்றம் வருடாந்த அடிப்படையில் வெவ்வேறாக யாது

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Civil Aviation:

(a) Will he state -

(i) whether the SriLankan Airlines is operating successfully at present;

(ii) whether the aforesaid Airline has operated successfully during the period from the year 2005 up to 2010; and

(iii) separately, the progress achieved by the SriLankan Airlines in each year during the aforesaid period of time?

(b) If not, why?

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඇමුණුම පරිදි

| ගිණුම් වර්ෂය | 2005 / 2006 | 2006 / 2007 | 2007 / 2008 | 2008 / 2009 | 2009 / 2010 | 2010 / 2011 |
|---|---|---|---|---|---|---|
| ගුවන් යානා සංඛ්‍යාව | 16 | 16 | 14 | 12 | 12 | 16 |
| මගී ආදායම (රුපියල් මිලියන) | 48,732 | 53,862 | 63,808 | 58,429 | 48,361 | 60,518 |
| මගී සංඛ්‍යාව | 3,005,474 | 3,175,583 | 3,196,106 | 2,734,735 | 2,557,895 | 2,866,751 |
| ප්‍රවාහිත ගුවන් භාණ්ඩ ටොන් ප්‍රමාණය | 82,142 | 88,833 | 93,161 | 73,106 | 72,058 | 86,053 |
| ගුවන් ගමන් වාර ගණන | 9,007 | 9,198 | 9,427 | 8,347 | 6,571 | 7,505 |

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා බොහොම සූක්ෂ්ම අන්දමින් ලාභය, අලාභය ගැන සඳහන් කළේ නැහැ. 2008 වසරේ රුපියල් මිලියන 4,800ක් එහෙම නැත්නම් රුපියල් බිලියන 4.8ක ලාභයක් ලබපු ශ්‍රීලංකන් ගුවන් සේවා ආයතනය 2010 වසරේ රුපියල් මිලියන 6,000ක - එහෙම නැත්නම් රුපියල් බිලියන 6ක- අලාභයක් ලැබුවා. 2011 වසරේ ඒ අලාභය රුපියල් මිලියන 19,000ක් -එහෙම නැත්නම් රුපියල් බිලියන 19ක් - වුණා. 2008 සිට 2011 දක්වා දිගින් දිගටම මේ ආයතනය අලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ශ්‍රීලංකන් ගුවන් සේවා ආයතනය මේ විධියට අලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වුණේ වර්තමාන රජයේ අකාර්යක්ෂම ක්‍රියා පටිපාටිය නිසාද කියා මම අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා වැරදි අර්ථ කථනයක් දෙන්නේ. ලෝක තරගකාරිත්වය මැද්දේ, අභියෝග මැද්දේ අපි ශ්‍රීලංකන් ගුවන් සේවය පවත්වාගෙන යනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, එතකොට මම කිව්වේ අසත්‍යයක්ද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඔබතුමා කියන එක මට විශ්වාස කරන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ලාභය, අලාභය ගැන කියන කතාව අසත්‍යක්ද?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ලාභය, අලාභය හරි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැති වෙන්නේ කොහොමද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තර දෙනකම් අහගෙන ඉන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳමයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකද කලබලේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කලබලයක් නැහැ. කිසිම කලබලයක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් පැහැදිලිව උත්තරය දෙන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මේ ගුවන් සේවය ලාභ ලබන අවස්ථාත් තිබෙනවා; පාඩු ලබන අවස්ථාත් තිබෙනවා. ඒකාකාරීව ලාභ ලබන තත්ත්වයෙන් හෝ පාඩු ලබන තත්ත්වයෙන් ගෙන යන්න බැහැ. නමුත් දැන් අපි සැලසුම් සකස් කරලා තිබෙනවා, ඉදිරි කාල සීමාව තුළ ලාභ ලබන තත්ත්වයට ගෙනෙන්න. 2005 වර්ෂයට වඩා 2011 වර්ෂයේ යම් කිසි ප්‍රගතියක් ලබා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම දිගින් දිගටම අලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය වී තිබෙන ශ්‍රීලංකන් ගුවන් සේවා ආයතනය 2008 වර්ෂයේ රුපියල් මිලියන 4,800ක් ලාභ ලබා තිබෙන අතර 2011 වර්ෂයේ රුපියල් මිලියන 19,000ක් අලාභ ලබා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ රජය තීන්දු කරලා තිබෙනවා, යූඑස් ඩොලර් මිලියන 500ක් -රුපියල් බිලියන 65ක්- වැය කරලා, මේ රටේ සම්පත් යොදවා, ඒ වාගේම විදේශීය ණය අරගෙන නැවතත් වරක් මෙය ප්‍රතිව්‍යුහගතකරණය කරලා ප්‍රතිසංස්කරණය කරන්න. දැන් මෂ්රෙක් බැංකුවෙන් රුපියල් මිලියන 21,000ක් -රුපියල් බිලියන 21ක්-

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, මෙම අතුරු ප්‍රශ්නය අදාළ නැහැ නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නය තමයි අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැහැ, නැහැ. ඒක ප්‍රශ්නය නොවෙයි නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මේ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නය තමයි අහන්නේ. මා අහන්න කැමැතියි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්නේ නැත්නම් ඊළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, මේ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා අහන්නේ වැදගත් කාරණාවක්, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයක් අහන හැටි දන්නවාද කියලා කරුණාකරලා ඉක්මනින්ම කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම හොඳට දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්ථාවර නියෝග අනුව මට පෙන්වන්න, මොන විධියටද ප්‍රශ්නය අහන්නේ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෂ්රෙක් බැංකුවෙන් ඩොලර් මිලියන 175ක් -රුපියල් බිලියන 21ක් එහෙම නැත්නම් රුපියල් මිලියන 21,000ක්- ගන්නට තීන්දු කරලා තිබෙන මොහොතේ, මෂ්රෙක් බැංකුවෙන් මේ මුදල ගන්නට අනුගමනය කරපු ක්‍රමෝපාය මොකක්ද කියලා මා අහන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තීන්දු කරලා තිබෙනවාද, නැද්ද කියලා අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනිවිදභාවයෙන් යුක්තවද ඒ කටයුතු ක්‍රියාත්මක කළේ?

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, මේ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ. එතුමාට අවශ්‍ය නම් වෙනම ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ අතුරු ප්‍රශ්නය අදාළ නැතිලු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඒ අතුරු ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම අදාළයි. මොකද, මගේ ප්‍රශ්නය කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ - ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරනවා, මගේ 15 වන ප්‍රශ්නයට. මේ ප්‍රශ්නයෙන් මා අහලා තිබෙන්නේ- ශ්‍රීලංකන් ගුවන් සේවය ලබා ඇති ප්‍රගතිය පිළිබඳව, ලාභය, අලාභය පිළිබඳව හා සාර්ථකත්වය පිළිබඳවයි.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, ඒවාට උත්තර දීලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතින් මේ අසාර්ථක ව්‍යාපාරයක් සාර්ථක කරන්නට කටයුතු කරන මොහොතේ, මෂ්රෙක් බැංකුවෙන් රුපියල් මිලියන 21,000ක් ණය ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුක්තව අනුගමනය කරපු ක්‍රමෝපාය මොකක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ගරු කථානායකතුමනි, එතුමා අසා ඇති ප්‍රශ්නවලට මා උත්තර දීලා තිබෙනවා. මේ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. අහන අතුරු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
ඒක අදාළ නැහැ. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. අදාළ නැති අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා කියනවා, අදාළ නැහැයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කථා පවත්වන්නේ නැතුව, පිළිතුරු දීපු ඒවායෙන් අහන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
මේ හම්බන්තොට නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පිළිතුරු දීපු ඒවායෙන් සහ මම ඉදිරිපත් කරපු දත්තවලින් තමයි අහන්නේ. ඇත්තටම ගරු කථානායකතුමනි, මේ අලාභ ලබන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනයට අද වන විට අහස් යාත්‍රා ක්‍රියාත්මක කරන්නට ප්‍රමාණවත් ගුවන් නියමුවන් සංඛ්‍යාවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නැද්ද කියා අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අලාභ ලබන තත්ත්වය තුළ ප්‍රමාණවත් ගුවන් නියමුවන් සංඛ්‍යාවක් බඳවා ගන්නේ නැති නිසා ඒ ගුවන් නියමුවන්ට - pilotsලාට- අවශ්‍ය වෙලාවට වැඩි වෙලාවක් සේවය කරන්නට සිදු වෙලා තිබෙනවා. මා අහන්න කැමැතියි, මේ අලාභ ලබන තත්ත්වය තුළ ප්‍රමාණවත් ගුවන් නියමුවන් සංඛ්‍යාවක් බඳවා ගන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදාද කියා. මොකද, මේක ජීවිතත් එක්ක කරන සෙල්ලමක්.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ඒක ඇත්ත. මේ ප්‍රශ්නය මට අදාළ නැති වුණත් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මෙතුමා වැරදි ප්‍රකාශයක් කළේ. [බාධා කිරීමක්] ගුවන් නියමුවන්ට යම්කිසි කාල සීමාවක් තිබෙනවා. ඒක දෙන්නට අපි බැඳිලා ඉන්නවා. ඊට අමතරව ඔබතුමා කියන ආකාරයට අපි මීට සති තුනකට ඉස්සෙල්ලා cadet pilots ලා දහහත් දෙනෙක් බඳවා ගත්තා. ඒක පත්තරෙත් දමා තිබුණා. එහෙම බඳවා ගෙන අපි කටයුතු කර ගෙන යනවා. අපට ගුවන් යානා 22ක් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ගුවන් යානා 22ට ගුවන් නියමුවන් ඇති.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒක සම්පූර්ණ අසත්‍යයක් නේ.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

නැත්නම් බඳවා ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඔබතුමා විෂය ගැන දැන ගෙන ප්‍රශ්නවලට උත්තර දෙන්න.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ඔබතුමා මෙයට අදාළ ප්‍රශ්න අහන්න. ඔබතුමාට කවුරු හෝ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනය සම්බන්ධව ලියලා දෙන ඒවා අහන්න එපා. අදාළ ප්‍රශ්න අහන්න. එතකොට අපට අදාළ උත්තර දෙන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 1 -0686/'10- (3), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති හතරක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඩෙංගු මර්දනය සඳහා වවුනියාව නගර සභාවට වෙන් කළ මුදල : ගිණුම් වාර්තා
## டெங்கு ஒழிப்புக்காக வவுனியா நகரசபைக்கு ஒதுக்கிய தொகை:கணக்கு அறிக்கைகள்
## MONEY ALLOCATED TO VAVUNIYA URBAN COUNCIL FOR DENGUE ERADICATION : ACCOUNTS REPORTS

1861/'11

4. **ගරු රවි කරුණානායක මහතා (ගරු සිවශක්ති ආනන්දන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க- மாண்புமிகு சிவசக்தி ஆனந்தன் சார்பாக )
(The Hon. Ravi Karunanayake on behalf of Hon. Sivasakthi Ananthan)

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් වවුනියාව නගර සභාවට 2009 වර්ෂයේදී වෙන්කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කිරීමට අදාළ ගිණුම් වාර්තා හා විස්තර මෙතෙක් නගර සභාවට ඉදිරිපත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම ගිණුම් වාර්තා හා විස්තර නගර සභාවට ඉදිරිපත් කරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) டெங்கு ஒழிப்பின் பொருட்டு வட மாகாண ஆளுநரினால் வவுனியா நகர சபைக்கு 2009 ஆம் ஆண்டில் ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென் பதையும்;

(ii) அப்பணத் தொகை செலவிடப்பட்டமை தொடர்பான கணக்கு அறிக்கைகள் மற்றும் விபரங்கள் இதுவரை நகரசபைக்கு சமர்ப்பிக்கப் படாமைக்கான காரணங்கள் யாவையென் பதையும்;

(iii) மேற்படி கணக்கு அறிக்கைகள் மற்றும் விபரங்களை நகரசபைக்கு சமர்ப்பிப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

ask the Minister of Local Government and Provincial Councils:

(a) Will he inform this House -

(i) the amount of money allocated by the Governor of the Northern Province to Vavuniya Urban Council in year 2009 for the eradication of dengue;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) the reasons for not submitting the accounts reports and details relevant to the spending of that amount of money to the Urban Council up to now; and

(iii) whether steps will be taken to have those accounts reports and details submitted to the Urban Council?

(b) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වෙන් කරන ලද මුදල් ප්‍රමාණය රු.6,100,000කි.

(ii) ගිණුම් වාර්තා සියල්ලම 2012.05.28 දින සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් අනුමත වී ඇත.

(iii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශෝක ප්‍රකාශ යෝජනා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතා.

## ශෝක ප්‍රකාශය : ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு இரத்ன தேசப்பிரிய சேனாநாயக்க
## VOTE OF CONDOLENCE : HON. RATNA DESHAPRIYA SENANAYAKE

[අ.භා. 2.03]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, හැත්තෑව දශකයේදී උතුරු මැද පළාතේ මින්නේරිය මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන් ජනතාව වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ අධිනීතිඥ රත්න දේශප්‍රිය සේනානායක නම් වූ ප්‍රවීණ ජනමාධ්‍යවේදියා 2012 ජනවාරි මස 21වන දින අභාවප්‍රාප්ත වූ බැවින් ඒ පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී මම ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

මිනුවන්ගොඩ, පත්තඩුවන ගම්මුලාදෑනි පදවිය ඉසිලූ දොන් ඩේවිඩ් සේනානායක මහතාගේත්, එම මහත්මියගේත් ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය ලෙසින් 1922 සැප්තැම්බර් මස 18 වැනි දින රත්න දේශප්‍රිය සේනානායක මහතා මෙලොව එළිය දුටුවේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් තනතුර දරමින් දේශපාලන ක්ෂේත්‍රයට ඉමහත් සේවාවක් සිදු කළ, ජනමාධ්‍ය අමාත්‍යවරයකු වශයෙන් ශ්‍රී ලංකාවටත්, සංචාරක ව්‍යාපාරයටත් අමිල සේවාවක් ඉටු කළ කෘතහස්ත දේශපාලනඥයකු වූ දිවංගත ධර්මසිරි සේනානායක මහතා එතුමාගේ බාල සහෝදරයා විය. ග්ලෝරියා සේනානායක මහත්මිය සමඟින් සාර්ථක විවාහ ජීවිතයක් ගත කළ රත්න දේශප්‍රිය සේනානායක මහතා දිල්රුක්ෂි, සමුද්‍රිකා සහ තුෂාරා නමින් දියණියන් තිදෙනෙකු මෙලොවට දායාද කළේය.

කැලණිය ධර්මාලෝක විද්‍යාලය තුළදී අධ්‍යාපනය අතපොත් තැබූ එතුමාට එවකට එහි විදුහල්පති ධුරය දැරූ ඩී.බී. ධනපාල නම් ප්‍රවීණ පුවත් පත් කලාවේදියාගේ ඇසුර ජීවිතයේ අනාගත සුබ සිද්ධිය, අභිවෘද්ධිය වෙනුවෙන් විශාල ශක්තියක් ලබා දුන්නේය. කොටහේන ශාන්ත බෙනඩික්ට් විද්‍යාලය තුළින් වැඩිදුර අධ්‍යාපනය ලබා ගත් සේනානායක මහතා තරුණ වියේදීම දේශපාලන ක්ෂේත්‍රයට පිවිසියේය. ඒ අනුව 1947 වසරේ පළමුවැනි පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමට පැවැති මහ මැතිවරණයේදී කොමියුනිස්ට් පක්ෂය යටතේ ගම්පහ අසුනට තරග වැදුණද එතුමාට එයින් ජයග්‍රහණය හිමි කර ගත නොහැකි විය. ඉන් පසු "ලංකාදීප" පුවත් පත තුළින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ටව වාර්තාකරුවකු, උප කර්තෘවරයකු සහ ප්‍රවෘත්ති කර්තෘවරයකු වශයෙන් විවිධ තනතුරු දරමින් එම පුවත් පත ජනතාවගේ පත්තරයක් බවට පත් කිරීමේ මෙහෙවරෙහි ලා එතුමා පුරෝගාමියෙකු විය. "ලංකාදීප" කර්තෘ මණ්ඩල සාමාජිකයකු වශයෙන් කටයුතු කරද්දී එම පුවත් පතට එතුමා ලියූ "වනාහී" තීරු ලිපිය පාඨකයින් අතර බෙහෙවින් ජනප්‍රිය විය.

චන්ද්‍රරත්න මානවසිංහ, පෙරමුණේ තිලක, කරුණාසේන ජයලත් හා මහානාම දිසානායක වැනි ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදින් සමඟ එම ආයතනයේ කටයුතු කළ සේනානායක මහතා ශ්‍රී ලංකා පුවත් පත් ඉතිහාසයේ ආරම්භක මාධ්‍යවේදියෙකු විය. එපමණක් නොව ශ්‍රී ලංකා මාධ්‍යවේදී සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙසද රත්න දේශප්‍රිය සේනානායක නම් වූ පුවත් පත් කලාවේදියා සුවිශේෂී මෙහෙයක් ඉටු කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන්ද කටයුතු කළ රත්න දේශප්‍රිය මහතා 1960 ජූලි මහ මැතිවරණයේදී එවකට අගමැති ධුරය හෙබවූ ඩඩ්ලි ෂෙල්ටන් සේනානායක මැතිතුමාට එරෙහිව දැදිගම අසුනට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරග කළත් ඉන් ජය ගත නොහැකි විය. ඩඩ්ලි සේනානායක මහතා ඉන් ජයග්‍රහණය අත් පත් කර ගත්තත් ඔහුට ලැබුණු වැඩි ඡන්ද ප්‍රමාණය 1,600ක් වැනි සුළු ප්‍රමාණයකට සීමා කිරීමට රත්න දේශප්‍රිය තුළ පැවති දක්ෂතාව බෙහෙවින් බලපෑවේය. එම මැතිවරණයෙන් බලයට පත් සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිතුමියගේ පාලනය යටතේ 1960 සිට 1965 දක්වා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපති වශයෙන් කටයුතු කළ සේනානායක මහතා එම කාලය තුළ ග්‍රාමීය තරුණ තරුණියන් විශාල ප්‍රමාණයකට එතුළින් රැකියා සම්පාදනය කර දෙමින් ඉමහත් සේවාවක් ඉටු කළේය. විවෘත ආර්ථික ක්‍රමයක් දියත් නොවූ එකල සතොස තුළින් ජනතාවගේ පාරිභෝගික අවශ්‍යතා සපුරා දීමට එතුමා දැක්වූ කැපවීම ප්‍රශංසනීයය.

යළි 1965 වසරේ පැවැති මැතිවරණයේදීත් දැඩිගම අසුනට තරග වැදුණද ජයග්‍රහණය අත් පත් කර ගත නොහැකි වූ සේනානායක මහතා, විදෙස්ගතව චීනයේ පීකිංහි කාලය ගත කළේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මුළුමහත් ප්‍රගතිශීලී ව්‍යාපාරයේම දැවැන්ත ප්‍රතිරූපයක් ගොඩ නඟා ගෙන සිටි එතුමා 1970 පාර්ලිමේන්තු මැතිවරණයේදී මින්නේරිය මැතිවරණ කොට්ඨාසයට එම පක්ෂය යටතේ තරග වැද විශිෂ්ට ජයග්‍රහණයක් අත් පත් කර ගනිමින් මෙම උත්තරීතර සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් අසුන් ගත්තේය. බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ රජයේ සභානායක ධුරය හෙබවූ දේශපාලනයේ පතාක යෝධයෙකු වූ සී. පී. ද සිල්වා වැනි ප්‍රබලයෙකු පරාජයට පත් කරමින් එතුමා එම ජයග්‍රහණය අත් පත් කර ගත්තේය.

රටේ අනාගතය භාර ගත් සමඟි පෙරමුණ රජයේ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් වූ සේනානායක මහතා එතැන් පටන් පොළොන්නරුව දිස්ත්‍රික්කයටම ආදර්ශවත් මෙන්ම කෘතහස්ත භාවයෙන් පිරිපුන් නායකයකු වශයෙන් විශාල ශක්තියක් ලබා දුන්නේය. පක්ෂ භේද හෝ පාට ගැන සැලකීමකින් තොරව රජ රට ප්‍රදේශවාසීන්ගේ සුබසිද්ධිය උදෙසා මහඟු මෙහෙවරක යෙදුණු එතුමාණන් එකී ප්‍රදේශයේ දුක් විඳින සුවහසක් ජනතාවට ඉටු දෙවියෙකු විය.

කෘෂි කර්මාන්තයෙන් යැපුණු ඔවුන්ගේ දහසකුත් එකක් අඩු පාඩු පිළිබඳව සොයා බලමින් ඔවුන් අතර කාලය ගෙවූ සැබෑ පොදු ජන හිතකාමියකු වූ එතුමා, ප්‍රදේශයේ ගමනාගමන, සෞඛ්‍ය, මහා මාර්ග හා අධ්‍යාපනය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි අභිවෘද්ධිය වෙනුවෙන්ද කැප වූ දේශපාලනඥයෙක් විය. වරින් වර විවිධ අමාත්‍ය තනතුරුවල කටයුතු ආවරණය කරමින් ඒ සෑම තනතුරකින්ම ජනතා සුබ සෙත සලසා දුන් සේනානායක මහතා, වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම උතුම් මිනිසෙකු ලෙස හැඳින්විය හැකිය.

සමඟි පෙරමුණු රජය සමයේ චීන රජයේ පරිත්‍යාගයන් වශයෙන් මෙරටට ලැබුණු බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව හා තුල්හිරිය පෙහෙකම්හල වැනි ආයතනවල පසුබිමේද සේනානායක මහතාගේ නාමය නොමැකෙන අයුරින් සනිටුහන් වී ඇත. යළි 1977 පැවැති මහා මැතිවරණයෙන් ජයග්‍රහණය ලැබීමට නොහැකි වුවත්, කැපවීම හා දක්ෂතාව මැනවින් තේරුම් ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් අසූව දශකයේදී පක්ෂයේ උප සභාපති ධුරයකින් චතුර කථිකත්වයකින් හෙබි එතුමාව පුදන ලදී.

කලක් ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත්ව සිටි සේනානායක මහතා වෙත හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් ඉන්දුනීසියාවේ හා පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති ධුරය පිරිනමන ලදී. 1995 වසරේ සිට 1998 දක්වාම එකී රාජ්‍ය තාන්ත්‍රික තනතුර හෙබවූ එතුමාණන්, විහිළු තහළුවෙන් මෙන්ම හර බර කථාවලින් සහෘදයන් ඇද බැඳ ගැන්මෙහිලා සමත්කම් දැක් වූ මිනිසත්කමින් පිරිපුන් උදාර පුද්ගලයෙක් විය. සම කාලීනයන් මිය යෑමෙන් පසු ඊළඟ පරම්පරාව සමඟ ඉතා සුහදව ඇසුරු කළ සේනානායක මහතා, සිය විවේක කාලය අතරතුරදී අනාගත පරපුර වෙනුවෙන් සාරගර්භ ලිපි ලේඛන රැසක් සම්පාදනය කළේය. ටිබෙට් දේශයේ සංචාරය කර "Inside Story of Tibet" නමැති මාහැඟි කෘතිය රචනා කර පාඨකයා අතට පත් කිරීම එතුමාගේ උසස් ලේඛන කලාව සමස්ත ලෝකයටම මැනවින් පෙන්නුම් කළ කැඩපතක් සේ දැක්විය හැකිය.

දශක ගණනාවක් තිස්සේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය ඔස්සේත්, දේශපාලන ක්ෂේත්‍රය ඔස්සේත් සුවිශේෂී මහජන සේවාවක නියැලුණු මානව හිතවාදී දේශපාලනඥයකු වූ රත්න දේශප්‍රිය සේනානායක නම් වූ යුග පුරුෂයාණන් බුදු වදනට අනුව මරණය ඉක්මවිය හැක්කෙක් ලොව නැති බව පසක් කරමින් පවුලේ සියල්ලන්ගේත්, ප්‍රගතිශීලී මහ ජනතාවගේත් සිත් තුළට වේදනාවක් ගෙන දෙමින් අවුරුදු 90කට ආසන්න කාලයක් ආයු වින්දනය කොට 2012 ජනවාරි මස 21 වැනි දින සදහටම දෙනෙත් පියා ගත්තේය.

ගරු කථානායකතුමනි, වැව් බැඳි රාජ්‍යයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් මින්නේරිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වශයෙන්ද, නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්ද, තානාපති ධුරයන් හොබවමින් රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන්ද, කටයුතු කරමින් තැලෙන, පෑගෙන, අසරණ ජනතාව සමඟ ජීවත් වූ අධිනීතිඥ රත්න දේශප්‍රිය සේනානයක නම් වූ ප්‍රවීණ පුවත් පත් කලාවේදියාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාවට සහ දියණියන් තිදෙනාටත්, පවුලේ ඥාතීන්ටත් දන්වා යැවිය යුතු යයි මම යෝජනා කරමි. ස්තුතියි.

[අ.භා. 2.12]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු කථානායකතුමනි, මින්නේරිය හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, හිටපු නියෝජ්‍ය අමාත්‍ය රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නටයි මා නැඟී සිටියේ. එතුමාගේ ජීවිත කාලය තුළ එතුමාගෙන් මේ රටට ලැබුණු සේවය පිළිබඳව ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා දීර්ඝ විස්තරයක් කළා. අපි සාරාංශයක් හැටියට ගත්තොත් මේ උදාර පුද්ගලයා දේශපාලනඥයෙක් හැටියට, මන්ත්‍රීවරයකු හැටියට, නියෝජ්‍ය ඇමතිවරයකු හැටියට මේ රටේ දියුණුවට කටයුතු කරපු පුද්ගලයෙක්. අධිනීතිඥවරයකු හැටියටත් එතුමා ප්‍රසිද්ධියක් දැරුවා.

එතුමා පිළිබඳව වැඩියෙන්ම දැනුවත් වුණේ පුවත් පත් කර්තෘවරයකු හැටියටයි. ඒ කාලයේ "ලංකාදීප" පත්‍රයේ දක්ෂ - විශිෂ්ට- කර්තෘවරයකු හැටියට තමයි එතුමා හැඳින්වුවේ. ඒ වාගේම ජනමාධ්‍යවේදියකු හැටියට එතුමා ඒ සංගමයේ සභාපතිවරයා හැටියටත් කටයුතු කළා. විශේෂයෙන්ම එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වර්ධනය කරවන්නට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බලයට ගෙන එන්නට විශාල පරිශ්‍රමයක් දරපු පුද්ගලයෙක්. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපතිවරයකු හැටියටත් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම එතුමා පරිපාලනය පිළිබඳව දක්ෂයෙක්. එතුමා සතොස සභාපතිවරයා හැටියටත් කටයුතු කළ බවට අපට දැන ගන්නට ලැබුණා.

එතුමාගේ සේවා වාර්තාව දිහා බලපුවාම බොහොම පැහැදිලිව පෙනෙනවා, මේ රටේ අහිංසක ජනතාවට එතුමාගේ සේවාවන් කැප කළ බව. මින්නේරිය වැනි පිටිසර ප්‍රදේශයකට කෘෂිකර්මය දියුණු කරන්න එතුමාගෙන් ලැබුණු යෝජනා එමටය කියන එක ඉතිහාසයේ සඳහන් වනවා. ඉන් අනතුරුව එතුමා තානාපතිවරයෙක් හැටියට රටවල් දෙක, තුනකම සේවය කරලා ශ්‍රී ලංකාවට ඒ ධුරය තුළින් ලබා ගන්න පුළුවන් ප්‍රතිලාභ ලබා දීමටත් කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම එතුමා චීන රජයත් සමඟ ඇති කර ගත් ඒ සම්බන්ධකම තුළින් මේ රටට ලැබුණු ප්‍රතිලාභ එමටයි. ඒ කාරණා සභානායකතුමා බොහොම පැහැදිලිව සඳහන් කළා. මම ඒවා නැවත වරක් කියවන්න යන්නේ නැහැ.

[ගරු ජෝන් අමරතුංග මහතා]

ගරු කථානායකතුමනි, ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතා විශේෂයෙන්ම අපි දන්නා තරමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල සේවයක් කරපු මන්ත්‍රීවරයෙක්. එතුමා උපත ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ. මට මතකයි පසුව ඩඩ්ලි සේනානායක මැතිතුමා සමඟ මැතිවරණයට ඉදිරිපත් වුණු බව. ඩඩ්ලි සේනානායක මැතිතුමා ඇදිගම ආසනයෙන් මැතිවරණයට ඉදිරිපත් වුණු අවස්ථාවේ ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතාට ජය ගන්නට බැරිව ගියා. නමුත් එතුමාගේ සේවය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දිගින් දිගටම ලබා දුන්නා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියටත්, ඉන් අනතුරුව චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියටත් එතුමාගේ ඒ සේවය දිගටම ලබා දුන්නා. ඒ නිසා එතුමා මොන පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කළත් රටේ දියුණුවට කටයුතු කළා. අහිංසක තරුණ තරුණියන්ට රැකියාවන් ලබා ගන්න, ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවලට දෙන්න පුළුවන් උපරිම සහයෝගය එතුමා දැරූ තනතුරුවලින් ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ නිසා එතුමාගේ අභාවය ගැන පක්ෂ භේදයෙන් තොරව අපි කනගාටුවට පත් වනවා. එතුමා බෞද්ධයෙක් හැටියට ආගමික කටයුතු සම්බන්ධයෙන් ඒ පිළිවෙත හරියට පිළිපැද්දා. එම නිසා මේ අවස්ථාවේදී විපක්ෂය වෙනුවෙන්, අද මේ ගරු සභාවේ සිටින එතුමාගේ දූ දරුවන් ඇතුළු ඥාතීන් සියලු දෙනාටම අපේ කනගාටුව පිළිගන්වමින්, එතුමාට නිවන් සැප අත් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා.

[2.18 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர் )
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Mr. Speaker, I rise with great respect to pay tribute to a senior politician and one-time Deputy Minister, the late Hon. Ratna Deshapriya Senanayake. I am very thankful that I got this opportunity to recall the memory of a highly -cultured gentleman politician who had been one of those rare men with great qualities. As his name indicates, he is a real *Ratna* among Gem of men.

I had the fortune of associating with him when he was a Deputy Minister, during which period I was the Mayor of Colombo. His services to the people of Sri Lanka, particularly to the people of the Minneriya Electorate, have been unique. He was very sociable as he was a journalist attached to the "Lankadeepa" newspaper in his early days. He transcended the boundaries of race, religion, caste and creed and embraced all people alike.

The Hon. Ratna Deshapriya Senanayake was a well-known lawyer, who was a tower of strength to the progressive movements led by the SLFP for over 50 years. I had the opportunity of visiting Indonesia when he was serving as the Sri Lankan Ambassador in Indonesia. I still remember that despite his position as Ambassador, he volunteered to accompany me whenever I wanted to do shopping.

As a Deputy Minister, he rendered an excellent service. As a man, he fostered fellowship among the different ethnic communities; he was an ardent believer in multiculturalism and ethnic harmony. He always looked at the problems of the people with great understanding and an open mind. His approach to the various issues had been unique in respect of each issue. He was particularly careful not to offend anyone.

He was a revolutionary and progressive politician whose concern was the welfare of the people. He was an honest and clean politician and his life can be emulated as a model by all present-day politicians. He proved himself as a people's leader and he was a good listener who was always ready to help those who came to him seeking his assistance.

Sir, I join the Hon. Members of this House in paying my highest tribute to him and conveying my deepest condolences to the members of his family.

Thank you.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇත.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. SPEAKER left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 2.22]

**ගරු සරණ ගුණවර්ධන මහතා (ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரண குணவர்தன - பெற்றோலியக் கைத்தொழில்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sarana Gunawardena - Deputy Minister of Petroleum Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හිටපු නියෝජ්‍ය අමාත්‍ය රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්නට අවස්ථාවක් ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වනවා.

1922 දී, මිනුවන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ, පත්තඩුවන ග්‍රාම නිලධාරි වසමේ ඉපදුණු එතුමා මගේ පියාත්, අපගේ පවුලේ අයත් සමඟ තිබුණ සම්බන්ධතාව මත එතුමා වෙනුවෙන් ගුණ කථනයක් කිරීම මගේ යුතුකමක් වනවා. රත්න දේශප්‍රිය සේනානායක නියෝජ්‍ය අමාත්‍යතුමාට අපි කියන්නේ පොඩි රාළහාමි කියලායි. එතුමා යාගොඩමුල්ල ප්‍රාථමික විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබලා, කොටහේන ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයෙනුත්, විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් ලැබූ උසස් අධ්‍යාපනයෙන් පසුව අධිනීතිඥවරයකු දක්වා දීර්ඝ ගමනක් ගිය දේශපාලන නායකයෙක්.

එතුමාගේ දේශපාලන ගමනේදී, එතුමා 1947 දී කොමියුනිස්ට් පක්ෂය හරහා ගම්පහ මැතිවරණ කොට්ඨාසයට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කිරීමට නොහැකි වුවද, එම මැතිවරණයේදී තම තරගකරුට ප්‍රබල අභියෝගයක් දීපු දේශපාලන නායකයෙක්. 1960 දී ඩඩ්ලි සේනානායක හිටපු අගමැතිතුමාට එරෙහිව දැදිගම අසුනට තරග කර ඡන්ද 1,600කට ආසන්න සංඛ්‍යාවකින් පරාජය වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් විශාල කැප වීමක් කර, රටේ අගමැතිවරයාට අභියෝගයක් දුන්න දේශපාලන නායකයෙක් එතුමා. දේශපාලන ජීවිතයේදී විවිධ අභියෝගවලට ලක් වෙලා, තමන්ගේ දේපළ ඇතුළු සියලු සේසත විනාශ කර ගන්නට සිදු වුවත් එතුමා තම පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් වුණු නායකයෙක් කියන එක අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ. එතුමා 1965 දී නැවත දැදිගම ආසනයට තරග කර ඡන්ද තුන්දහස් ගණනකින් පරාජයට පත් වුණා. 1983 පැවැති අතුරු මැතිවරණයට ඉදිරිපත් වෙලා පරාජයට පත් වුණත්, ඒ අභියෝග හමුවේ වුවද පක්ෂය අත් හරින්නේ නැතුව එතුමා දේශපාලන වශයෙන් විශාල ගමනක් ගියා.

අපි දන්නවා, රත්න දේශප්‍රිය සේනානායක මහත්මයා වාගේම ධර්මසිරි සේනානායක මහත්මයාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශාල ශක්තියක් දුන්නු බව.

රත්න දේශප්‍රිය සේනානායක මහතා පුවත් පත් කලාවේදියකු හැටියට "ලංකාදීප" පත්තරයේ සේවයට ඇවිල්ලා ඒ පුවත් පත මේ රටේ මෙන්ම ලෝකයේ ද ප්‍රචලිත කරන්නට විශාල කැප වීමක් කරලා, 'වනාතී' තීරුව ලියලා රත්න දේශප්‍රිය සේනානායක කියන නාමය ප්‍රචලිත නමක් විධියට ජනතාවට අතරට රැගෙන ගියා. එතුමා එතැනින් නැවතුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නැවතත් දේශපාලනයට ඇවිල්ලා 1970 මහ මැතිවරණයේදී මින්නේරිය මැතිවරණ කොට්ඨාසයට තරග කරලා විශිෂ්ට ජයග්‍රහණයක් අත් පත් කර ගනිමින් මෙම උත්තරීතර සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් අසුන් ගත්තා. සී.පී. ද සිල්වා කියන්නේ හිටපු ඇමතිවරයෙක්; සභානායකවරයෙක්; ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල යෝධයෙක්; මින්නේරිය දෙයියෝ කියලායි රජරට ප්‍රදේශයේ අය එතුමාව හඳුන්වන්නේ. එවැනි නායකයෙක් පරද්දලා තමයි රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා මින්නේරිය ආසනය ජය ගත්තේ. එතුමා මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට රටටත් අපටත් විශාල සේවයක් කළා.

මට මතකයි, මම පුංචි ළමයකු හැටියට ඉන්න කාලයේ බොරැල්ල, Tickle Road එකේ, ග්ලෝරියා නෝනාගේ නිවසේ එතුමා පදිංචි වෙලා ඉන්න වෙලාවේ වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඒ වාගේම පක්ෂයෙන් ඉවත් වෙලා ගිය විජය කුමාරණතුංග සහෝදරයා එම නිවසට ඇවිල්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන ගමන නැවත ස්ථාපිත කරන්නට උදේ සිට රෑ වෙන තෙක් වැඩ කළ අන්දම; කැප වුණ අන්දම.

එතුමා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වෙනුවෙන්, පක්ෂය වෙනුවෙන් නිරන්තරයෙන්ම තමන්ගේ ශ්‍රමය, ධනය, කාලය කැප කරපු නායකයෙක්. එතුමාගේ කාල පරිච්ඡේදය තුළ - 1970 -77- මින්නේරිය, පොළොන්නරුව, මැදිරිගිරිය, කවුඩුල්ල ඇතුළු අනෙකුත් ගම්මානවලට ඇවිදගෙන ගිහිල්ලා කෘෂිකර්මාන්තය දියුණු කරන්න, මහා මාර්ග පද්ධතිය ශක්තිමත් කරන්න, ගංගා ඇළ වේලි සකස් කරන්න, ජල ව්‍යාපෘති ඇති කරන්න වාගේම අධ්‍යාපනය, සෞඛ්‍ය යන මේ සෑම දෙයක්ම දියුණු කරන්න වැඩ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගෙන් හැදුණු දේශපාලන චරිත අද මේ පාර්ලිමේන්තුව තුළත් තිබෙනවා. එතුමා ළඟට ගිහිල්ලා දේශපාලනය ඉගෙන ගෙන මේ රටේ ප්‍රබල තනතුරුවලට ආපු බොහෝ දෙනෙකු අදත් ඉන්නවා. එතුමා තුළ කුහකකම තිබුණේ නැහැ; ඊර්ෂ්‍යාව තිබුණේ නැහැ; කැපිලි කෙටිලි තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා 1960 සහ 1965 කාලවල දැදිගම ආසනයට තරග කළා. නැවත 1970 දී මින්නේරිය මැතිවරණ කොට්ඨාසයට තරග කරන කොට මගේ පියතුමාත් එක්ක ගෙන ගිහිල්ලා දේශපාලනයට නැඹුරු කරලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගම්පහ ආසනය මගේ පියාට භාර දෙන්න එතුමායි, ගරු ධර්මසිරි සේනානායක හිටපු ඇමතිතුමායි එකතු වෙලා බණ්ඩාරනායක මැතිනිය සමඟ සාකච්ඡා කරලා මගේ පියාගේ දේශපාලන ගමන ඉදිරියට අරගෙන යන්න පුළුවන් වටපිටාවක් ඇති කළා. ඒ අනුව තමයි මටත් පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ඇති වුණේ. එතුමා බොහොම නිහතමානී වැදගත්කමින් යුක්ත දේශපාලන නායකයෙක් බව මා කියන්න කැමැතියි. එතුමා හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් වුණත්, හිටපු තානාපතිවරයකු වුණත් බෑග් එක අරගෙන බොරැල්ලේ පොළට ගිහිල්ලා අවශ්‍ය කරන එළවලු ටික, බඩු ටික අරගෙන එනවා මට මතකයි. ඒ වාගේම නිතරම සරමයි බැනියමයි ඇඳගෙන සිටින, බොහොම සරලව තමන්ගේ ජීවිතය ගෙවාපු කෙනකු වාගේම බොහොම ආදර්ශවත්, වැදගත් දේශපාලනඥයකු හැටියට අපි එතුමාව දකිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ ඒ ගමන් මඟ ඉදිරියට ගෙන යන්න සමුද්‍රිකා, දිල්රුක්ෂි, තුෂාරා නමින් දියණියන් තිදෙනෙක් මේ සමාජයට බිහි කරලා තිබෙනවා.

අවසාන වශයෙන් එතුමාගේ ආදරණීය බිරිඳ ග්ලෝරියා සේනානායක මහත්මිය, දියණියන් තිදෙනා ඇතුළු එම පවුලේ සියලු දෙනා වෙත අපගේ ශෝකය පුද කරමින් එතුමාට නිවන් සුව අත් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.30]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)

(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ හිටපු ඉතාම ප්‍රගතිශීලී නායකයෙක් වුණු ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන වෙලාවේ මටත් ඒ සඳහා සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීම ගැන මා ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා මා මුලින්ම දැක්කේ ශ්‍රී ලංකා - චීන මිත්‍ර සංගමයේ සභාපතිවරයා හැටියට එතුමා කටයුතු කරන කාලයේයි. මම එවකට පාසල් යන දරුවකු හැටියට, මගේ පියා -මාර්ෂල් පෙරේරා මැතිතුමා- එක්ක නිරන්තරයෙන්ම ශ්‍රී ලංකා-චීන මිත්‍ර සංගමයේ රැස්වීම්වලට සහභාගි වුණා. එවකට ශ්‍රී ලංකා-චීන මිත්‍ර සංගමයේ සභාපති ධුරය දැරුවේ ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමායි. සයිමන් ඔරුගොඩවත්ත මැතිතුමා එහි ලේකම් ධුරය දරන කොට නන්ද එල්ලාවල මැතිතුමන්ලා එක්ක, ටෙනිසන් එදිරිසූරිය මැතිතුමන්ලා එක්ක මගේ පියාත් ශ්‍රී ලංකා චීන මිත්‍ර සංගමයේ ක්‍රියාකාරීව කටයුතු කළා. ඒ සමයේ තමයි මම ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාව දැක්කේ. එතුමා එක්ක කථා කරන්න මට ඒ දවස්වල අවස්ථාව ලැබුණේ නැහැ. එතුමාගේ බිරිඳ, ග්ලෝරියා මැතිනියත් ඒ දවස්වල නිරන්තරයෙන්ම ශ්‍රී ලංකා චීන මිත්‍ර සංගමයේ රැස්වීම්වලට, අපේ බී.ජේ. ප්‍රනාන්දු මැතිතුමාගේ මැතිනිය වුණු පුෂ්පා ප්‍රනාන්දු මැතිනියත් එක්ක සහභාගි වෙනවා මම දැකලා තිබෙනවා. ඒ දවස්වල තමයි මම ඒ අයව දැක්කේ.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

නාලන්ද එල්ලාවල මැතිතුමාත් එක්ක මම 1994 පාර්ලිමේන්තුවට ආවායින් පස්සේ තමයි ඒ පවුලේ අය සමඟ අපි තව තවත් සම්බන්ධකම් ඇති කර ගත්තේ. නාලන්ද එල්ලාවල මැතිතුමා හරහා එතුමාගේ දියණිය, තුෂාරි සහෝදරියත් එක්ක අපි ඉතා ළඟින් ඇසුරු කළා. විවිධ කාරණා කටයුතුවලදී අපි එකතු වෙලා කටයුතු කළා; විනෝද ගමන් ගියා. අපි එකට එකතු වෙලා කථා කරපු බොහෝ අවස්ථා තිබුණා. පසුව ගරු නාලන්ද එල්ලාවල මැතිතුමා හරහාම අපට දැන ගන්න ලැබුණා, අපි විරුද්ධ පක්ෂයේ ඉන්න කොටත් ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා එතුමා නියෝජනය කළ පක්ෂය බලයට ගෙනෙන්න කොච්චර වැඩ කටයුතු කළාද කියන කාරණය.

සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ ටිකල් රෝඩ් එකේ පිහිටි එතුමාගේ ගෙදර තමයි සෑම රාත්‍රියකම, සෑම හැන්දෑ වරුවකම වාගේ විවිධ ආකාරයේ සාකච්ඡා පැවැත්වුණු තැන. ටිකල් රෝඩ් එකේ ඒ ගෙදර මිදුලේ ලොකු ගහක් තිබුණා. ඒ ගහ යට තමයි ඒ සියලු සාකච්ඡා පැවැත්වුණේ. ඒ නිසා රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා අවුරුදු දහහතකට පසුව නැවත ආණ්ඩුව හදන කර්තව්‍යයේ පිටුපස ඉඳගෙන, ඒ සියලු කාරණා ඉටු කරපු මහා අදෘශ්‍යමාන බලවේගය වුණාය කිව්වත් වැරැදි නැහැ.

ඊළඟට අප කවුරුත් නොදන්නා වූ කාරණයක් තමයි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව පරිත්‍යාගයක් හැටියට අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජයට ලැබෙන කොට, පසු පෙළේ ඉඳලා ඒ සඳහා ක්‍රියාකාරීම වැඩ කොටස කළේ රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා බව. ශ්‍රී ලංකා චීන මිත්‍ර සංගමයේ සභාපතිවරයා හැටියට එතුමා චීන සමූහාණ්ඩුව එක්ක ඇති කරගෙන තිබුණු ඉතාම කිට්ටු සම්බන්ධකම එයට මූලික වශයෙන් හේතු වුණා. අදත් අප අභිමානයෙන් කථා කරන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව වාගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් පවත්වන්න පුළුවන් ස්ථානයක් පරිත්‍යාගයක් වශයෙන් අපට ලැබී තිබෙන්නේ එතුමා පසුබිමේ ඉඳලා ශ්‍රී ලංකා චීන මිත්‍ර සංගමයේ සභාපතිවරයා හැටියට චීනයත් එක්ක පවත්වපු ඒ සම්බන්ධකම් හරහාය කියන කාරණය අප කවුරුත් නොදන්නා දෙයක්. අප අදවත් එය මතක කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට -විශේෂයෙන්ම මින්නේරිය ආසනයේ ජනතාවට- එතුමා කරපු සේවය අද ගරු සභානායකතුමාත්, අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලාත් කියන්නට යෙදුණා. රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා තමා දේශපාලනඥයෙක් හැටියට දරපු ඒ මතවල නිරන්තරයෙන් ඍජුව පෙනී හිටිමින්, ජයග්‍රහණයේදී නිහතමානීව ජනතාවට සේවය කරන ගමන්, පරාජයේදීත් පක්ෂයේ ප්‍රතිපත්ති වෙනුවෙන් ඉන්ද්‍රඛීලයක් සේ කෙළින් පෙනී හිටපු ආදරණීය ජන නායකයෙක්.

අපට මතකයි, මින්නේරිය අතුරු මැතිවරණය ආපු වෙලාවේ පක්ෂය දෙකට කැඩිලා විජය කුමාරණතුංග මැතිතුමා වෙනම ඡන්දය ඉල්ලපු අවස්ථාව. ඒ මැතිවරණයේදී විපක්ෂයෙන් අපේක්ෂකයන් දෙදෙනෙක් -විශේෂයෙන්ම විජය කුමාරණතුංග වාගේ චරිතයක් ඡන්දය ඉල්ලන වෙලාවේ- පරාජය දැක දැකත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති වෙනුවෙන් ඍජුවම ඉදිරිපත් වෙමින් එතුමා මින්නේරියේ ඒ මැතිවරණ සටනට මුහුණ දුන්නා. ඒක තමයි අපේ දේශපාලනයේ සාමාන්‍යයෙන් අප නොදකින ප්‍රතිපත්තිගරුක දේශපාලනය කරන මනුෂ්‍යයන්ගේ ලක්ෂණය. එතුමා දේශපාලනයේ ඒ පෙන්වූ දක්ෂකම, 1994න් පස්සේ තානාපතිවරයෙක් හැටියට ඉන්දුනීසියාවේදීත් පිලිපීනයේදීත් ඉතාමත් හොඳින් පෙන්වූ ආකාරය අප දැක්කා. ඒ කාල වකවානුවේදී ඉන්දුනීසියාව සහ පිලිපීනය කියන රටවල් අපේ රටත් සමඟ තිබෙන තානාපති සබඳකම් අද මේ මට්ටමට ගෙන ඒමේ ස්ථාවර අඩිතාලම -ශක්තිමත් පදනම- දැමීමේ පුරෝගාමියා වුණේ රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා වාගේ නිහතමානී විශේෂයෙන්ම ප්‍රතිපත්තිගරුක, අවංක දේශපාලන චරිත වැඩි වැඩියෙන් අපේ රටට අවශ්‍ය යුගයක එතුමාගේ ජීවිතයෙන් අපට ගන්න පුළුවන් දෑ බොහෝයි. එවන් පුරුෂයෙකුගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ වෙලාවේ අප සියලු දෙනාම අධිෂ්ඨාන කර ගත යුතු එක දෙයක් තිබෙනවා. එතුමාගේ ජීවිතයේ වැදගත්ම ලක්ෂණ වෙච්ච ප්‍රතිපත්තිගරුකභාවය, නිහතමානීකම, හොරකම වංචාවට හැම දාම පිටු දැකීම, තමන්ට භාර දුන්නා වූ වැඩ කොටස වග කීමෙන් යුක්තව ඉෂ්ට කිරීම යනාදී කාරණා අපේ ජීවිතවලට ඇතුළු කර ගැනීම තමයි මා හිතන්නේ එතුමා වෙනුවෙන් සැබැවින්ම අප ශෝක වනවා නම් කළ යුතු වන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මීට වඩා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමාගේ අභාවය පිළිබඳව අපගේ ශෝකය විශේෂයෙන්ම සේනානායක මැතිනියටත්, අපේ ආදරණීය මිතුරිය වන තුෂාරි ඇතුළු ඒ පවුලේ සියලුම දියණිවරු සහ බෑනාවරුන්ටත් මේ වෙලාවේ පළ කර සිටිනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා චීන මිත්‍ර සංගමයේ කටයුතුවලදී එතුමා සමඟ මගේ පියා ඉතාම ළඟින් ඇසුරු කරපු නිසා මගේ පියාගේ සහ මවගේ ශෝකයත්, අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ ආදරණීය ප්‍රගතිශීලී ජනතාවගේ ශෝකයත් එතුමාගේ පවුලේ අය වෙත දැනුම් දෙන ලෙස ඉල්ලමින්, එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 2.36]

**ගරු කමලා රණතුංග මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා පිළිබඳ මේ උත්තරීතර සභාවේදී මටත් වචනයක් ප්‍රකාශ කරන්න ලැබීම මගේ වාසනාවක් කොට සලකනවා. හැම දාමත් කියනවා වාගේම ඒ අවස්ථාව මට උදා කර දුන්න කෘතවේදී නායකයෙක් වන අතිගරු ජනාධිපතිතුමාට නැවත නැවතත් මගේ කෘතඥතාව පුද කරනවා.

ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා මා දැන හඳුනා ගත්තේ, පාසල් ශිෂ්‍යාවක වශයෙන් 1960 වසරේදීයි. එතුමා ඩඩ්ලි සේනානායක අග්‍රාමාත්‍යතුමා සමඟ තරග කරද්දී දැදිගම ආසනයේ පැවති මැතිවරණ වේදිකාවකටයි මා ප්‍රථමයෙන්ම නැග්ගේ. මට මතකයි, අද වයෝවෘද්ධව පසු වන එස්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාත්, සී.ආර්. බෙලිගම්මන මැතිතුමාත්, විමලා විජේවර්ධන මැතිනියත්, මමත් මඩුගස් වලව්වේ ඉඳලා දැදිගම ආසනයේ රැස්වීමට ගියා. එදා අප ගියේ දැදිගම ආසනයේ කොටවෙහෙර ගමටයි. ඒ රැස්වීමේදී අපට එක්සත් ජාතික පාක්ෂිකයින් "හූ" කිව්වා. මට එය අද වාගේ මතකයි. එදා ගරු රත්න දේශප්‍රිය මැතිතුමා මයික් එක අරගෙන ප්‍රතිවාදීන්ට උත්තර දුන්නු හැටි අදත් සිහියට නැඟෙනවා. ඉතාම ගාම්භීර හඬකින්, ගොරෝසු හඬකින් එතුමා ඒ ප්‍රතිවාදීන්ට පිළිතුරු දුන්නා. ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාට ජය පරාජය දෙකම එක වාගේම හුරු පුරුදුයි. එතුමා තරග කරන්න පත් කෙරුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයයි. හැම වෙලාවකම නායකයින් එක්ක, නම දරාපු උදවිය එක්ක, හිටපු අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මැතිතුමා එක්ක වාගේම "මින්නේරිය දෙවියෝ" හැටියට සලකපු සී.පී. ද සිල්වා මැතිතුමා එක්ක එතුමා තරග කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ පත්තඹුවන ග්‍රාමයේ උපත ලබලා එතුමා තරග කරන්න ගියේ මින්නේරිය වාගේ ඈත, දුෂ්කර, පිටිසර ප්‍රදේශයකටයි. එතුමාට පුළුවන් වුණා, ඒ සටන ජය ගන්න. මා ප්‍රකාශ කරන්න ඕනෑ, ඇත්තටම දේශපාලනඥයෙක් හැටියට එතුමා කවදාවත් හරි හම්බ කළේ නැහැ, මුදල් හම්බ කළේ නැහැ කියන එක. එතුමා හම්බ කළේ ජනතාවයි. මට මතක් වෙනවා, එතුමාගේ දයාබර සහෝදරයාණන් වන ධර්මසිරි සේනානායක මැතිතුමා. මේ දෙදෙනාම දක්ෂ කථිකයෝ. ඒ වාගේම ජනතාව ඇද බැඳ ගන්න වේදිකාවේදී මොකක් හරි විහිළුවක් කරලා ජනතාව හිනස්සලා ජනතාවගේ ආදරය දිනා ගන්න පුළුවන් ශක්තියක් තිබුණු අයියා මලෝ දෙදෙනෙක් තමයි රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාත්, ධර්මසිරි සේනානායක මැතිතුමාත්.

මේ අයියයි, මල්ලියි දෙදෙනාම ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විශාල ශක්තියක්, විශාල ධෛර්යයක් වුණා. ඒක නිසාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධුරය මල්ලි දැරුවා. අයියාට නියෝජ්‍ය අමාත්‍ය ධුර කීපයක් අපේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගෙන් ලබා ගන්න පුළුවන් වුණා. සරණ ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි එතුමා දැනගෙන හිටියා, මේ මන්ත්‍රීකම කියන්නේ තාවකාලිකව ඇද ගත්ත පිරුවටයක් බව. මන්ත්‍රීකම නැති වුණත් පාරේ යන්න පුළුවන් විධියට තමයි එතුමා දේශපාලනය කළේ. ඩිලාන් පෙරේරා ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළ පරිදි චීන මිත්‍ර සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරද්දී, තුල්හිරියේ පේෂකර්ම සංස්ථාව ලබා ගන්න චීන සමූහාණ්ඩුවෙන් ආධාර ලබා දෙන්න එතුමාට පුළුවන් වුණා. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව පිහිටුවන්න චීන සමූහාණ්ඩුව කටයුතු කරන කොට එතුමාගෙනුත් ඒකට විශාල දායකත්වයක් ලැබුණා. එතුමා දක්ෂ කථිකයෙක් වාගේම දක්ෂ නීතිඥයෙක්. අප දන්නවා, රජය පෙරළීමේ කුමන්ත්‍රණ නඩුව තිබිච්ච වෙලාවේ උඩුගම මහත්මයාලාට, ඥානසීහ ස්වාමීන් වහන්සේට විත්තිය වෙනුවෙන් ඉතාම දක්ෂ ලෙස එතුමා ඒ නඩුව මෙහෙය වූවාය කියන එක. ඒ වාගේම මට මතකයි, එතුමාගේ මැතිවරණ වේදිකා සියල්ලකම කථිකයෙක් හැටියට මා ගියා. එතුමා ගම්මානවලට පයින් ගියා. ගොවි ජනතාව හමු වුණා. ගොවි ජනතාවගේ ප්‍රශ්න සඳහා විශේෂ අවධානයක් යොමු කළා. එතුමා ඉතාම ආදර්ශවත් නායකයෙක්.

එතුමා වයස්ගත වී නිවසේ සිටින අවස්ථාවේ, මට මන්ත්‍රීකම ලැබුණාට පස්සේ මම එතුමාව මුණ ගැහෙන්නට ගියා. ඇත්තටම එතුමා ඉතාම සන්තෝෂයෙන් මා සමඟ කථා කළා. දැනුත් මට ඒ අවස්ථාව සිහියට නැඟෙනවා. මා මන්ත්‍රීවරියක් හැටියට පත් කිරීම ගැන එතුමා අතිගරු ජනාධිපතිතුමාට කෘතඥතාව පුද කළා.

පක්ෂයට තිබෙන ආදරය වාගේම, පක්ෂය ගොඩ නඟන්නට ශක්තියක් දුන් අයටත් එතුමා හිතවත්කම දැක්වූවා; හිතෛෂීව කටයුතු කළා. ඒ වාගේම එතුමාගේ කටයුතුවලට ග්ලෝරියා සේනානායක මැතිනියගෙන් විශේෂ සහයෝගයක් ලැබුණා. නිරන්තරයෙන්ම එතුමාව හමු වන්නට එන උදවියට තේ කෝප්පයකින් සංග්‍රහ කරන්නට එතුමිය හැම වෙලාවේම සූදානම්ව සිටියා. පුංචි සුන්දර සිනහවකින් ජනතාව පිළිගත්තා. එතුමාට ඒකත් ශක්තියක් වුණා.

මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපතිතුමා හැටියට සමස්ත ලංකාව පුරාම තොග වෙළඳ සංස්ථාවේ ශාඛා පිහිටුවන්නට කටයුතු කළා. රජය අපහසුතාවට පත් වෙච්ච අවස්ථාවල, ආර්ථික දුෂ්කරතාවලට මුහුණ පෑ අවස්ථාවල සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් විශාල ශක්තියක් ලබා දෙන්නට එතුමාට පුළුවන්කම ලැබුණා. හැම ගමක් පාසාම එතුමා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ශාඛා පිහිටෙව්වා. එම නිසා තමන්ට භාර දුන්, තමන් භාර ගත් වගකීම හරියට ඉෂ්ට කළ අවංක නිහතමානී දේශපාලනඥයෙක් හැටියට අපට එතුමාව හඳුන්වන්න පුළුවන්. එතුමාගේ අභාවය අපට විශාල පාඩුවක්. අප කාටත් අයිති වන ඉරණමට එතුමාත් මුහුණ දුන්නා. එතුමාගේ අභාවය පිළිබඳව ග්ලෝරියා සේනානායක මැතිනියටත්, එතුමාගේ පවුලේ දූ දරුවන්ටත් අපගේ සාතිශය සංවේගය පළ කරන අතර, එතුමාට අමා මහ නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

[2.44 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairman of Committees, this House has seen many colourful personalities who represented the people. There had been revolutionaries, socialists, communists, rightists, leftists, liberals, progressives and some even called others "reactionaries". That has been the history of this Parliament and from time to time, age after age. Such men added colour and dignity to this House. One such person who comes to my mind, who had always been a colourful and a dignified personality, was our dear Friend, former Member of Parliament and Deputy Minister, the Hon. Ratna Deshapriya Senanayake.

Sir, he was a very clever lawyer too. I remember seeing him on his feet in the courts. At that time, I rated him only second to Dr. Colvin R. de Silva in his style of legal arguments and the way he cross-examined witnesses. He was very robust. At times, he was aggressive and at times as a true style of a lawyer, he appeared to be very mild. But, he was able to extract the truth out of witnesses and get the judgment on his side.

Sir, I came to know the Hon. Ratna Deshapriya Senanayake together with our veteran trade union leader and Governor of the Western Province, "Jamal-al-Lail" Alhaj As-Seyed Alavi Moulana. I used to go with Governor Alavi Moulana for meetings organized by the Chinese Wing of the Communist Party and the Sri Lanka-China Friendship Association. Thereafter, Sir, I became very friendly with him. It was more so after having met in this House, his brother, the amiable and great Parliamentarian, who was full of humour and laughter, the Hon. Dharmasiri Senanayake who was the Minister of Media, Tourism and Aviation. He always held a sway in any debate in this House. I should say, Sir, that I had never met a person like him, who carried no hatred or malice against any other Member of Parliament. I used to cross words with him in this House. I used to fight for the rights of the former Air Ceylon employees. I get appeals from them even now. Whenever I fought with the Hon. Dharmasiri Senanayake - the able and younger brother of the Hon. Ratna Deshapriya Senanayake - he used to come out, pat on my shoulders and tell me, “Azwer, you are doing a wonderful job for your party”. So much so, Sir, when the inaugural flight was launched from Colombo to

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

Dhaka, what did I hear? The Hon. Dharmasiri Senanayake was telling me, “You are selected by me to go on the inaugural flight with the Hon. Minister (Prof.) G.L. Peiris, the Hon.(Mrs.) Nirupama Rajapaksa and others”. I was amazed, I could not believe my eyes. That is the way the family of the Hon. Ratna Deshapriya Senanayake showed love and affection to us. They always had the interests of their fellow men at their hearts.

Then, Sir, I met Ratna Deshapriya as Ambassador in Jakarta, Indonesia. The Committee on Public Enterprises headed by the Hon. D.P. Wickremasinghe, accompanied by the Members of the Committee, the Hon. John Amaratunga, Chief Whip of the Opposition today, the Hon. Vasudeva Nanayakkara, who is a Minister today and several others went there. He had a party for us. He was a colourful personality. He danced his way through and made all of us happy.

When he was in the Dedigama Electorate, I used to meet him at times in the Kal-Eliya Arabic College and at other Muslim schools in that electorate. Incidentally, the Kal-Eliya Arabic College is the first Arabic College for Muslim females. I see today in the Gallery, a galaxy of Muslim students wearing the *fardha* and *hijab*, who have come to Parliament today. He helped this Arabic College, the Thihariya Home for the Disabled and several other institutions.

Although he was a progressive and a fighter, he was very much liberal at his heart. He catered to the needs of all communities, not only in Mirigama and Dedigama, but also in Minneriya and other places.

I was one of those people who were attracted by his writings. The Hon. Ratna Deshapriya Senanayake came under the tutelage of the great doyen of journalism, D.B. Dhanapala. He used to excel in writing in Sinhala. He wrote a regular column called, “Vanahi” - "ඒ වනාහි, මේ වනාහි, මේ ප්‍රශ්න සම්බන්ධව ගන්නා වූ තීරණ වනාහි" ආදි වශයෙන්. He whacked at the so-called reactionaries, the bourgeoisie class or company owners who failed to give proper wages to the people who worked very hard.

The Hon. Ratna Deshpriya Senanayake served as the Deputy Minister of Information and Supplies under the then Prime Minister Sirimavo Bandaranaike. He was also the Minister of Planning in the Bandaranaike regime. He served the SLFP with dedication and commitment. Having served as Chairman, CWE from 1960 to 1965, he was appointed Deputy President of the SLFP in 1980, giving strong leadership to the party in the Polonnaruwa District.

The Hon. Ratna Dehsapriya Senanayake was a well-known journalist, an able lawyer, who was a tower of strength to the progressive movements of the country led by the SLFP for over 50 years. He was an honest and clean politician. In his varied life, he was one who never gave in to any undue influences politically, socially or in community life. As an honest and clean politician, his life can be emulated as a model by all present-day politicians.

The Hon. Ratna Dehsapriya Senanayake served this House with distinction for 6 years and 28 days.

I wish him eternal bliss and may his soul be sanctified!

Thank you.

[අ.භා. 2.53]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිවංගත රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාගේ විශිෂ්ට චරිතාපදානය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත් දීර්ඝ විස්තරයක් කළා. ඒ නිසාත්, කාලය සම්බන්ධයෙන් සීමා ඇති නිසාත් නැවතත් එම කරුණු එකින් එක කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

අපි රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමාව දකින්නේ මේ රටේ කීර්තිමත් දේශපාලනඥයකු, ඒ වාගේම මාධ්‍යවේදියකු වශයෙනුයි. එදා මාධ්‍යවේදීන් ගැන කථා නොකරපු යුගයක එතුමා ඒ මාධ්‍ය සංස්කෘතියට වැදගත් අරුතක් ලබා දුන්නා. එතුමා "ලංකාදීප" පත්‍රයේ කටයුතු කරද්දීත්, මාධ්‍යයට සම්බන්ධ අනෙකුත් ආයතන සමඟ කටයුතු කරද්දීත් එතුමාගේ උතුම් මිනිස් ගුණ අපි දැක්කා. එතුමා මාධ්‍යවේදියකු වශයෙන් ඉතාමත් සාධාරණ වුණා. විශේෂයෙන්ම මාධ්‍යවේදීන් අඩු යුගයක මාධ්‍ය සංස්කෘතියේ ගෞරවය ආරක්ෂා කරන්න එතුමා ක්‍රියා කරපු ආකාරයත් අපට මතක් වෙනවා. එතුමා ජනතාවට ඉතාමත්ම සමීපව ජීවත් වුණු මහජන හිතකාමී දේශපාලනඥයෙක්. එතුමා ජනතාවට ආදරය කළා; ඒ වාගේම ජනතාව සමඟ ජීවත් වුණා. ඒ වාගේම එතුමා දේශපාලනඥයකුට අවශ්‍ය ආදර්ශවත් ජීවිතයක්, වාම් ජීවිතයක් ගත කළා.

වැදගත් කීර්තිමත් පවුලකින් පැවැතුණු එතුමා පවුලේ ගෞරවය ආරක්ෂා කරමින්, තමන්ගේ කීර්ති නාමය ආරක්ෂා කර ගනිමින් ජීවත් වුණා. මාධ්‍යවේදියකු වශයෙනුත්, දේශපාලනඥයකු වශයෙනුත් එතුමා ඉතිහාසගත වනවා කියලා මා මේ අවස්ථාවේ දී සඳහන් කරන්නට කැමැතියි.

මා මීට වඩා එතුමාගේ විශේෂ චරිතාපදානය සම්බන්ධයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් දේශපාලනඥයකු වශයෙන් තිබිය යුතු සියලුම උතුම් ගුණාංග එතුමා තුළ තිබුණු බව මා කියන්නට ඕනෑ. අවංකකම, සාධාරණත්වය අගය කළ එතුමා මිනිසුන්ට ආදරය කළා, මිනිසුන් සමඟ ජීවත් වුණා, මිනිසුන්ගේ ලෙඩට දුකට පිහිට වුණා. ලංකාවේ පහළ වූ හොඳ දේශපාලනඥයකු වශයෙන් එතුමාව හඳුන්වන්න පුළුවන්. මේ අවස්ථාවේ දී මා එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, අද දින පැමිණ සිටින එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත එක්සත් ජාතික පක්ෂයේත්, අපගේත් බලවත් ශෝකය පුද කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.56]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා (ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன - கிராமிய அலுவல்கள் அமைச்சர் )
(The Hon. Athauda Seneviratne - Minister of Rural Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප අද දින ශෝකය ප්‍රකාශ කරන්නේ දිවංගත රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා වෙනුවෙනුයි. රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු හැටියට දේශපාලනය ආරම්භ කළා. එතුමා මාක්ස්වාදය, සමාජවාදය පිළිබඳව හොඳ දැනුමකින් අවබෝධයකින් යුතුව ඒ දේශපාලනය කර ගෙන ගියා. ඒ වාගේම එතුමා චීනයේ මිත්‍රයකු හැටියට චීනය සමඟ විශේෂ සම්බන්ධකම් පැවැත්වූවා. එතුමා මඟින් චීනයත් සමඟ මහා සම්බන්ධතාවක් ලංකාවේ ගොඩනඟන්නට පුළුවන් වුණා. ඒ නිසා එතුමා නිතර චීනයට යන එන දේශපාලනඥයකු බවට පත් වුණා.

එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වෙලා 1960 ජූලි මැතිවරණයේදී දැදිගම ආසනයෙන් තරග කරන්න ඉදිරිපත් වුණා. එදා හදිසි මැතිවරණයකුයි පැවැත්වුණේ. 1960 පවත්වන ලද මැතිවරණයේදී බලයට පැමිණි ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ ආණ්ඩුව මාස තුනකින් බිඳ වැටුණා. ඒ අනුව නැවත මැතිවරණයකට යන්න සිද්ධ වුණා. 1960 මාර්තු මැතිවරණයේදී මම දැදිගම ආසනයෙන් තරග කළා. ඒ කාලයේ මම ලංකා සමසමාජ පක්ෂයේ හිටියේ. අපි -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලංකා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය- ඒ මැතිවරණයේදී සම්මුතියක් ඇති කර ගත්තා එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළ ආසනයක දෙවැනි තැනට එන පක්ෂයට ඒ ආසනය භාර දෙන්න.

ඉතින් එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග කරපු මුණසිංහ මැතිතුමා මට වඩා ඡන්ද 180ක් ලබා ගත්තා. ඒ අනුව දැදිගම ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමි වන කොට ගරු රත්න දේශප්‍රිය සේනානායක මැතිතුමා තමයි ඒ ආසනයේ අපේක්ෂකයා හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වෙලා සිටියේ. එතුමා වෙනත් ආසනයකින් ආපු කෙනෙකු නිසා, අමුත්තෙකු වුණු නිසා, සම්බන්ධතාවක් නොතිබුණු කෙනෙකු නිසා ඒ මැතිවරණයේ වැඩි වැඩ කොටසක් කරට අරගෙන කරන්න, මුළු ආසනය පුරා යන්න සිද්ධ වුණේ මට. අපි එතුමාත් එක්ක එකතු වෙලා ඒ ආසනයේ සංවිධාන කටයුතු බොහොම හොඳට කරන්න යෙදුණා. ඒ මැතිවරණයේදී ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමා ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද 1,000කින් පමණයි. හැම දාම විශාල වැඩි ඡන්ද ප්‍රමාණයකින් දිනාපු දැදිගම ආසනය එදා ඩඩ්ලි සේනානායක මැතිතුමාට ජයග්‍රහණය කරන්න ලැබුණේ ඡන්ද 1,000කින් පමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රත්න දේශප්‍රිය සේනානායක මහතා බොහොම ජනප්‍රිය, දක්ෂ කථිකයෙක්. එතුමා බොහොම දක්ෂ ලෙස රැස්වීම් හසුරුවලා කථා කරලා තමන්ගේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න යෙදුණා. එතුමා "ලංකාදීප" පත්තරයේ උප කර්තෘවරයා වශයෙන් සේවය කළා. එතුමා පුවත් පත් කලාවේදියෙක්; මාධ්‍යවේදියෙක්. එතුමා දක්ෂ ලේඛකයෙක් වුණා. "ලංකාදීප" පුවත් පතේ "වනාහී" කියන ජනප්‍රියම තීරු ලිපිය ලියුවේ එතුමායි. එතුමා නීතිඥයෙක් හැටියටත් කටයුතු කළා.

එතුමා 1970 මැතිවරණයේදී තරග කරන්න මින්නේරියට ගියා. එතුමාගේ මල්ලි වූ ධර්මසිරි සේනානායක මැතිතුමා දැදිගම ආසනයෙන් තරග කළා. රත්න දේශප්‍රිය මැතිතුමා 1970 මැතිවරණයට මින්නේරියෙන් තරග කරලා ජයග්‍රහණය කළා. ඉන් පසුව එතුමා Deputy Minister of Planning and Employment වශයෙන් කටයුතු කරන්න යෙදුණා. පසුව එතුමා තානාපතිවරයෙක් වශයෙන් කටයුතු කළා. අපි එතුමා ගැන සන්තෝෂ වන්නේ, කවදාකවත් එතුමාගේ ප්‍රතිපත්ති, වමේ අදහස්, ප්‍රගතිශීලි අදහස් වෙනස් වුණේ නැති නිසායි. එතුමා සියලු දෙනා එක්කම සහයෝගයෙන් වැඩ කරපු හොඳ දේශපාලනඥයෙක්. අගය කරන්න පුළුවන් චරිතයක් තිබුණු කෙනෙකු හැටියට අපිට එතුමා ගැන සඳහන් කරන්න පුළුවන්.

විශේෂයෙන්ම මෙහිදී අපේ සතොස ආයතනය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. එතුමා සතොස ආයතනයේ සභාපති හැටියටත් කටයුතු කළා. සතොස ගමට ගෙනියලා, ශාඛා තුන්සිය ගණනක් ආරම්භ කරලා, බොහොම ශක්තිමත් ව්‍යාපාරයක් බවට පත් කළේ එතුමාගේ කාලයේදීයි. එතුමා තමන්ට පැවරෙන සෑම කාර්යයක්ම දක්ෂ ලෙස ඉතා හොඳින් ඉෂ්ට කරපු අවංක දේශපාලනඥයෙක් බව සඳහන් කරන්නට කැමැතියි. එතුමාට නිවන් සැපත ප්‍රාර්ථනා කරමින් මගේ වචන ටික අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

I wish to associate myself with the sentiments expressed by both sides of Parliament on the death of the Hon. Ratna Deshapriya Senanayake, ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to send a copy of the Official Report, Hansard, to the members of the bereaved family.

The next Vote of Condolence is on the death of the Hon. W.I. Fernando. I call upon the Hon. Nimal Siripala de Silva to present the Vote of Condolence.

## ශෝක ප්‍රකාශය : ගරු ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු මහතා
## அனுதாபத் தீர்மானம் : மாண்புமிகு டபிள்யூ.ஐ. பர்னாந்து
## VOTE OF CONDOLENCE : HON. W.I. FERNANDO

[අ.භා. 3.04]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෛද්‍ය විද්‍යාව නඟා සිටුවීම සඳහා අමිල මෙහෙයක් ඉටු කරමින් ජීවිත දස දහස් ගණනක් සුවපත් කළ, අසූව දශකය අවසාන භාගයේදී ජාතික ලැයිස්තුවෙන් පත් කරන ලද මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාවට පැමිණ සුවිශේෂී සේවාවක් ඉටු කළ ආයුර්වේද විශාරද, පණ්ඩිත්, ආයුර්වේද ශිරෝමණී, විද්‍යානිධි ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී ගරු සභාවට මම ඉදිරිපත් කරන්නෙමි.

වාද්දුව, මැලෑගම විසූ වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු මහතාගේත් පී.ඇම්. වීරසුන්දර මහත්මියගේත් පුත්‍ර රත්නයක් ලෙස වත්තගේ ඉතාලිස් ප්‍රනාන්දු මහතා 1917 ඔක්තෝබර් මස

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

25වැනි දින මෙළොව එළිය දුටුවේය. මාවල රජයේ පිරිමි විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ එතුමා වැඩිදුර අධ්‍යාපනය මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන තුළින් ලබා ගත්තේය. එහිදී පිරිවෙන් අවසාන විභාගය සමත් වූ ප්‍රනාන්දු මහතා ඉන් අනතුරුව පාරම්පරික වෙදකම පිළිබඳව කරුණු හදාළේය.

දේශීය වෛද්‍ය කර්මාන්තය සම්බන්ධව තවදුරටත් අධ්‍යයනයක යෙදුණු එතුමා බොරලැස්ගමුවේ ඇඩ්මන්ඩ් ආටිගල අබේරත්න මහතාගෙනුත්, කිරිබත්ගොඩ වෙද මුහන්දිරම් ඩී.ඒ.පී. අභයසේකර මහතාගෙනුත් ඒ පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගත්තේය. දේශීය වෛද්‍යවරයකු ලෙස තම ජීවන වෘත්තිය පටන් ගත් ප්‍රනාන්දු මහතා 1939 දී දෙහිවල නගරයේ පෞද්ගලික ආයුර්වේද ඖෂධාලයක් අරඹා, සර්වාංග වෛද්‍යවරයකු වශයෙන් සේවය කිරීමට පියවර ගත්තේය. එසේ වුව ද, අක්ෂි වෛද්‍යවරයකු වශයෙන් ඉතාමත් ප්‍රසිද්ධියට පත් වූ එතුමා වසර 70කට අධික කාලයක් විශේෂඥ ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස ජනාදරයට පත්ව සිටියේය.

1956 දී වාද්දුව, මැලෑගම විසූ සුප්‍රසිද්ධ අක්ෂි වෛද්‍යාචාර්ය පී.ඇස්.ඇස්. වීරසුන්දර වෙද ආරච්චිගේ දියණියක වූ සෝමා වීරසුන්දර මෙනෙවිය සමගින් යුග දිවි ගමන ඇරඹුවේය. ඉංග්‍රීසි ගුරු වෘත්තියේ නියැලුනු එතුමියටත්, වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු මහතාටත් එම විවාහය තුළින් රටට දැයට හිතැති දූ දරුවන් නව දෙනෙකු ලබා දීමට වාසනාව ලැබිණි.

මනරංජන, ජනරංජනී, කල්‍යාණප්‍රිය, අනෝමා, වජිරා, දර්ශනී, ජීවා, විශ්ව මිත්‍ර හා දේවප්‍රිය නමැති එම දූ දරුවන් මේ වන විට ආයුර්වේදය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි නියැලෙමින් රට වෙනුවෙන් ඉතා වැඩදායී කාර්යයන්හි යෙදෙමින් සිටිති.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ආයුර්වේද කොමසාරිස් ධුරයත්, මහනුවර මහ දිසාපති ධුරයත්, තවත් රජයේ වග කිව යුතු තනතුරු ගණනාවකුත් හෙබවූ දිවංගත ආයුර්වේදකීර්ති ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මහතා එතුමාගේ එකම සොහොයුරා විය.

1962 වසරේදී කොළඹ මරදානේ ශ්‍රී ලංකා වෛද්‍ය මහා මණ්ඩලයේ සභාපති ධුරයට පත් වූ ප්‍රනාන්දු මහතා 2011 වසර දක්වාම එම තනතුරේ රැඳී සිටියේය. 1976 සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය මහා සම්මේලනයේ සභාපති ධුරයට පත් වූ එතුමා 1994 දක්වාම එම උසස් තනතුර හෙබවීමට වාසනාවන්ත විය. බොරැල්ල ආයුර්වේද මහ රෝහලේ බාහිර රෝගී අංශයේ වෛද්‍යවරයකු ලෙස වසර 49ක් අඛණ්ඩව සේවය කළ ප්‍රනාන්දු වෙදැදුරුතුමා එහි බාහිර කථිකාචාර්යවරයකු ලෙසත්, නාවින්න බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයේ උපදේශක වෛද්‍යවරයකු ලෙසත් ඉතා දිගු කලක් සේවය කර ඇත. එපමණක් නොව, වැල්ලවත්ත අසරණ සරණ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ වසර 40කට වැඩි කාලයක් රෝගීන්ට නොමිලයේ ප්‍රතිකාර කළ මහ ඉසිවරයකු වශයෙන්ද එතුමාව හැඳින්විය හැකිය.

දේශීය වෛද්‍ය විද්‍යාවේ දියුණුව උදෙසා නිරතුරුවම ඇප කැප වූ එතුමා ආයුර්වේද වෛද්‍ය සංග්‍රහයේ කර්තෘ මණ්ඩල සාමාජිකයකු වශයෙන්ද, දේශීය චිකිත්සා සංග්‍රහයේ කර්තෘවරයෙකු වශයෙන්ද අති විශිෂ්ට සේවාවක් සිදු කර ඇත. "ආයුර්වේදය", "ආයුර්වේද ප්‍රදීපිකා" වැනි සඟරාවලටත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක් වන "ආයුර්වේද සමීක්ෂා" සඟරාවටත් ආරම්භක ලේඛකයෙකු වශයෙන් ශාස්ත්‍රීය ලිපි ගණනාවක් සැපයුවේය. මෑත භාගය දක්වාම එම සත් කාර්යයේ නියැලුණු ප්‍රනාන්දු මහතා, මුල් අවධියේ පටන්ම පුවත් පත් සඳහා සැපයූ ලිපි ප්‍රමාණය මෙතෙකැයි කිව නොහැක.

1989 දී බලයට පත් එක්සත් ජාතික පක්ෂ රජයේ ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් ජාතික ලැයිස්තුව යටතේ පත් කළ මන්ත්‍රීවරයකු ලෙස ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු නම් වූ මානව හිතවාදියා නම් කිරීම හේතුවෙන් මෙම උත්තරීතර සභාවේ අසුන් ගැනීමට එතුමා වාසනාවන්ත විය.

ආරෝහ පරිණාහ දේහ සම්පත්තියකින් පිරිපුන්ව සිටි එතුමා නියම සිංහල ගැමියකු සේ කොණ්ඩය බැඳ සිටි හෙයින්, "කොණ්ඩ වෙද මහත්තයා" නමින් ජනතාව අතර ප්‍රචලිත විය. මන්ත්‍රීවරයකු වශයෙන් සිටි කාලය තුළදී පාර්ලිමේන්තුවේදී පවා කවුරුන් විසින් වුවද එතුමාව හැඳින්වූයේ එම ආදර නාමයෙනි.

දේශීයත්වය ඉහළින්ම අගය කළ එතුමා පිරිහී යන සාරධර්ම නගා සිටුවීම වෙනුවෙන් නිරතුරුවම පෙනී සිටි, මිනිසත් බවින් පිරිපුන් උදාර පුද්ගලයෙකු ලෙස හැඳින්විය හැකිය. පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් සිංහලකම සහ දේශීයත්වය රැක ගැනීම සඳහා උදාර මෙහෙවරක යෙදුණු, නිහතමානීත්වයේ ප්‍රතිමූර්තියක් වූ ප්‍රනාන්දු මැතිතුමා වසර හතරකුත් මාස හතක කාල සීමාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සේවය කර 1993 වසරේදී ඉන් ඉවත් වූයේ අනුර බණ්ඩාරනායක මැතිතුමාට පාර්ලිමේන්තුවට පිවිසීම සඳහා තම අසුන පරිත්‍යාග කරමිනි.

කළුතර මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක වශයෙන්ද කටයුතු කළ එතුමා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජනාධිපති උපදේශක වශයෙන්ද සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළේය. රජයේ ආයුර්වේද රෝහලේත්, ආයුර්වේද විද්‍යාලයේත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ හා ආයුර්වේද අමාත්‍යාංශයේත් බොහෝ කමිටුවල සාමාජිකත්වය දරමින් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා ඉමහත් සේවයක් සැලසුවේය.

ප්‍රනාන්දු වෙදැදුරුතුමා මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙනේ යාවජීව දායකයෙක් විය. සේරුවිල මංගල මහා චෛත්‍යවර්ධන සමිතියේ යාවජීව සාමාජිකයෙක් මෙන්ම මැලෑගල ශ්‍රී සුගත බිම්බාරාම පුරාණ විහාරස්ථානයේ ප්‍රධානතම දායකයා වූ වෙදැදුරුතුමා කොළඹ හා කළුතර විහාරස්ථාන ගණනාවක ක්‍රියාකාරී දායකයෙක්ද විය. දෙහිවල තරුණ බෞද්ධ සමිතියේ යාවජීව සාමාජිකයෙකු ලෙසද කටයුතු කළ එතුමාගෙන් ආගමික වශයෙන්ද ශ්‍රේෂ්ඨ කාර්ය භාරයක් ඉටු විණ.

ආයුර්වේදයේ පුනරුදය වෙනුවෙන් ප්‍රනාන්දු වෙදැදුරුතුමන් දැක්වූ අනුපමේය දායකත්වය හා කැප වීම උදෙසා 1987 වසරේදී විද්‍යානිධි ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබුවේය. ඊට අමතරව ආයුර්වේද ශිරෝමණි පණ්ඩිත, ආයුර්වේද විශාරද පණ්ඩිත, සහස්‍රාභිෂේක වෛද්‍යශූරී, පියුෂපාණි, වෛද්‍ය විද්‍යා භූෂණ ආදී සම්මාන ගණනාවකින් වරින් වර පිදුම් ලැබීමටද එතුමා වාසනාවන්ත විණි.

රජයේ ආයුර්වේද අංශය නියෝජනය කරමින් මහජන චීනය, නෙදර්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය හා කැනඩාව යන රටවල චාරිකා කළ එතුමා තවත් වරෙක ජර්මන් ජනරජයෙන් ලද විශේෂ ආරාධනයක් අනුව 2000 වසරේදී එරට ජාතික රූපවාහිනියෙන් විකාශනය කළ විශේෂ රූපවාහිනී වෛද්‍ය සාකච්ඡාවකට සහ වැඩ මුළුවකට සහභාගි වීම සඳහා එරටෙහිද සංචාරය කර ඇත.

අඩ සිය වසකට වැඩි කාලයක් රෝගීන්ට සුව සෙත සැලසූ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු නම් වූ මානව හිතවාදී වෙදැදුරාණන් වසර 95ක් ආයු වළඳා 2012 මැයි මස 15 වැනි දින සිය ආදරණීය බිරිඳටත්, දූ දරුවන්ටත්, විශේෂයෙන් දේශීය වෙදකමට ඇලුම් කරන සැමටත් වේදනාවක් ගෙන දෙමින් සදහටම දෙනෙත් පියා ගත්තේය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම දේශීය වෛද්‍යවරයකු වශයෙන්ද, පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන්ද කටයුතු කළ වත්තගේ ඉතාලිස් ප්‍රනාන්දු නම් වූ යුග පුරුෂයාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාවට සහ දූ දරුවන්ටත්, පවුලේ ඥාතීන්ටත් දන්වා යැවිය යුතු යැයි මම යෝජනා කර සිටිමි.

[අ.භා. 3.12]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

මූලාසනයෙන් අවසරයි. අපේ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා පාර්ලිමේන්තුවට පැමිණෙද්දී, එතුමාගේ ඇඳුම ගැන රීති ප්‍රශ්නයකට මුහුණ දෙන්න සභානායක හැටියට මට සිද්ධ වුණා. ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් කරපු පළමුවන දේශීය වෛද්‍යවරයායි. එතුමා මේ පාර්ලිමේන්තුවට පැමිණියේ රෙද්දත් කමිසයත් -ෂර්ට් එකත්-, කෝට් එකත් ඇඳගෙනයි. අපි "කොණ්ඩ වෙද මහත්මයා" කියලා කිව්වාට ප්‍රශ්නය ඇති වුණේ කොණ්ඩය ගැන නොවෙයි. ප්‍රශ්නයක් ඇති වුණේ එතුමාගේ ඇඳුම ගැන. සමහරු එතුමාට කිව්වා, "මේ ඇඳුම ඇඳගෙන එන්න එපා. ජාතික ඇඳුම ඇඳගෙන එන්න" කියලා. "මොකක්ද, ජාතික ඇඳුම කියන්නේ, මම ඇඳගෙන එන්නේ මගේ තාත්තා ඇන්ද ඇඳුම; ඊටත් පෙර හිටපු අය ඇන්ද ඇඳුම. ඒ නිසා ඒකේ වෙනසක් නැහැ" කියලා එතුමා කිව්වා. මාත් ඒකට සහයෝගය දුන්නා. මොකද, ඇත්ත වශයෙන්ම අද තිබෙන ජාතික ඇඳුමටත් වඩා පැරණි ඇඳුමක් තමයි එතුමා ඇඳගෙන ඇවිත් සිටියේ. ඒ කාලයේ එතුමා එක එක සභාවලට ඒ ඇඳුම ඇඳගෙන ගියා. අපි කථානායකතුමාටත් මතක් කළා, එතුමාගේ සීයාත් මෙහෙම ඇඳගෙන එන්න ඇති කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය විසඳන කොට දෙවන ප්‍රශ්නය මතු වුණා. ඊළඟට කිව්වා, "දැන් ෂර්ට් එකයි, කෝට් එකයි ඇඳගෙන තිබෙනවා. ටයි එක ඇඳගෙන නැහැ" කියලා. එතකොට අපි කිව්වා, "නැහැ. මේ ක්‍රමය අනුව ටයි එක අඳින්න වුවමනා නැහැ" කියලා. අපි කිව්වා, මෙතුමා අනුගමනය කරලා ඉරානයේත් ටයි එකක් නැතුව ෂර්ට් එකයි, කෝට් එකයි අඳිනවා කියලා. අපේ මන්ත්‍රීවරුන්ගේ ඇඳුම පිළිබඳව පළමුවන තීරණය දෙන්න සිදු වුණේ අපේ කොණ්ඩ වෙද මහත්මයා පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේදීයි.

අපේ රට ජනරජයක් වුණාට පස්සේ 1972 කැස්බෑවේ අතුරු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයකු හැටියට ධර්මසිරි ආටිගල මැතිතුමා පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ආවා. එතුමා තමයි ජනරජයේ පාර්ලිමේන්තුවට ඇතුළු වුණු පළමුවන දේශීය වෛද්‍යවරයා. 1982න් පස්සේ දේශීය වෛද්‍යවරු අපේ පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. එම නිසා දේශීය වෛද්‍යවරයකු හැටියට ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා පත් කළා.

1977 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පත් වුණ ඒ කාල සීමාව තුළදී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා විශේෂ අවධානය යොමු කළා, දේශීය වෙදකම ගැන. එතුමා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ සේවය කළා, ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ සහෝදරයෙක්. ඒ තමයි ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා. එතුමාත් මගේ පියාත් දෙදෙනාම එකට සිටියේ; ළඟින් ආශ්‍රය කළේ. ඒ කමිටුව වාර්තා කළා, දේශීය වෙදකම තවත් දියුණු කරන්න වුවමනායි කියලා. ගත යුතු පියවර ගණනාවක් ගැන ඒ කමිටු වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. ඒ කමිටු වාර්තාව අදත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු කියන්නේ, රජයේ සිවිල් සේවයේ හිටපු ප්‍රධාන නිලධාරියෙක්. ඒදා පැවැති ආණ්ඩුවෙන් එතුමා ඉවත් කරලා තිබුණා. ඊට පස්සේ එතුමා "දවස" පුවත් පත් ආයතනයේ අධ්‍යක්ෂවරයකු හැටියටත් ක්‍රියා කළා. එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේත්, ප්‍රේමදාස මැතිතුමාගේත් උපදේශකවරයකු හැටියට ක්‍රියා කරමින් විශාල වග කීමක් භාර ගෙන කටයුතු කළා. ඉන් පස්සේ තමයි දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇති කරලා, දේශීය වෛද්‍ය ක්‍රම දියුණු කරන්න වැඩසටහන් කිහිපයක් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව යටතේ ක්‍රියාත්මක කර ගෙන ගියේ.

ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ ඒක තවදුරටත් ඉදිරියට ගෙන යන්න කියලා අපේ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට පත් කළා.

ඇත්ත වශයෙන්ම එතුමා ඒ ප්‍රදේශයේ ශ්‍රේෂ්ඨ වෙද පරපුරකට අයත් පුද්ගලයෙක්. එතුමාගේ පියාත්, පියාගේ පියාත් වෙදකමට දක්ෂ අය. විශේෂයෙන්ම ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමාට වඩා වෙනස් විධියටයි එතුමා අධ්‍යාපනය ලැබුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෝට්ටෙ විහාරයේ මහා නායක හැටියට පත් වුණ ලබුගම ලංකානන්ද මහා නායක හිමියන් යටතේ මොල්ලිගොඩ පිරිවෙනේදී ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා අධ්‍යාපනය ලැබුවා. එතුමා වෙදකම ගැන පුළුල් දැනුමක් ලබා ගත්තේ ආටිගල අබේරත්න වෙද මහත්මයාගෙන්. ඒ අය පුරාණ වෙද පරපුරවලට අයිති අය. ඇත්ත වශයෙන්ම පානදුර, බණ්ඩාරගම, හොරණ, කැස්බෑව ප්‍රදේශයෙන් තමයි ඒ අය බිහි වුණේ. එතුමාගේ මැතිනිය අයිති වෙන්නේත් මැලෑගම පරපුරට. මැලෑගම පරපුර ඇත්ත වශයෙන්ම වෙදකමටත් ජ්‍යෝතිශාස්ත්‍රයටත් දෙකටම දක්ෂයි. මැලෑගම වීරසුන්දර මහත්මයා එහෙම අපි දන්නවා. ඔය පරම්පරා දෙක තුනේම අය ඇන්දේ රෙද්දයි කෝට් එකයි කමිසයයි. මැලෑගම ප්‍රධාන වෙද පරපුරක් තවමත් ඉන්නවා. එතැනින් වෙදකම ඉගෙන ගෙන ඩබ්.අයි. ප්‍රන්නාදු මැතිතුමා දක්ෂ වෛද්‍යවරයකු හැටියට ක්‍රියා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එතුමා ගැන එක කාරණයක් කියන්න ඕනෑ. එතුමා කිසි දවසක වෙදකම සඳහා ගාස්තු අය කළේ නැහැ. කැමැති අයට මුදල් දෙන්න පුළුවන්. එතුමා මුදල් ප්‍රතික්ෂේප කළේත් නැහැ; ඉල්ලුවේත් නැහැ. ඒ කාලයේ බොහෝ දෙනෙකුට මුදල් ගෙවන්න ශක්තියක් තිබුණේත් නැහැ. ඒ නිසා සමහර විට ඒ අය ඇවිත් එතුමාට පලතුරු හෝ එළවලු හෝ දීලා යනවා. ඒ පැරණි චාරිත්‍ර අනුව තමයි එතුමා වැඩ කටයුතු කළේ. පාර්ලිමේන්තුවේදී එතුමා නාඩි වෙද මහත්මයකු හැටියට ඊට වඩා හොඳට අපට වෙදකම් කළා. ඒක අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න අමාත්‍යතුමාත්, රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමාත්, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් දන්නවා. නාඩි වෙද මහත්මයා හැටියට තමයි අපි එතුමා දැන ගෙන හිටියේ. එතුමා වෙදකම විතරක් නොවෙයි, දේශපාලනයත් දැන ගෙන හිටියා.

විශේෂයෙන්ම ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා "දවස" පුවත් පත ආරක්ෂා කරන්නත්, පුවත් පත් නිදහස වෙනුවෙනුත් කෙළින් ක්‍රියා කරපු පුද්ගලයෙක්. එතුමා කාටවත් භය නැතුව වැඩ කටයුතු කළා. ඒ වාගේම ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාත් වැඩ කටයුතු කළා. ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති කාලයේත් අගමැති කාලයේත් එතුමාව හොඳට දැන ගෙන හිටියා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එතුමා මේ සභාව තුළදී සම්ප්‍රදාය ආරක්ෂා කළා. ඒ සම්ප්‍රදාය ආරක්ෂා කරන ගමන් අනෙක් මන්ත්‍රීවරු වාගේ අනෙක් ප්‍රශ්න ගැනත් කථා කළා. එතුමාට ලෝකය ගැන දැනුමක් තිබුණා. කොණ්ඩ වෙද මහත්මයා කිව්වාට, ඉංග්‍රීසි භාෂාව එහෙම හොඳට දැන ගෙනයි එතුමා වැඩ කටයුතු කළේ. එතුමා මේ සභාවේ හිටපු කාලයේ දේශීය වෙදකම ගැන අපි හැම එක්කෙනාගේම දැනුම දියුණු වුණා විතරක් නොවෙයි, ආණ්ඩු පක්ෂයේ හිටියත් විරුද්ධ පක්ෂයේ හිටියත් අපි හැම එක්කෙනාටම එතුමාගෙන් විශාල සේවයක් වුණා. එතුමා මගෙන් දවසක ඇහුවා, "මොකක්ද මම කරන්නේ. මම මන්ත්‍රීකමේ ඉන්නද, ඉවත් වෙන්නද?" කියලා. එතකොට මම කිව්වා, "මට ඒක කියන්න බැහැ මන්ත්‍රීතුමා. ඔබතුමා තීරණය කරන්න. ඔබතුමාගෙන් සේවයක් සිදු වෙනවා" කියලා. අන්තිමේදී, අනුර බණ්ඩාරනායක මන්ත්‍රීතුමාට ආණ්ඩුවට බැඳෙන්න වුවමනායි කියලා එතුමා ඒ තනතුරෙන් ඉවත් වුණා. ඒ අනුව අනුර බණ්ඩාරනායක මැතිතුමා පාර්ලිමේන්තුවට ආවා. ඒ වෙලාවේ ඩබ්. අයි. ප්‍රනාන්දු මැතිතුමා කිව්වා, මම යූඑන්පී වුණාට පක්ෂ දේශපාලනය කරන පුද්ගලයෙක් නොවෙයි කියලා. ඊට පසුව එතුමා ජනාධිපති උපදේශකයකු හැටියට ක්‍රියා කළා.

අපට යුතුකමක් තිබෙනවා, මේ සභාවට, රටට එතුමාගෙන් වුණු සේවය ගැන විශේෂයෙන් ස්තුති කරන්න. එතුමා දේශීය වෛද්‍යවරයකු හැටියට ඒ සම්ප්‍රදාය ආරක්ෂා කරමින් වෙදකම් කළා. ඒ වෙදකමින් සුවය ලැබූ සියලු දෙනා වෙනුවෙන් එතුමාට ස්තුති කරමින්, එතුමාට නිවන් සැප ලැබේවා කියලා මේ සභාව වෙනුවෙන් ප්‍රාර්ථනා කරමින්, අපේ ශෝකය ඒ පවුලේ අයට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Salinda Dissanayake. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා. 3.21]

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අද ශෝකය ප්‍රකාශ කරන්නේ දේශීය වෛද්‍යවරයකුගේ අභාවය වෙනුවෙනුයි. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට පුරෝගාමී මෙහෙවරක් කළ මෙවැන්නෙකු උපහාරාත්මකව සිහිපත් කිරීමේ වග කීමක් වාගේම අයිතියක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට තිබෙනවා. දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ පුනර්ජීවනයක් සිදු වන වත්මන් යුගයේ ඒ වෙනුවෙන් අසීමිත මෙහෙවරක් කළ මෙවැනි අය සිහි කරන්නේ අතිශය ගෞරව බහුමාන පෙරදැරිව සමස්ත දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයම නියෝජනය කරමිනුයි. 1940 සිට 2005 දක්වා දේශීය පාරම්පරික වෛද්‍ය වෘත්තියේ යෙදුණු ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු මැතිතුමා සකල ජීවිතයෙන්ම වෛද්‍යවරයෙක්. සර්වාංග වෛද්‍යවරයෙක් වූ මෙතුමා විශේෂයෙන්ම අක්ෂි රෝග, වාත රෝග පිළිබඳ විශේෂඥ දේශීය වෛද්‍යවරයෙක්. එතුමාගේ සුවිශේෂී දක්ෂතාව ඒ වාගේම විශේෂඥතාව ප්‍රකට කළ අක්ෂි රෝගවලට ප්‍රතිකාර කිරීමේදී, බෙහෙත් වට්ටෝරු අත්හදා බැලීමට තමන්ගේම ඇස් යොදා ගත් බව ප්‍රකට මතයක්. වුවිට් රෙද්ද ඇඳ, කෝට් එක පැළඳ, හිසේ නැමි පනාව ගසා ඉහළ සමාජයන් අතිශය සමාජශීලී ලෙස නියෝජනය කළ මෙතුමාගේ නම කියන විට නිතර සිහිවන්නේ ගම්පෙරළිය නව කථාවේ එන කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ රූපකායයි.

ආරෝහපරිනාහ ප්‍රාංශු දේහධාරී පුද්ගලයකු වූ මෙතුමා කැපී පෙනෙන පෞරුෂයක් හිමි පුද්ගලයෙක්; සිත් ගන්නා සුළු හැසිරීම් රටාවක් ප්‍රගුණ කළ පුද්ගලයෙක්; 1976 සිට 1994 දක්වා සමස්ත ලංකා විෂ වෛද්‍ය සම්මේලනයේ ගරු සභාපති ධුරය හොබවමින් දේශීය වෙදකමට අනුපමේය මෙහෙයක් කළ දේශීය පාරම්පරික වෛද්‍යවරයෙක්. 1987 දී ජනාධිපති විද්‍යානිධි නාමධාරී සම්මානයෙන් පුද ලැබීම තම උපශාන්ත හා නිහතමානී ගුණය තවත් වර්ධනය කර ගැනීමට හේතු කර ගත්තා. ගැමි ව්‍යවහාරයේ එන නොයෙක් යෙදුම් හා භාෂා රීති පිළිබඳ හසළ දැනුමක් තිබූ මෙතුමා බස අතිශයින්ම වියත් ලෙසත්, සංවේදී හා උපහාසාත්මක ලෙසත් හැසිරවීමේ ලා දැක්වූයේ මහා පරිචයක්.

පාරම්පරික සිංහල වෛද්‍යවරයකු තුළ තිබෙන උපහාසය හා සිත්ගන්නා සුළු කථා විලාසය මෙතුමාගේ සෑම ක්‍රියාවකම, ජීවිතේ සෑම අවස්ථාවකම මොනවට ප්‍රකාශ වුණාද කියන එක පැහැදිලියි. 1989 ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට පත් වූ මෙතුමා කිසි දිනෙක දේශපාලනඥයෙකු ලෙස ක්‍රියා කළේ නැහැ. මෙතුමා සෑම විටකම ප්‍රකට කළේ පෙරදිග ඍෂි ගුණෝපේත සුපසං වෛද්‍යවරයෙකුගේ භූමිකාවයි. 1993 දක්වා පාර්ලිමේන්තුවේ ගත කළ මෙතුමා, ඉන් අස්වී ජනාධිපති දේශීය වෛද්‍ය උපදේශක ලෙස කටයුතු කළා.

ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිට වූ පසු එහි පළමු කොමසාරිස් ලෙස පත් වූයේ මෙතුමාගේම සොහොයුරු වූ ප්‍රවීණ සිවිල් නිලධාරියෙකු වූ ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මහතායි. මෙම දෙසොහොයුරන් අපේ පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට කරන ලද මෙහෙය අතිමහත්. එය අපි සිහි කරන්නේ අතිමහත් කෘතවේදීත්වයෙන් යුතුවයි.

අපේ දේශයේ මෑත ඉතිහාසයේ අතිශය තීරණාත්මක අවස්ථාවලදී දේශයට නව යුගයක්, නව ගමන් මාර්ගයක් උදා කිරීමට දේශයේ දේශපාලන, සමාජ, ආර්ථික ගමන් මඟේ මං සන්ධියක් සනිටුහන් කිරීමට ඉහළම පරිත්‍යාග කරන ලද්දේ

දේශීය වෛද්‍යාවරුනුයි. එම අවස්ථාව මා සිහි කරන්නේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අතිශය ගෞරව බහුමාන පෙරදැරිවයි. ඉන් පළමු අවස්ථාව වන්නේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැති ධුරයට පත් කිරීම සම්බන්ධවයි. බණ්ඩාරනායක ඝාතනයෙන් පසුව, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පාර්ලිමේන්තුවට ගෙන යා යුතු වුණා. එතුමිය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කළ නොහැකි වුණා. එතුමිය සෙනෙට් සභාවට - උත්තර මන්ත්‍රී මණ්ඩලයට- ගත හැකිව තිබුණා. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා තම තනතුර පරිත්‍යාග කළේ, ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍යාචාර්යතුමායි; ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය ඍෂිවරයායි. එම පරිත්‍යාගය මේ රටේ අතිශය තීරණාත්මක, අගය නිම්හිම් නැති අති උතුම් පරිත්‍යාගයක්. ඒ වාගේම දේශීය වෛද්‍ය ගුණෝපේත අති උතුම් පරිත්‍යාගයක්.

දෙවන අවස්ථාව, අපි අද අතිශය ගෞරව බහුමානයෙන් සිහි කරන ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍ය ඍෂිතුමා කරන ලද පරිත්‍යාගයක්. 1993 දී අනුර බණ්ඩාරනායක මැතිතුමාට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවශ්‍ය වුණා. නමුත් මන්ත්‍රී ධුරයට තේරී පත් නොවූ එතුමා පත් කළ මන්ත්‍රීවරයකු ලෙස නම් කිරීමට අවශ්‍ය වුණා.

අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ඒ සඳහා කෙනෙකු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස් විය යුතුයි. එහිදී ඒ සඳහා ඉදිරිපත් වුණේ මෙම ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමායි. එතුමා තම ධුරයෙන් ඉල්ලා අස් වී තම අසුන අනුර බණ්ඩාරනායක මහතා වෙත පරිත්‍යාග කළා. එතුමා මන්ත්‍රී ධුරය පරිත්‍යාග කළා පමණක් නොවෙයි. එතුමාට මන්ත්‍රී විශ්‍රාම වැටුප හිමිවීමට තිබුණේ තවත් මාස තුනක පමණ මන්ත්‍රී ධුර කාලයක්. නමුත් එතුමා මන්ත්‍රී විශ්‍රාම වැටුපට ලෝභ නොවී, විශ්‍රාම වැටුපත් පරිත්‍යාග කරමිනුයි එම ශ්‍රේෂ්ඨ පරිත්‍යාගය කරන ලද්දේ. එම නිසා මෙම පරිත්‍යාගශීලීත්වයට උපමා හෝ සමාන කිරීම් නැහැ. දේශීය වෛද්‍යවරුන් ජන්ම උරුමයෙන් ලබන අති උතුම් මානවීය ගුණයක් වන පරිත්‍යාගශීලීත්වයයි ඔවුන් එදා දේශයට පමණක් නොව ලොවටම ප්‍රකාශ කළේ. මුදලේ සුළු අඩුවක් වෙතොත් ශල්‍යාගාරයට - operating theatre එකට- ගෙන යන මරණාසන්නම ලෙඩා ආපසු වාට්ටුවට යවන වෛද්‍යාවරුනුත් අපේ රටේ සිටිනවා. තම මහේශාක්‍ය තනතුර පමණක් නොවෙයි විශ්‍රාම වැටුපත් පරිත්‍යාග කරන දේශීය වෛද්‍යවරු මේ රටේ සිටින බවයි ඔවුන් එදා අපට මේ කටයුත්තේදී ප්‍රකට කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහිදී සිහිපත් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. එනම්, මේ වෛද්‍යාචාර්යතුමා තම තනතුරෙන් ඉල්ලා අස්වන විට කරන ලද ප්‍රකාශයයි. මම මේ ප්‍රකාශය ගැන දැන ගත්තේ එතුමාගේ පුත්‍රයාගෙනුයි. "ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවමින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය රාජ්‍ය අනුග්‍රහය ලැබිය යුතු විෂය ක්ෂේත්‍රයක් බවට පත් කළේ 1956 බණ්ඩාරනායක රජයෙන්. සඟ, වෙද, ගුරු, ගොවි කම්කරු යන පංච මහා බලවේගයන්ගේ සංසයාට පමණක් දෙවෙනි වන බලවේගය ලෙස දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ඔසවා තැබුවේ, එය බලවේගයක් කළේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්. අනුර බණ්ඩාරනායක යනු එතුමාගේ පුත්‍රයාණන්. මම ඉල්ලා අස්වන්නේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට කරන ලද අති උත්කෘෂ්ට හා අගනා මෙහෙයට කෘතවේදී වීමක් ලෙසයි." කියා එතුමා ප්‍රකාශ කරලා තිබුණ බව අපට දැන ගන්න ලැබුණා.

ලෝකයේ අතිශය දුර්ලභ හා අති උත්තම පුද්ගලයන් හතර දෙනෙක් ගැන බුද්ධ දේශනාවේ සඳහන් වෙනවා. ඉන් එක් අයෙක් කෘතඥ, කෘතවේදී පුද්ගලයෝ. මෙම වෙද මහතා එවැනි ලොව දුර්ලභ ගණයේ අති ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. ඒ තමන්ට පෞද්ගලිකව කරන ලද කාර්යයට කෘතවේදී වීමෙන් නොවෙයි. තමන්ගේ දේශයේ ජනතාවගේ සෞඛ්‍ය සංරක්ෂණය කළ මහා විෂය ක්ෂේත්‍රයට දක්වන ලද සැලකිල්ලට එතුමා කෘතවේදී වූයේ තම ජීවිතයේ ඉහළම තනතුරු හා මූල්‍ය ප්‍රතිලාභ අත් හැරීමෙන්. දේශයේ සෞඛ්‍ය සංරක්ෂණයේ පුරෝගාමියා ලෙස දේශීය ආයුර්වේදය ගොඩනැඟී බැබළෙන මතු දිනෙක මෙතුමාගේ නාමයට සකල දේශයම බැති බර වනු ඇත. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එහි සියලු අංශයන්හි ශෝකය හා කනගාටුව දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ලෙස මම එම පවුලේ සියලු දෙනාට ප්‍රකාශ කර සිටිමි. එතුමාට නිවන් සුව අත් වේවා!

[අ.භා. 3.29]

**ගරු ජෝන් අමරතුංග මහතා**

(மாண்புமிகு ஜோன் அமரதுங்க)

(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපි ශෝකය ප්‍රකාශ කරන්නේ කාලයක් පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ රටට ඉමහත් සේවයක් කළ මහා වෙදදුරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ කීර්තිමත් ආයුර්වේද වෛද්‍යවරයෙකු වූ විද්‍යාවේදී ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා දේශීය වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 50ක කාලයක් ඒ වෛද්‍ය ක්ෂේත්‍රය තුළින් මෙරට ජනතාවගේ සහ රෝගීන්ගේ සුවය ගැන සලකා කටයුතු කළ පුද්ගලයෙක්. ඒ නිසාම එතුමාගේ සමාජ සේවය තුළින් අවුරුදු 95ක් ජීවත් වීමට එතුමාට වාසනාව ලැබුණා. එතුමාගේ තිබූ ජනප්‍රියතාවත්, ඒ වාගේම එතුමාගෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට වෙච්ච සේවාවත් හොඳහැටි දැන ගත්ත හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඒ ක්ෂේත්‍රය නියෝජනය කරන්න ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාව පත් කළා. ඒ කාලයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කල්පනා කරලා ජාතික ලැයිස්තුව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළේ මැතිවරණවලට ඉදිරිපත් වෙන්න අකැමැති, විවිධ ක්ෂේත්‍රවල නිපුණත්වය දරන පුද්ගලයන්ගෙන් කොටසක් මේ සභාවට පත් කරලා ඒ අයගේ දැනීම, ඒ අයගේ උගත්කම තුළින් රටට යම් කිසි ප්‍රයෝජනයක් ලබා ගන්නයි.

එහෙම පුද්ගලයෙක් තමයි වෛද්‍ය ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා. ඔහු මන්ත්‍රීවරයෙක් හැටියට බොහොම ගාම්භීර ලෙස තමයි මේ සභාවේ වාඩි වෙලා සිටියේ. නමුත්, කථා කරලා බැලුවාම කුඩා ළමයෙක් වාගෙයි. ඒ තරම් යහපත් මන්ත්‍රීවරයෙක්. අපි හැමෝම අපේ වාද විවාද ඉවර වෙලා Lobby එකේ ඉන්න කොට එතුමාව වට කර ගන්නවා. එතුමා පුදුම කථා කියන්නේ. ඒවා මේ සභාවේ කියන්නත් බැහැ. නමුත්, ඒවා කිව්වේ හිතවත්කමට, මිත්‍රත්වයට, අපත් එක්ක තිබුණු සම්බන්ධකමට. අපි ඉතින් එතුමාගෙන් අහනවා, අහවල් අහවල් ලෙඩවලට ගන්න පුළුවන් බෙහෙත් මොනවාද කියලා. එතුමා ඒ හැම දෙයකටම අපට උපදෙස් දුන්නා. එතුමා වටිනා මන්ත්‍රීවරයෙක් කියලා මම කිව්වේ ඒ නිසායි.

එතුමා මේ සභාවෙන් අස් වුණා කිව්වාම අපි බොහොම කනගාටුවට පත් වුණා. විශේෂයෙන්ම එතකොට අපි පසු පෙළේ හිටියේ. අපි හොඳ සම්බන්ධකමකින්, මිත්‍රත්වයෙන් තමයි එතුමාව ආශ්‍රය කළේ. එතුමාගෙන් ආයුර්වේද ක්ෂේත්‍රයට සිදු වුණු සේවාවන් පිළිබඳව බිඳක් අපට මේ අවස්ථාවේදී මතක් වනවා.

1989 පෙබරවාරි 25 වැනිදා "දිනමිණ" පත්‍රයේ පළ වූ ලිපියක එතුමා පිළිබඳව සඳහන් වූ කරුණු කීපයක් මා මතක් කරන්නම්:

[ගරු ජෝන් අමරතුංග මහතා]

"ඔහුගෙන් දේශීය රෝගීන් මෙන්ම විදේශීය රෝගීන්ද ප්‍රතිකාර ලබා ගෙන ඇත."

ඒ තරම් ප්‍රසිද්ධියක් ලැබුවා. ඒ වාගේම තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"ඇතැම් විට බටහිර වෛද්‍ය ක්‍රමය අනුව සුව කළ නොහැකි රෝගීන් රැසක්ද සුවපත් කර ඇත."

අද එම ශාස්ත්‍රය දන්නා අයගෙන් ඉතිරි වෙලා ඉන්නේ ටික දෙනයි. එසේ හිටපු අයගෙන් එක්කෙනෙක් තමයි ආයුර්වේද වෛද්‍ය ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා. ඒ වාගේම තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"වරෙක පිළිකා වැනි රෝගීන්ද සුව කර තිබේ."

බෙහෙත් නැතිව පිළිකා රෝගීන් මිය යන වෙලාවේ, එතුමා එවැනි පිළිකා රෝගීන්ට සාත්තු කරලා තිබෙනවා. ඒ වාගේම තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"කථා කළ නොහැකි රෝගීන් මෙන්ම පණ අදිමින් සිටින අසාධ්‍ය රෝගීන්ද ඔහුගේ සුරතින් සුවපත් වී ඇත."

එතුමා පුදුම විධියට දක්ෂකම් පෑවා. කොයි විධියටද වෛද්‍ය ක්ෂේත්‍රය තුළින් මනුෂ්‍යත්වයට එතුමාගෙන් සේවයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ කියලා එතුමා කල්පනා කළා. ඒ වාගේම තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"ප්‍රනාන්දු වෙද මහතාගේ දක්ෂභාවයත්, මුකරි බවත්, නැණ නුවණත් නිසා ඔහු ආයුර්වේදයේ ඕනෑම අංශයකට අත්‍යවශ්‍ය පුද්ගලයකු බවට පත්ව සිටී."

ඒ නිසා ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ එවකට ඔහු නැතිවම බැරි පුද්ගලයෙක් වුණා විශේෂයෙන්ම ඔහුගේ තිබුණු දක්ෂකම් හා හැකියාවන් නිසා. ඒ වාගේම තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"ඔහු ආයුර්වේදයේ ඕනෑම අංශයකට අත්‍යවශ්‍ය පුද්ගලයකු බවට පත්ව සිටී. ඔහු සමස්ත ලංකා එක්සත් වෛද්‍ය සම්මේලනයේ සභාපතිවරයාය. ශ්‍රී ලංකා වෛද්‍ය මහා මණ්ඩලයේ සභාපතිය. ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය, දේශීය වෛද්‍ය විද්‍යායතනයේ පාලක සභාව, ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ශිල්පීය කමිටුවේ ආදී මණ්ඩල රැසෙක සාමාජිකයෙකි."

ඒ නිසා අපට පෙනුණා, එතුමාට ඒ ක්ෂේත්‍රය තුළ මොන විධියේ පිළිගැනීමක් තිබුණාද කියලා. ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වුවද, වෘත්තීයමය වශයෙන් එතුමාගේ පළපුරුද්ද හා දක්ෂකම එතුමා දිගටම පවත්වාගෙන ගියා. ඒ නිසා අපි දකින දෙයක් තමයි විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ ඇතැම් වෛද්‍යවරුන්ගේ අභාවයත් සමඟ ඒ අයගේ දැනුවත්කම, එහෙම නැත්නම් දැන ගෙන සිටි විශේෂ වෛද්‍ය වැඩ පිළිවෙළවල් ඒ සමඟම අභාවයට පත් වීම. මෙතැනදීත් එක වෙලාවකට මම කල්පනා කරනවා, එය එසේම වුණාද කියන එක. ඒ නිසා ඔහුගේ අභාවය මේ රටට විශාල පාඩුවක්.

එපමණක් නොවෙයි, සිංහලකම පෙන්නුම් කරපු ඒ ශ්‍රේෂ්ඨ පුද්ගලයාගේ අභාවය එක්සත් ජාතික පක්ෂයට -අපේ පක්ෂයටත්- විශාල පාඩුවක්. අපේ නායකතුමා ඒ පිළිබඳව බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා. එතුමාගේ පෙළපත ගැනත්, ඒ වෙලාවේ අපේ පක්ෂයේ අවශ්‍යතාව මත මන්ත්‍රීකම පරිත්‍යාග කරලා අනුර බණ්ඩාරනායක මැතිතුමාට එන්න අවස්ථාව සලසා දුන් ආකාරය ගැනත් එතුමා පැහැදිලි කළා. මේවා තමයි විශේෂ ගුණාංග. මේ වාගේ ශෝක ප්‍රකාශ කරන කොට අපි මේවා සිහිපත් කරන්නට ඕනෑ.

අද එතුමාගේ පවුලේ විශාල පිරිසක් මේ ගරු සභාවේ සිටිනවා. එතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේ අප සියලු දෙනාම කනගාටු වෙනවා. එතුමාට අවුරුදු 95ක් පමණ ජීවත් වීමේ වාසනාව ලැබුණා. නමුත් එතුමා නැති වීම ගැන අප කනගාටු වන අතර, අපේ පක්ෂයේ ශෝකයත්, පෞද්ගලිකව අපගේ කනගාටුව, ශෝකයත් මේ අවස්ථාවේ එතුමාගේ පවුලේ සියලු දෙනා වෙත පිළිගන්වන අතර, බෞද්ධාගමික කටයුතු බොහොම ඉහළින් කරපු පුරවැසියකු හැටියට එතුමාට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තූතියි. මීළඟට ගරු කරු ජයසූරිය මහතා.

[අ.භා. 3.38]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දිවංගත වෛද්‍යාචාර්ය ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් දීර්ඝ විවරණ කිහිපයක් මේ සභාවේ දී සඳහන් වුණා. ගරු සභානායකතුමා, විපක්ෂ නායකතුමා, දේශීය වෛද්‍ය අමාත්‍යතුමා, ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලු දෙනා විසින්ම අපේ දිවංගත ගරු මන්ත්‍රීතුමා විසින් කරපු විශිෂ්ට සේවාව සම්බන්ධයෙන්, එතුමාගේ කීර්තිමත් චරිතාපදානය සම්බන්ධයෙන් දීර්ඝ විවරණයන් කළා. ඒ නිසා කාලය සීමා වී ඇති බැවින් ඒ කරුණු ගැන මම නැවත කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා මේ පාර්ලිමේන්තුවට පත් වුණු බොහොම දුර්ලභ ගණයේ මහජන නියෝජිතවරයෙක්. එතුමා තුළ තිබුණ උතුම් ගුණාංග ගැන මීට ඉහතින් සඳහන් වුණා. මට මතකයි, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සමඟ ඉතාම කිට්ටුවෙන් සම්බන්ධතාවක් ඇති කර ගත්තා වාගේම, ඒ අවස්ථා බොහොමයකදී මට එතුමාව හමු වීමේ අවස්ථාව, එතුමා දැන ගැනීමේ අවස්ථාව, එතුමා සමඟ කථා කරලා එතුමාගේ අදහස් දැන ගන්නට, එතුමාගේ විශිෂ්ට බුද්ධිය ගැන හඳාරන්නට අවස්ථාව ලැබුණා. ඒ වාගේම එතුමාට දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් පරම්පරා හතරක, පහක අතීතයක් තිබුණා.

දේශීය වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් කීර්තිමත් වෙද පරපුරකින් ආපු කෙනෙක්. ඒ පරපුරේ හැම දෙනාටම මෙන්ම, එතුමාටත් අත්ගුණය තිබුණාය කියලා මම අහලා තිබෙනවා. ඒ වාගේම එතුමා කීර්තිමත් වෛද්‍යවරු බිහි කර තිබෙනවා. එතුමා පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයකුගේ ගෞරවය ආරක්ෂා වන විධියට ක්‍රියා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම වසර 2500ක් ඉක්ම වූ අපේ ඉතිහාසය තුළ හෙළ වෙදකම පිළිබඳව ඇත්තේ ගෞරවණීය වූත්, විශිෂ්ට වූත් පිය සටහන්. එදා හෙළ වෙදවරුන් වෙදකම වෘත්තියක් ලෙස නොවෙයි සැලකුවේ, සේවාවක් ලෙසයි. අන්න ඒ විධියේ මහා හෙළ වෛද්‍යවරයෙක් වශයෙන් තමයි අපි ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා හඳුන්වන්නේ. එදා එතුමාට තිබුණ සැලකිල්ල, ගෞරවය නිසාත්, මුළු වෛද්‍ය ක්ෂේත්‍රයටම ගෞරවයක් වශයෙන් පිළිගත් නිසාත් තමයි රණසිංහ ප්‍රේමදාස මැතිතුමා එදා එතුමා පත් කළ මන්ත්‍රීවරයකු වශයෙන් පත් කළේ.

පාරම්පරික වෙදකම සුරතින් දරා ගත් මේ ජීවකයාණන් පැරණි සිංහල ක්‍රමයේ ලක්ෂණයන්ට උරුමකම් කිව්වා. සුදු රෙද්දත් කෝට් කබායත් ඇඳ කුඩා කොණ්ඩයක් බැඳි මෙතුමා තුළින් අව්‍යාජ සිංහල ගැමියකුගේ ස්වරූපය දිස් වුණා.

මම කලින් කී පරිදි එතුමා සුප්‍රසිද්ධ වෙද පරම්පරාවකින් පැවැත එන කෙනෙකු හැටියට දේශීය වෛද්‍ය ක්‍රම කාලීනව ගැළපෙන සේ පරිවර්තනය කරමින් එය ප්‍රගුණ කළා. ඒ වාගේම දේශීය වෛද්‍ය විද්‍යාව හා ආයුර්වේදය පිළිබඳව විශාරදයකු වූ එතුමා ආයුර්වේද පර්යේෂණාගාරයේ උපදේශකවරයකු වශයෙන්ද සේවය කළා. දේශීය වෛද්‍ය විද්‍යාලයේ සහ බොරැල්ල ආයුර්වේද රෝහලේ බාහිර කථිකාචාර්ය පදවියක්ද එතුමා දැරුවා.

එතුමාගේ ගතිගුණ නිසා ස්වභාවයෙන්ම එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර ජනප්‍රිය වුණා. බොහොම ආදරයෙන් එතුමාව හැඳින්වුයේ "අපේ කොණ්ඩ වෙද මහත්මයා" කියලායි. ජනතාවත් ඒ ආදර නාමයෙන් තමයි එතුමාව හැඳින්වූයේ. එතුමා ජනතාව අතර අතිමහත් ජනප්‍රියතාවට පත් වුණා. ඒ වාගේම ජනතාව තුළත් එතුමා කෙරෙහි ප්‍රසාදයක් තිබුණා.

මං මීට කලින් සඳහන් කළ පරිදි එතුමාගේ ප්‍රතිකාර තුළින් සුවය ලබා ගත්තේ අපේ රටේ රෝගීන් පමණක් නොවෙයි. විදේශ රටවල රෝගීන් බොහොමයකුත් එතුමාගේ ප්‍රතිකාරවලින් සුවය ලබා ගෙන තිබෙනවා. ඒ නිසා එතුමා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙනුත් ප්‍රසිද්ධියට පත් වුණා. එතුමා කීර්තිමත් වෛද්‍යවරයකු වශයෙන් මම සඳහන් කරන්නට කැමැතියි. පිළිකා, සන්නි, සුව කරන්නට බැරි දුර්ලභ ගණයේ රෝග බොහොමයක් එතුමා සුව කළ බව අපි දන්නවා. කීප අවස්ථාවකදීම හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා එතුමාගේ හැකියාවන් ගැන අප සමඟ කියා තිබෙනවා. එතුමා සැම විටම මහජනතාව සමඟ ජීවත් වුණු මහජන මන්ත්‍රීවරයෙක්. එතුමා වෙදකම් කළේ මුදල් බලා ගෙන නොවෙයි. එතුමා වෙදකම් කළේ සමාජ සේවයක් වශයෙනුයි. පුරා දශක පහකට වැඩි කාලයක් රෝගීන් දහස් ගණනක් සුවපත් කිරීමට සමත් වූ මේ මහා වෙදැදුරන් තම දේශපාලන ගමන් මඟේදීත් -එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කළ වසර හතරයි මාස අටක කාලය තුළත්- දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් කරපු සේවාව අපට මේ අවස්ථාවේදී අමතක කරන්නට බැහැ.

දිවංගත ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමා හොඳ බෞද්ධයෙක්. එතුමා පන්සල් සමඟ, ආගමික ස්ථාන සමඟ, මහානායක ස්වාමීන් වහන්සේලා ඇතුළු මහා සංඝ රත්නය සමඟ ඉතාමත්ම කිට්ටු සම්බන්ධතාවක් පැවැත්තුවා. එතුමා නිලතල දරපු විහාරස්ථාන බොහෝ ගණනක් තිබෙනවා. ඒ විහාරස්ථානවලට එතුමා ආධාර උපකාර කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා හොඳ ආදර්ශවත් පවුල් ජීවිතයක් ගත කළා. එතුමාගේ බිරිඳ සෝමා වීරසිංහ මැතිනිය නිතරම එතුමා පිටුපස සිටිමින් එතුමාට ශක්තියක් වුණා. නව දෙනකුගෙන් යුත් හොඳ කීර්තිමත්, වාසනාවන්ත දරු පරපුරක් එතුමා සමාජයට බිහි කළා. වෛද්‍ය සේවාව වාගේම විවිධ ක්ෂේත්‍රවල සේවය කරමින් තම පියාගේ ගෞරවය, කීර්ති නාමය ආරක්ෂා කරමින් ඒ දරුවන් කටයුතු කරනවා. එතුමාගේ සහෝදරයා වන ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු දිසාපතිතුමා ඇතුළු එතුමාගේ පවුලේ අනෙකුත් සාමාජිකයන් මේ රටට විශාල සේවාවක් කළා. ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා ආදර්ශවත් රාජ්‍ය සේවකයකු වශයෙන් කීර්තිමත් නමක් දිනා ගෙන කටයුතු කළා.

මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ ශෝකයත්, ඒ වාගේම මාගේ පෞද්ගලික ශෝකයත් එම මැතිනියට, දරුවන් ඇතුළු පවුලේ සියලුම ඥාතිවරුන්ට පිරි නමමින් දිවංගත ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමාට -අපේ ගරු මන්ත්‍රීතුමාට - අජරාමර නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.46]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දැන හැඳින ගෙන සිටි ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමාගේ අභාවය ගැන අපේ කනගාටුව ප්‍රකාශ කිරීම සඳහා මේ අවස්ථාවේදී වචන කීපයක් කථා කළ යුතු යයි මම කල්පනා කරනවා.

ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමා පාර්ලිමේන්තුවේ කෙටි කාලයක් පමණක් සේවය කළත්, මේ ලංකාවේ ඉතාම හොඳ නමක්, කීර්තියක් දිනා ගෙන තිබුණු ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයෙක් හැටියට අපට එතුමාව හඳුන්වා දෙන්න පුළුවන්. අපට සමීපවම මතක් වන එක් කාරණයක් තමයි, එක් අවස්ථාවක තමාගේ තනතුර අනුර බණ්ඩාරනායක මැතිතුමාට පරිත්‍යාග කිරීම. ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා තමාගේ නිස්සරණාධ්‍යාශය ඉතාම හොඳට ප්‍රදර්ශනය කළ අවස්ථාවක් එය. එතුමා හැම දේ ගැනම බුද්ධිමත්ව කල්පනා කර හොඳ මධ්‍යස්ථභාවයකින් කටයුතු කළා. සිංහල වෙදකම -ආයුර්වේද වෙදකම- ගැන හොඳ දැනුමක් එතුමාට තිබුණා. එතුමා කවදාවත් ඒකෙන් මුදල් හම්බ කරන්න හිතුවේ නැහැ. හැම වෙලාවේම එතුමා ළඟට ආපු ඕනෑම ලෙඩෙකුට කරුණාවන්තව සැලකුවා. ඉතාම දක්ෂව සහ දැනුවත්කමින් යුතුව ඒ ප්‍රතිකාර කළා.

මම ගොඩාක්ම එතුමාව හඳුනා ගත්තේ එතුමාගේ සහෝදරයා වූ ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා මහනුවර දිසාපති වෙලා සිටි කාලයේ මම අතිරේක දිසාපති හැටියට කටයුතු කළ නිසායි. ඒ කාලයේ ඒ පවුලේ අයත් එක්ක මම නිතර සම්බන්ධ වුණා. ඒ සියලු දෙනා තුළම අපේ රට ගැන තිබෙන ආදරය සහ අපේ ගැමි සමාජයට සේවයක් කිරීමට තිබෙන උනන්දුව මම පෞද්ගලිකවම දැන ගත්තා.

අද මම එතුමාට ගෞරවයක් හැටියට තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. අපේ රටේ ඉතාම වැදගත් සිද්ධියක් වූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ ඝාතනය ගැන කථා කරන කොට ඒ කාලයේ එතුමා සිදු කළ ඒ කාර්ය භාරයත් අපට කල්පනා කරන්න සිද්ධ වනවා. මොකද, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා අගමැති වුණාට පස්සේ ආයුර්වේදය දියුණු කරන්න විශාල උනන්දුවක් ගත්තා. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන ඒ පංච මහා බලවේගයේ "වෙද" කියන අංශය දියුණු කරන්න එතුමා ලොකු උනන්දුවක් ගත්තා. ඒ සඳහා තෝරා ගත්තේ අපේ ප්‍රනාන්දු වෙදැදුරුතුමාගේ සහෝදරයා වූ ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමායි.

ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා සහ ඒ කාලයේ ලංකාවේ සිටි ප්‍රසිද්ධම පුද්ගලයකු වූ -පුවත් පත් නායකයා කියලා කියන්න පුළුවන්- ඩී.බී. ධනපාල මැතිතුමා අතර ඉතාම කිට්ටු සම්බන්ධයක් තිබුණා. ඒ දෙදෙනා කටයුතු කළේ සහෝදරයෝ දෙන්නෙක් වාගේයි. එම නිසා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා,

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමාව පළමුවැනි ආයුර්වේද කොමසාරිස් හැටියට පත් කළා. ඒ අවස්ථාවේ සෞඛ්‍ය ඇමතිනිය හැටියට වැඩ කළේ විමලා විජේවර්ධන මැතිනියයි. ඒ දෙන්නාගේ අදහස් වෙනස් වුණා. ඒ කියන්නේ ඇමතිතුමිය ආයුර්වේදය ගැන සෝමාරාම හිමි වැනි අය සමඟ අදහස් ප්‍රකාශ කරන වෙලාවේ ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමා, ඩී.බී. ධනපාල මැතිතුමා සහ විශේෂයෙන්ම ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මැතිතුමාගේ සහෝදරයා වන ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෙදැදුරුතුමා ඊට වඩා නූතන ක්‍රමයකට, ඊට වඩා බුද්ධිමත් ක්‍රමයකට මේ ආයුර්වේදය ඉදිරියට ගෙන යන්න පිඹුරු පත් හැදුවා.

ආයුර්වේද ශාස්ත්‍රයේ සුප්‍රසිද්ධ කෙනකු වන "ෂර්මා" නමැති කෙනකු ඉන්දියාවෙන් ගෙනැල්ලා ආයුර්වේද සංස්ථාව හදලා, ආයුර්වේද මධ්‍යස්ථානයක් හදලා කටයුතු කරන්න බලාගෙන ඉන්න කොට තමයි විමලා විජයවර්ධන මැතිනියත් එක්ක නොයෙක් විධියේ ගැටුම් ඇති කර ගත්තේ. ඒ වෙලාවේ එතුමිය බණ්ඩාරනායක අගමැතිතුමා ගාවට ගිහිල්ලා මේ ප්‍රනාන්දු දෙපොළගේ කැප වීම ගැන සහ ධනපාල මහත්මයාගේ බලය ගැන විවේචනය කළා. "මට ඕනෑ විධියට වැඩ කරන්න දෙන්නේ නැහැ. ආයුර්වේදය පිළිබඳව ඒ ගොල්ලන්ගේ තිබෙන දර්ශනය තමයි ක්‍රියාත්මක කරන්නේ" යනාදී වශයෙන් බණ්ඩාරනායක මැතිතුමාට දුක්ගැනවිලි ඉදිරිපත් කළා. එතුමා ඒවා පිළි ගත්තේ නැහැ. එතුමා වඩාත් පිළිගත්තේ ධනපාල මහත්මයා, ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු සහ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු කියන තුන් දෙනාගේ කැප වීම සහ අදහස්. බණ්ඩාරනායක අගමැතිතුමාත්, විමලා විජයවර්ධන සෞඛ්‍ය ඇමතිනියත් අතර මුල් ගැටුම පටන් ගත්තේ ඔන්න ඔය ආයුර්වේද ප්‍රශ්නය උඩයි. ඒ ගැටුම හුඟක් දුරට වර්ධනය වෙලා තමයි කුමන්ත්‍රණයක් ඇති වෙලා අවසානයේදී ඉතාම දුක්ඛදායක විධියට, කනගාටුදායක විධියට අගමැතිතුමා ඝාතනයට ලක් වුණේ. ඉතින් ඒ දවස්වල ඩබ්ලිව්.ජේ. ප්‍රනාන්දු මහතා මට කියලා තිබුණු ඒ කරුණු මම හැන්සාඩ් වාර්තාවේ හෝ සටහන් කරලා තියන්න ඕනෑ. මොකද, ඒක වැදගත් වෙනවා. ලංකා ඉතිහාසයේ මේ ගැටුම නොයෙක් නොයෙක් හේතු නිසා තවත් වර්ධනය වුණා. නමුත් ඒ ගැටුමට මුල් වුණේ මේ කාරණාවයි. සෞඛ්‍ය අමාත්‍යාංශය තුළයි ඒ කාලයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව තිබුණේ. ඒ දෙපාර්තමේන්තුවේ නිලතල, බලතල ආදිය ගැන තිබුණු ගැටුම් වර්ධනය වෙලා තමයි අවසානයේ අගමැතිතුමාගේ ඝාතනය සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප මතක තියා ගන්න ඕනෑ, එතුමාගේ කාර්ය භාරය ලංකා ඉතිහාසයට බද්ධ වුණු දෙයක් බව. එතුමන්ලා නූතන ආයුර්වේද ක්‍රමය ඉගැන්වීම, ප්‍රගුණ කිරීම ගැන හොඳ ප්‍රගතිශීලී අදහස් දරපු නිසාත්, ඒ කාලයේ හිටපු ගරු අගමැතිතුමා ඒකට සහයෝගය දුන්නු නිසාත් තමයි විමලා විජයවර්ධන මැතිනිය, බුද්ධ රක්ඛිත හිමි සහ සෝමාරාම හිමි ඇතුළු ඒ කල්ලිය එතුමා කෙරෙහි විශාල තරහක්, වෛරයක් ඇති කර ගත්තේ. මේ ආයුර්වේද ප්‍රශ්නය තමයි ඒ කුමන්ත්‍රණය දක්වා ගියේ. මේක පළමුවැනි වතාවටයි අපි හෙළිදරවු කරන්නේ. නමුත් දැන් කාලය ගෙවී ගොස් තිබෙන නිසා අපි ඒවා කොතැන හෝ සටහන් කරලා තියන එක වටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මට කියන්න පුළුවන් අපේ ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෙදැදුරුතුමා ඉතාම ප්‍රතිපත්තිගරුක කෙනකු බව. එතුමා තමන්ගේ ශාස්ත්‍රය ඉතාම වග කීමෙන් ඉගෙන ගෙන කටයුතු කළා. එතුමාගේ වෛද්‍යාගාරය තිබුණේ දෙහිවල. එතැනට එන හැම කෙනාටම ඉතාම හොඳට ප්‍රතිකාර කළා. මා හිතන විධියට හුඟ දෙනකුගෙන් සල්ලි ගත්තේත් නැහැ. ඒ කාලයේ හිටපු වික්‍රමාරච්චි වෙදැදුරුතුමා ඒ වාගේම නුවර ප්‍රදේශයේ ජයසිංහ වෙදැදුරුතුමා සහ ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා වැනි ඒ ශාස්ත්‍රීය පියවරුන් මේ රට වෙනුවෙන් විශාල පරිත්‍යාගයක් කරලා තියෙනවා; විශාල සේවයක් කරලා තිබෙනවා. ඒක අපි මතක තියා ගන්න ඕනෑ.

අවසාන කාලයේදී එතුමා ගරු ආර්.ප්‍රේමදාස මැතිතුමා එක්ක ඉතාම ළඟින් ඇසුරු කළා. එතුමන්ලා මිත්‍රයින් වුණා. ඒ මිත්‍රකම මුල් කරගෙන තමයි එතුමාට ආරාධනා කළේ, මේ ගරු සභාවේ නම් කරන ලද මන්ත්‍රීවරයකු හැටියට අසුන් ගන්නා ලෙසට. එතුමා ඉතාම හොඳට ඒ කටයුතුත් කළා. ආයුර්වේද ප්‍රශ්න, දේශීය සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්න, සංස්කෘත දැනුම පිළිබඳ ප්‍රශ්න හා අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්න මතු වුණු හැම වෙලාවේම එතුමා මැදිහත් වෙලා ඉතාම සාරගර්භ ලෙස මේ සභාවේ කථා කළා. ඊට පස්සේ තමයි ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමාට යම් කිසි සහයෝගයක් වශයෙන් එතුමා ඉල්ලා අස් වෙලා ඒ ආසනය භාර දුන්නේ. ඒ අවස්ථාවේදී එතුමා කථාවක් කරමින් -පුවත් පත්වල පළ වුණා මට මතකයි- මතක් කළා, බණ්ඩාරනායක පවුලත් එක්ක එතුමාගේ තිබෙන සම්බන්ධය ගැන.

එතුමා සම්පූර්ණ ජීවිතයක් ගත කළා. හොඳ ආයු ප්‍රමාණයක් වළඳලා තමයි එතුමා අභාවප්‍රාප්ත වුණේ. ලංකා ඉතිහාසයේ ආයුර්වේදය දියුණු කරන්න ඉතාම පිරිසිදු විධියට, ඉතාම කැපවීමෙන් කටයුතු කරපු, කාටවත් ඇඟිල්ලක් දිගු කරන්න බැරි විධියට අදහස් ප්‍රකාශ කරපු, වෙදැදුරු ජීවිතයටම ඇබ්බැහි වෙමින් මුළු ජීවිතයම ඒ විද්‍යාව වටා සකස් කර ගනිමින් අපේ රටට සේවයක් කරපු ඉතාම ගෞරවණීය ලාංකික පුත්‍රයෙකුගේ අභාවය ගැන මේ අවස්ථාවේ අපේ කනගාටුව සහ සංවේගය ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාගේ ඥාතීන්ට අපේ සංවේගය දන්වන ලෙස ඔබතුමියගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.58]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඒ වාගේම මේ රටේ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ සිටි ප්‍රතාපවත් පුද්ගලයකු හැටියට ඒ ක්ෂේත්‍රයට අවුරුදු ගණනාවක් සේවය කරලා අප අතරින් වෙන් වෙලා ගිය ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන්නයි මා මේ අවස්ථාවේ නැඟී සිටියේ.

මට මතකයි, 1989 දී මේ රටට සමානුපාතික නියෝජන ක්‍රමය, -මනාප ක්‍රමය- හඳුන්වා දුන්න වෙලාවේ අප පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා ජාතික ලැයිස්තුවෙන් මේ පාර්ලිමේන්තුවට ආව ආකාරය. එදා ප්‍රේමදාස ජනාධිපතිතුමා එක් එක් ක්ෂේත්‍රවල සුවිශේෂ පුද්ගලයෝ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, මඳක් නිහඬ වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ශ්‍රියාණි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කථා කරන්න ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වෛද්‍ය ක්ෂේත්‍රය, කලා ක්ෂේත්‍රය, අධ්‍යාපන ක්ෂේත්‍රය වැනි එක් එක් ක්ෂේත්‍ර නියෝජනය කරන විශේෂ පුද්ගලයෝ ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට ගෙනාවා. මේ විධියට වෛද්‍ය ක්ෂේත්‍රය නියෝජනය කරන්න රණසිංහ ප්‍රේමදාස මැතිතුමා විසින් 70 හැවිරිදි වියේ පසු වුණු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා පත් කළා. එතුමා පත් කළේ නිකම්ම නොවෙයි. එතුමා මේ රටේ හොඳ වෙද පරම්පරාවක කෙනෙක්. එතුමාගේ පියාත් ප්‍රසිද්ධ ආයුර්වේද වෛද්‍යවරයෙක්. ඒ වෙද පරම්පරාවෙන් ආපු පුද්ගලයෙකු විධියටයි ප්‍රේමදාස මැතිතුමා එතුමා පාර්ලිමේන්තුවට පත් කළේ. ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාගේ සහෝදරයා රාජ්‍ය පරිපාලන සේවයට යද්දි මෙතුමා කල්පනා කරන්න ඇති මම මේ රටේ ජනතාවට සේවය කරන්න වෙදකම කරන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා නිකම්ම නිකම් වෛද්‍යවරයෙක් නොවෙයි. එතුමා විවෘත විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් වුණා. ඒ විතරක් නොවෙයි. එතුමා නාවින්න බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයේ උපදේශකයෙක් වුණා. ඒ එක්කම බොරැල්ල ආයුර්වේද රෝහලේ බාහිර අංශයේ කථිකාචාර්යවරයෙක් වුණා. ඒ වාගේ එතුමා ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ බොහොම ඉහළට ගිය සුවිශේෂ පුද්ගලයෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා දෙහිවල වෙදකම් කරද්දි අපත් සැරයක් දෙසැරයක් එහි ගියා මට මතකයි. එම ස්ථානයේ බෝඩ් දමලා තිබුණේ නැහැ. එතුමා දැන්වීම් දැම්මේ නැහැ. මිනිස්සු එතුමා සොයාගෙන ආවා. එතුමා සර්වාංග වෙදකම කරද්දි ප්‍රසිද්ධ වෙලා හිටියේ හොඳ ඇස් වෙද මහත්තයෙක් විධියටයි. ඒක නිසා තමයි ප්‍රේමදාස ජනාධිපතිතුමා එදා ජාතික ලැයිස්තුවෙන් එතුමා පාර්ලිමේන්තුවට පත් කළේ. මට මතකයි, අප තරුණ මන්ත්‍රීවරු විධියට එදා පාර්ලිමේන්තුවට එන කොට එතුමා සිටි ආකාරය. එතුමා කොණ්ඩය බැඳලා ඉන්න කොට මා හිතුවා මේ නම් වෙද මහත්තයෙක් වෙන්න ඇති කියලා. නමුත් අප දැක්කා එතුමා තුළ තිබුණු පෞරුෂත්වය. එතුමා බොහොම ගරු ගාම්භීර පෞරුෂයකින් හිටියා. අප තරුණ මන්ත්‍රීවරු වුණත්, එතුමා 70වැනි වියේ හිටියත් අපත් එක්ක මිත්‍රයෝ වාගේ ආශ්‍රය කළා. ගරු ජෝන් අමරතුංග මැතිතුමා කිව්වා වාගේ, අපි ලොබියට වෙලා බොහොම විහිළු තහළු කළා මට මතකයි.

එතුමා විශේෂයෙන්ම වෛද්‍ය ක්ෂේත්‍රයට විශාල සේවයක් කළා වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියටත් විශාල සේවයක් කළා. ඒ විතරක් නොවෙයි, අධ්‍යාපන ක්ෂේත්‍රයේදීත් එතුමා විවාදවලට සම්බන්ධ වෙලා එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. එතුමා මේ සියලු තනතුරුවලට ආවාට කොණ්ඩය බැඳපු එක අත් හැරියේ නැහැ. එතුමා විවාහ වෙලා හිටියේ ඉංග්‍රීසි ගුරුවරියක් සමඟයි. එතුමිය ඒ ගැන කියන්නත් නැතුව ඇති. කොහොම නමුත් එතුමා කොණ්ඩය කැපුවේ නැහැ. මෑත භාගයේදී -පසු ගිය දශක පහ හයේදී- පාර්ලිමේන්තුවේ කොණ්ඩය බැඳලා හිටපු එකම මන්ත්‍රීතුමා තමයි ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමා. එතුමාට ඒ වාගේ පුදුම ආත්ම ශක්තියක් තිබුණා. වෙන අය හිතනවා, කොණ්ඩය බැඳලා පාර්ලිමේන්තුවට එන්න බැහැ කියලා; කොණ්ඩය බැඳලා වෙදකම කරන්න බැහැ කියලා. නමුත් එතුමා කොණ්ඩය බැඳ ගෙන, රෙද්ද ඇඳ ගෙන, කෝට් එක ඇඳ ගෙන තමයි පාර්ලිමේන්තුවට ආවේ. එතුමා මේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ හිටපු සුවිශේෂී පුද්ගලයෙක්. එතුමා අපට බොහොම කිට්ටුවෙන් සිටිමින් අපට උපදෙස් දුන්නා.

ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව, එතුමා එක්ක පාර්ලිමේන්තුවේ කාලයක් ගත කරපු මන්ත්‍රීවරයෙක් විධියට මා එතුමාගේ පවුලේ සියලු ඥාතීන් වෙත කනගාටුව ප්‍රකාශ කරමින් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[4.02 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Speaker, I rise to express my condolences on the demise of the Hon. *Vaidyacharya* W.I. Fernando with whom we were very pally in this House.

Sir, in 1989 five of us came to this Parliament on the National List. As pointed out by my Friend who spoke earlier, we represented varied fields of activities. There was the Hon. Alec Robertson who represented the Burgher community. He, in fact, was a very renowned Buddhist lay preacher. Then, there was the Hon. Kalinga Obeywansa representing the arts and crafts here. He excelled in *Bera Wadanaya*, which is a tradition of the Sri Lankan community in this country. Then, there was the Hon. M.H. Amit, who represented the Malay community. His father-in-law was that great educationist and national leader, Dr. T.B. Jayah, who represented the Legislative Council. He occupied a distinguished position in our Legislature. Dr. T.B. Jayah first represented the Legislative Council during the time of the British Raj. Next, he represented the State Council under the British colonial rule. Then, he represented the independent Parliament and became the first Muslim Cabinet Minister. The Hon. Amit was his son-in-law and also his private secretary. So, he knew many problems of Ceylon's politics. They always stood for a united Sri Lanka - the Malay community and the Moor community.

From time immemorial, even during the period of the Dutch-Portuguese, the Muslims who were chased away from the coastal areas found solace in the Kandyan Kingdom. The Kandyan Kings liked those Muslims, our forefathers very much for they have been very great Ayurvedic - Unani physicians like the great personality to whom we are making reference in this House, the Hon. W.I. Fernando *Veda Mahata*. This *Veda Mahattaya* used to relate to us in the Lobby that the Muslims at that time administered indigenous medicine to the King and the King's family. When the *Bisawa* or the Princess in the palace took ill, the Ayurvedic - Unani Muslim Physician had felt the pulse of the patient through a *noola* - a

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

thread - held by the patient on the other side of the *thiraya*. තිරයෙන් එහා ලෙඩා. තිරයෙන් මෙහා වෙදා. අන්න එවැනි වෛද්‍ය ක්‍රමයක්, a superb medical system was developed of our own in ancient times. That is how the Muslims and the Sinhalese came to live so closely as friends, sharing their respective cultural values. They were given lands in the hill country as a result of the great medical attention paid by them.

"මන්ත්‍රීකම නිසා වෙදකම අත් හරින්නේ නැහැ. අවුරුදු 51 ක් තිස්සේ කළ වෙදකම දිගටම කරනවා. සිංහලයෙකු ලෙස මගේ කොණ්ඩයත්, කෝට් එකත්, රෙද්දත් වෙනස් කරන්නේ නැහැ." That is what this great local Sri Lankan physician told his friends when he was nominated to Parliament. When his Friends told him, "Now, you have to cut your *konde*", he said, "No, I shall not and even රෙද්දයි කෝට් එකයි මම වෙනස් කරන්නේ නැහැ". That is why the Leader of the Opposition dwelled at length about how the *Veda Mahattaya*'s dress was recognized as a part of the attire of this Legislature. No one else had been wearing that type of a dress. He was a hilarious, very humorous figure. We have yet to meet a person of the calibre of the Hon. W.I. Fernando in this House.

එතුමා සියලු දෙනාම සිනහවට පත් කරනවා. ඉතාම සැහැල්ලු සිතක් තමයි එතුමාට තිබුණේ. එතුමා මටයි, එවකට සිටි එම්.එච්.අමිත් මන්ත්‍රීතුමාටයි - who was a Malay Member - කියනවා,"හාජ්ජියාර් මහත්මයෝ දැන් මම කොහොම හරි රෙද්දයි, කමිසයයි, කෝට් එකයි ඇඳ ගෙන පාර්ලිමේන්තුවට එනවා" කියලා. එතුමාට ලස්සන belt එකක් තිබුණා. කරේ තිබුණේ tie එකක් නොවෙයි, chain එකක්. නමුත් ඉස්සර කොණ්ඩයට ගහපු පනාවක් එතුමා පාවිච්චි කළේ නැහැ, මේ ගරු සභාවේදී. නමුත්, he wore that outside. මට එතුමා කියනවා, "හාජ්ජියාර් ඔයගොල්ලන්ගේත් තිබෙනවා, සංස්කෘතික දේවල්. ඒවා තමුන්නාන්සේලා අනුගමනය කරන්නට ඕනෑ." කියලා. Members in the Legislative Council such as the Hon. M.C. Abdul Rahman, the Hon. W.M. Abdul Rahman and later Sir Razik Fareed and the Hon. N.H.M. Abdul Cader wore fez caps. ඉතාම අලංකාරයි. ඇයි ඒක අද ඇඳ ගෙන එන්නේ නැත්තේ කියලා අහනවා. දිවුරුම් දීම දීම පිණිස එතුමා කිව්ව නිසා මාත් ඇඳ ගෙන ආවා. ඒ fez caps ඇඳීමේ පුරුද්දට මම ඇබ්බැහි වී සිටිනවා.

අපි ඉතාම අගය කළ කෙනෙක් එතුමා. "මගේ කොණ්ඩය මගේ පැරණි සිංහලකමේ ලක්ෂණයක්. රෙද්දයි, කෝට් එකයි මම හිතන හැටියට අංග සම්පූර්ණ ඇඳුමක්" යැයි ප්‍රනාන්දු වෙද මහතා හැම විටම සඳහන් කළා. ප්‍රනාන්දු වෙද මහතා සුප්‍රකට වෙද පපුරකින් පැවත එන්නෙක්. එතුමා දේශීය වෛද්‍ය විද්‍යාව, ආයුර්වේදය පිළිබඳ විශාරදයෙක්; නාවින්න ආයුර්වේද වෛද්‍ය පර්යේෂණායතනයේ උපදේශකවරයෙක්; ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ - දේශීය වෛද්‍ය ආයතනය සහ බොරැල්ල ආයුර්වේද රෝහලේ - බාහිර කථිකාචාර්යවරයෙක්. "මා මන්ත්‍රී වුණත් මගෙන් ප්‍රතිකාර ලබන මහජනයාට, මා හමුවන්න ඉඩ තිබෙන්නට ඕනෑ. පාර්ලිමේන්තුවේදීත් මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ මේ රටේ දේශීය වෛද්‍ය ක්‍රමය, දේශීය වෛද්‍යවරුන් සහ ආයුර්වේද ප්‍රතිකාර ලබන අය ගැන. මට මන්ත්‍රීකම හුරු නැහැ. නමුත් වෙදකම මට හොඳට හුරුයි" කියලා ඩබ්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමා අප සමඟ හැම තිස්සේම වාගේ පවසනවා. වෛද්‍යාචාර්යතුමාගේ පියාණන් වූ වෛද්‍ය බැප්ටිස් ප්‍රනාන්දු මහතා ද එ කල කෝට්ටේ සහ කළුබෝවිල සේවය කළ ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක්. එතුමාගේ මාමාගෙන්, ඒ කියන්නේ බිරිඳගේ පියාගෙන්- වීරසුන්දර වෙදආරච්චි මහතාගෙන්- වාගේම වෙද මුහන්දිරම් ඩී.ඒ.පී. අභයසේකර මහතාගෙන් ඉගෙන ගෙන 1938 සිට අවුරුදු 51ක් වෛද්‍ය සේවයේ යෙදුණා. වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු මහතාට ඒ අවස්ථාවේ වයස අවුරුදු 75 ක් ගෙවී තිබුණා. නමුත් එතුමා අවසන් හුස්ම හෙළනකොට අවුරුදු 99ක ආයු කාලයක් ගෙවමින් හිටියා. එතුමා පිරිසිදු ජීවිතයක් ගත කළා. එතුමා පදවි, පට්ටම්, ධානාන්තරවලට ලොල් කමක් දැක් වූයේ නැහැ; ආශාවක් දැක් වූයේ නැහැ. එතුමා මේ ලෝකයේ ජීවත් වුණේ වතුරේ සිටින හංසයා වාගෙයි. ගිලෙන්නේ නැහැ. කවදාවත් වතුරේ ගිලෙන්නේ නැහැ. එතුමා ඒ වාගේ ජීවිතයක් ගත කළ බව අප හොඳාකාරව දන්නවා.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු මැතිතුමා අධ්‍යාපනය ලැබුවේ, වාද්දුව, මැලෑගම සිංහල කණිෂ්ඨ පාසලේ 5 වන පන්තිය දක්වා පමණයි. එච්චරයි එතුමා ඉගෙන ගත්තේ. ඩී.එස්.සේනානායක අපේ ප්‍රථම අග්‍රාමාත්‍යතුමා පවා හත්වන පන්තියෙන් පාස් කළේ. මේක හොඳ ලස්සන කථාවක්. දිනක් එතුමා පාසල ඇරිලා ගෙදර ඇවිත් කොණ්ඩය කපන්නට අම්මාගෙන් ශත 10ක් ඉල්ලුවා. ශත 10ක් නොලැබුණු නිසා දිගටම කොණ්ඩය බැඳීමට තීරණය කළා. එතුමා අවසන් හුස්ම හෙළන මොහොත දක්වාම දිගටම කොණ්ඩය බැන්දේ අන්න ඒ හේතුව නිසාය කියන එක අද අප ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වෛද්‍යාචාර්යතුමා අප ඇලුම් කළ කෙනෙක්. සියලු දෙනාගේම හිත් දිනා ගත්තු කෙනෙක්. එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලු දෙනාටමත්, දූ දරුවන්ටත් අපගේ ශෝකය පළ කිරීමට කැමැතියි. "මැති සබේට එන කොණ්ඩ වෙද මහත්මයා" කියලා, 1989.02.25 දිනමිණ පත්තරේ එතුමා පිළිබඳව විස්තරයක් පළ කරලා තිබෙනවා. ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු යුවලගේ ඡායාරූපයකුත් එහි තිබෙනවා. "දෙහිවල කොණ්ඩ වෙද මහත්තයා" යනුවෙන් අප හඳුන්වන ප්‍රනාන්දු මැතිතුමාගේ පියා වන ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු මහත්මයාත්, එතුමාගේ බිරිඳත් දේශීය වෛද්‍යාචාර්යවරුන්. අපි ප්‍රනාන්දු වෙද මහත්මයාගෙන් හැම විටම හුඟාක් පාඩම් ඉගෙන ගත්තා. කාට හරි වෛද්‍ය ක්‍රමය ගැන ඉගෙන ගන්නට ඕනෑ නම්, වෛද්‍ය ක්‍රමය අනුගමනය කරන්නට ඕනෑ නම් දෙහිවල පිහිටි අංක 15 දරන එතුමාගේ නිවසට එන්නය කියලා එතුමා අපට ආරාධනා කළා.

Sir, this distinguished personality served as a colourful figure in this House for 4 years, 8 months and 17 days. Unfortunately, he had to cut his Parliamentary journey in 1993, a little shorter than we did after coming into Parliament, because he had to give way for the late Hon. Anura Bandaranaike to come to Parliament. He did not mind it because he had no love or lust for positions. He sacrificed his seat straightaway and gave it to the Hon. Anura Bandaranaike. He was hailed as one of the greatest democrats in this country, who, at a time of need, was able to help his leaders.

එතුමාගේ අභාවය පිළිබඳව එතුමාගේ පවුලේ සියලු දෙනාට වෙත අපගේ ශෝකය පළ කරන අතර, එතුමාට නිවන් සුව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.15]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, විද්‍යානිධි, ආයුර්වේද පණ්ඩිත් ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමන් මේ සභාව නියෝජනය කරපු ඉතාම දුර්ලභ ගණයේ මන්ත්‍රීවරයෙක් හැටියටයි අප දකින්නේ. එතුමා බොහොම කීර්තිමත් වෙද පරපුරකින් පැවත ආපු කෙනෙක්. එතුමාගේ පියාත්, පියාගේ පියාත් ඒ වාගේම මවු පාර්ශ්වයත් මේ රටේ වෙදකමට බොහොම දක්ෂ පක්ෂකම් දක්වපු උදවිය හැටියටයි අප අහලා තිබෙන්නේ. ප්‍රනාන්දු වෙද මහත්තයා කොණ්ඩය නිසා ලොකු ප්‍රසිද්ධියක් ලබාපු කෙනෙක්. එතුමාට "කොණ්ඩ වෙදා" නමින් මේ රටේ බොහොම ප්‍රසිද්ධියක් ලබන්නටත් පුළුවන්කම ලැබුණා. එතුමා ඒ දිග කොණ්ඩයට බොහොම ඇලුම් කළා. ඒ කොණ්ඩය නිසා "කොණ්ඩ වෙදා" නමින් නම පට බැඳුණාම කොණ්ඩයට වාගේම "කොණ්ඩ වෙදා" කියන නමටත් එතුමා එක විධියටම ඇලුම් කළා. අපේ අස්වර් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ එතුමා ගැන සඳහන් වෙච්ච පුවත් පතක මමත් දැකලා තිබුණා, එතුමා මේ කොණ්ඩය වවන්න පටන් ගත්තේ මොකක් නිසාද කියලා.

පාසල් යන කාලයේ, කුඩා වයසේදී දවසක් කොණ්ඩය කපන්න අම්මාගෙන් ශත 10ක් ඉල්ලුවාම අම්මා ඒක දෙන්න ප්‍රතික්ෂේප කරපු නිසා එතුමා තීරණය කළා ලු, "මම අද ඉඳලා දිගටම කොණ්ඩය වවනවා" කියලා. එතුමා කොණ්ඩය කපන්නේ නැතුව තමන්ගේ ප්‍රතිපත්තිගරුකභාවය දිගටම ආරක්ෂා කළා. එතුමාගේ වෙදකම කොයි තරම් ප්‍රසිද්ධ ද කියනවා නම්, කවදාකවත් එතුමා බෙහෙත් ශාලාවේ බෝඩ් එකක් දැම්මේවත්, වෙනත් වෙද මහත්වරු වාගේ පත්තර දැන්වීම් දමන්නටවත් කටයුතු කළේ නැහැ. වෙදකමට තිබුණු සුවිශේෂ දක්ෂතාව නිසා බෝඩ් නැතුවාට, දැන්වීම් නැතුවාට එතුමාව හොයා ගෙන ලංකාවේ හැම තැනින්ම ලෙඩුන් ආවා. එතුමාව හොයා ගෙන ලෙඩුන් ආවා වාගේම, මන්ත්‍රීකමත් එතුමාව හොයා ගෙන තමයි ආවේ.

එතුමා විවාහ වුණේ ඉංග්‍රීසි ගුරුවරියක් එක්කයි; තමන්ගේ පවුලට බොහොම සමීප ඥාතිකමක් තිබුණු ඇවැස්ස නෑනා සමඟයි. එතුමා විවාහ ජීවිතය බොහොම ආදර්ශවත් විධියට ගත කළා. ඉතාම හොඳ ස්වාමිපුරුෂයෙක් හැටියටයි එතුමා කටයුතු කළේ. එහි ප්‍රතිඵලයක් හැටියට, දරුවන් නව දෙනෙකුගේ සෙනෙහෙබර පියෙකු හැටියට දරුවන් සමඟ, ඒ වාගේම දරුවන්ගේ දරුවන් - මුණුපුරන් සහ මිණිපිරියන්- සමඟත් ඉතාම සුහදව, බොහොම සන්තෝෂයෙන් එතුමාට දීර්ඝායු වින්දනය කරලා අවසන් හුස්ම හෙළන්නට භාග්‍ය ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෙද මහත්තයා බොරැල්ල ආයුර්වේද විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ලෙස දේශීය වෛද්‍ය විෂය වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උගන් වන කොට ඉතාම සරලවත්, බොහොම රසවත් විධියටත් උගන් වන්නට කටයුතු කරපු බව අපි නොයෙක් අවස්ථාවලදී අහලා තිබෙනවා. එතුමාගේ දේශන දේශීය වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කවදාකවත් අමතක නොවන විධියට බොහොම රසවත්ව ඉදිරිපත් කරන්නට එතුමා දක්ෂ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රනාන්දු වෙද මහත්තයා, එහෙම නැත්නම් අපේ හිටපු මන්ත්‍රීතුමා ආයුර්වේද ශාස්ත්‍රය පිළිබඳව බොහොම ගැඹුරින් පොත්පත් අධ්‍යයනය කරපු කෙනෙක්. ඒ පොත්පත්වල තිබුණු යමක් ඕනෑම තැනකින් ඇහුවා නම් එතුමාට කට පාඩමින් ඒවා ගැන කියන්න පුළුවන්කමක් තිබුණා. ඒ අහපු තැන විතරක් නොවෙයි, ඊට උඩ ඡේදයත්, ඊට යට ඡේදයත් කට පාඩමින් කියලා තමන්ගේ දැනුම හැම තිස්සේම පෙන්වපු කෙනෙක් තමයි අපේ වෛද්‍යාචාර්යතුමා. ඒ වාගේම සිංහල භාෂාව පිළිබඳව එතුමාට හසළ දැනුමක් තිබුණා. සිංහල භාෂාවේ ඕනෑම වචනයක් බොහොම රසවත් විධියට ක්ෂණිකව උඩු යටි කුරු කරලා, ඕනෑම කෙනෙකුට හිනාව උපදවන විධියට ඒවා එහාට මෙහාට කරලා කියන්නට පුළුවන් සුවිශේෂ හැකියාවක්, සහජ දක්ෂතාවක් ප්‍රනාන්දු වෙද මහත්මයා සතුව තිබුණා. අපේ වෙද මහත්මයා විද්වතුන් අතරට ගිය විට හොඳ විද්වතෙකු හැටියට කැපිලා පෙනුණා. වැඩිහිටියන් අතරට ගිය විට එතුමා බොහොම ආදර්ශවත් වැඩිහිටියෙකු හැටියට කැපිලා පෙනුණා. තරුණයෝ අතරට ගියාම එතුමාත් තරුණයෙකු හැටියට තමයි ක්‍රියා කළේ. කුඩා දරුවන් අතරට ගියාම කුඩා දරුවකු වාගෙයි ක්‍රියා කළේ. ඒ වාගේ හැම කෙනාටම ගැළපෙන විධියට ජීවත් වෙන්නට පුළුවන් සුවිශේෂී හැකියාවක් එතුමා සතුව තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ ආදර්ශවත් ජීවිතයේ බොහොම වැදගත් තැන් කිහිපයක් අපි අහලා තිබෙනවා. එතුමා පවුලේ වැඩිමහල් පුත්‍රයා. එතුමාට සහෝදරියන් හිටියේ නැහැ. එකම සහෝදරයයි හිටියේ. ඒ සහෝදරයාත් මේ රටේ බොහොම ප්‍රසිද්ධ කෙනෙක්. දිසාපතිවරයෙකු හැටියට, ආයුර්වේද කොමසාරිස්වරයකු හැටියට මේ රටට සුවිශාල සේවාවක් ඉටු කරපු කෙනෙකු තමයි එතුමාගේ සහෝදරයා. තම සහෝදරයා ආයුර්වේද කොමසාරිස් විධියට පත් වුණාම, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ දරපු සියලුම තනතුරුවලින් ඉවත් වෙන්නට තරම් එතුමා නිහතමානී වුණා. ඒ වාගේ පුදුම ආදර්ශ එතුමා අපට ඉතුරු කරලා ගිය කෙනෙක්. මන්ත්‍රීකම එතුමාව හොයා ගෙනයි ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය වෙදකම ගැන එතුමාට තිබුණේ මහා දැනුම් සම්භාරයක්. දිවංගත ප්‍රේමදාස ජනාධිපතිතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම දේශීය වෙදකම නඟා සිටුවන්න ඕනෑ, අපේ ගම්වල වෙද මහත්වරුන්ට කරන සැලකීමක් හැටියට ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් වෙන් කළ යුතුයි කියලා තීරණය කරලා ඒ සඳහා මෙතුමාගේ නම යෝජනා කළා. ඒක ප්‍රනාන්දු වෙද මහත්තයාගේ හිතේ තිබුණු දෙයක් නොවෙයි. එය බලාපොරොත්තු වෙච්ච දෙයක් නොවෙයි. එතුමාව හොයා ගෙන එක පාරට ආවා; මන්ත්‍රීවරයෙකු හැටියට මේ ගරු සභාවට පත් කළා. හැබැයි එතුමා එවෙලේ කියපු දෙයක් තමයි "මට මන්ත්‍රීකම හුරු නැහැ. මට වෙදකම හොඳට හුරුයි." ඒ නිසා මගේ වෙදකමට බාධාවක් නැත්නම් විතරක් මට ඔය මන්ත්‍රීකම භාර ගන්න පුළුවන්ය කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර අය තමන්ගේ ජීවිත පවා නැති කර ගෙන, සමහර අය තමන්ගේ ආත්මගෞරවය පවා නැති කර ගෙන මේ සභාවට එන්න හදන කාලයක එතුමා තමන්ට නිකම්ම ලැබුණු මන්ත්‍රීකම භාර ගත්තේ වෙදකමට බාධාවක් වෙන්නේ නැත්නම් විතරක් භාර ගන්නම්ය කියායි. මන්ත්‍රීකම ලැබුණත් එතුමා වෙදකම අත් හැරියේ නැහැ. ඒ වාගේම පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳලා එතුමා දේශීය වෙදකමේ උන්නතිය වෙනුවෙන් හැම තිස්සේම තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා වෙදකම අත් හැරියේ නැති වෙදමහත්මයා පාර්ලිමේන්තුවේ ඉඳලා නිවසට යනකොට, පරණ විධියටම එතුමා මුණ ගැහෙන්න ලෙඩ්ඩු පිරිලා හිටියා. එතුමාට තිබුණේ පුදුම පෞරුෂත්වයක්.

මට මතකයි එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වුණාට පසුවත් වෙදකම කරද්දී මගේ පියාගේ ඇස් පරීක්ෂා කිරීම සඳහා පියා සමඟ මමත් එතුමා හමු වෙන්න ගියා. මට අද වාගේ මතකයි, එතුමා තුළ තිබුණු පෞරුෂත්වය. බොහොම ප්‍රියශීලී පුද්ගලයෙක්,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ප්‍රතාපවත් පුද්ගලයෙක් නිවසේ වෙද කුටියේ පුටුවේ වාඩි වෙලා හිටියා. ඒ වටපිටාව ගැන තවම මට මතකයි. ආයුර්වේද ග්‍රන්ථවලින් පිරුණු අල්මාරියක් තිබුණා. මේසය පුරා බුලත් හුරුළු තිබුණා. ඒ හැම එකක් අතරම ප්‍රතාපවත් පුද්ගලයෙක් බොහොම සුහදශීලීව රෝගීන් පරීක්ෂා කරපු හැටි අපට අමතක වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා විදේශ සංචාරයක් යනකොට වෙච්ච සිද්ධියක් මට අහන්න ලැබුණා. දවසක් එතුමා ගුවන් යානයේ යනකොට විදේශිකයෙක් බොහොම බරපතළ ලෙස හදිසියේ රෝගාතුර වී තිබෙනවා. ඒ ගුවන් යානයේ කාර්ය මණ්ඩලය බොහොම යුහුසුළුව ඒ රෝගියාට ප්‍රතිකාර කරලා සුවපත් කරන්න උත්සාහ කරනකොට, ගුවන් මගියෙක් බරපතළ ලෙස රෝගාතුර වෙලාය කියා ප්‍රනාන්දු වෙද මහත්මයාට දැන ගන්න ලැබී තිබෙනවා. එතුමා වහාම එතැනට මැදිහත් වෙලා, එතුමාගේ බෙහෙත් පසුම්බියේ තිබුණු බෙහෙත් දීලා, හැමෝම මවිතයට පත් කරමින් බරපතළ ලෙස රෝගාතුර වෙලා හිටපු ඒ විදේශිකයා බොහොම ක්ෂණිකව සුවපත් කරපු හැටි අපි අහලා තිබෙනවා. ඊටපසුව ඒ ගුවන් යානා සමාගමෙන් එතුමාගේ ගෙදරට ලියුමකින් පවා දන්වා තිබෙනවා, ඒ කරපු උපකාරය වෙනුවෙන් එතුමාට අවශ්‍ය ඕනෑම දෙයක් තිබේ නම් දැනුම් දෙන්නය කියා. නමුත් එතුමා ඒ කිසිම දෙයක් බලාපොරොත්තුවෙන් නොවෙයි ඒ සේවාවන් ඉටු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ජර්මනියේ සංචාරය කළ අවස්ථාවකදී එතුමාට ඒ රටේ සජීව රූපවාහිනී වැඩසටහනකට සහභාගි වෙලා එතුමාගේ විශ්වකර්ම හැකියාවන් ප්‍රදර්ශනය කරන්නට පවා අවස්ථාව ලැබී තිබෙනවා. ඒ වාගේම ඒ වැඩසටහනේදී විදේශිකයන් මවිතයට පත් කරමින් නාඩි පරීක්ෂා කිරීමේ හැකියාවන් ප්‍රදර්ශනය කළ හැටි අපි අසා තිබෙනවා. ඒ වැඩසටහනේ එක් අවස්ථාවකදී විදේශිකයන්ගේ නාඩි පරීක්ෂා කර රෝගී තත්ත්වයන් ගැන කළ විග්‍රහයන් අහලා ඒ විදේශිකයන් පුදුමාකාර විධියට මවිතයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එතුමා අපේ දේශීය වෙදකමට විශාල ප්‍රසිද්ධියක් ලබා දුන්නා; විශාල ගරුත්වයක් ලබා දුන්නා. ඒ ගරුත්වය නිසාම එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා දේශීය වෛද්‍ය ක්‍රමයේ ලොකු පිබිදීමක් ඇති කරන්නට සමත් වුණා. එතුමා තමන්ට ලැබුණු මන්ත්‍රීකම කවදාවත් ආභරණයක් හැටියට පාවිච්චි කළේ නැහැ.

එතුමා පාර්ලිමේන්තු වරප්‍රසාද තුට්ටුවකටවත් ගණන් ගත්තේ නැති කෙනෙක්. ඕනෑම වෙලාවක ඒවා අත් හැර යන්න පුළුවන් බව එතුමා ඔප්පු කරලා පෙන්නුවා. මේ පාර්ලිමේන්තුවේ හිටපු වසර කිහිපය ඇතුළත කවදාවත් එතුමා මේ පාර්ලිමේන්තුවෙන් කෑම වේලක් කනවා දැකලා නැහැ කියා අපට අපේ පැරණි සේවකයන් පවා කියා තිබෙනවා. තමන්ගේ ගෙදරින් ගෙනෙන කෑම එක තමයි එතුමා ලොකුවට රස වින්දේ. ඒ වාගේම එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ට ලැබුණු මුල්ම වැටුප තමන් අධ්‍යාපනය ලැබූ වාද්දුව, මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙණට පරිත්‍යාග කරන්නට තරම් එතුමා සමත් වුණා. ඒ වාගේම මන්ත්‍රීකම අත් හැරලා, ඕනෑම වෙලාවක ගෙදර යන්න පුළුවන්ය කින එක එතුමා ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වමින් ලොකු ආදර්ශයක් දුන්නා. අනුර බණ්ඩාරනායක මැතිතුමාට එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් දෙන්න අවශ්‍ය වෙච්ච වෙලාවේ එතුමා බොහොම නිර්ලෝභීව තමන්ගේ මන්ත්‍රී ධුරය පරිත්‍යාග කරන්න ඉදිරිපත් වුණා.

ඒ මන්ත්‍රී ධුරය පරිත්‍යාග කරපු විධිය ගැන කල්පනා කරනකොට අපට එතුමාගේ තිබුණු නිරහංකාර බව, තනතුරු, තානාන්තර, වරප්‍රසාදවලට කිසිම ගිජුකමක් නොතිබුණු බව හොඳින්ම ඔප්පු වනවා. ඒ වනකොට එතුමාගේ මන්ත්‍රී ධුරයට වයස තිබුණේ අවුරුදු 04යි, මාස 08යි, දින 17යි. අවුරුදු පහක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන බව දැන දැනත්, ඒ කිසිම දෙයක් ගැන එතුමා හිතුවේ නැහැ. තව දින කිහිපයක් එතුමා මන්ත්‍රී ධුරයේ සිටියා නම් එතුමාත් විශ්‍රාම වැටුපකට හිමිකම් ලබනවා. එහෙනම් අදටත් මාසයකට විශාල විශ්‍රාම වැටුපක් එතුමා වෙනුවෙන් ලැබෙනවා. නමුත් විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නට ආසන්න බව පෙනි පෙනීත් මන්ත්‍රීකම අත්හැරියේ ඒ කිසිම වරප්‍රසාදයක් එතුමා ගණන් ගන්නේ නැහැ යි කියන එක ප්‍රදර්ශනය කරමිනුයි.

එතුමා බොහොම ප්‍රතිපත්ති ගරුකව කටයුතු කළ කෙනෙක්. අපේ අස්වර් මන්ත්‍රීතුමා කිව්වා, එතුමා කවදාවත් තමන්ගේ ඇඳුම වෙනස් කරන්නට ක්‍රියා කළේ නැහැ යි කියලා. තමන්ගේ සිංහලකම ප්‍රදර්ශනය කරමින් රෙද්ද ඇඳලා, කමිසය ඇඳලා මේ පාර්ලිමේන්තුවට ආවේ බොහොම අභිමානයෙන්. එතුමා කොණ්ඩය කපන්නට කවදාවත් හිතුවේ නැත්තේ ප්‍රතිපත්ති ගරුක භාවය නිසායි. මේ ගරු සභාවට ආවා කියලා කවදාවත් තමන්ගේ ඇඳුම වෙනස් කරන්නට ක්‍රියා කළේත් නැහැ; පක්ෂ මාරු කරන්නට ක්‍රියා කළේත් නැහැ. එතුමා ආදර්ශවත් දේශපාලනඥයකු හැටියට මේ ගරු සභාවේ ගත කළා කියන එක අපට මතක් වෙනවා.

මා මීට වඩා දීර්ඝව එතුමා ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එතුමා බොහොම දුර්ලභ ගණයේ චරිතයක්. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු පුද්ගලයන් අතර තවත් අවුරුදු ගණනාවක් ගියත් අපි හැම කෙනෙකුටම මතක සිටින චරිතයක් වූ ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු වෛද්‍යාචාර්යතුමා මෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ ආදරණීය මැතිනිය ඇතුළු එතුමාගේ දරුවන් නව දෙනාටත්, ලේලිවරුන් හා බෑනාවරුන්ටත්, එතුමාගේ ආදරණීය මුනුබුරු මිනිබිරියන් ඇතුළු එතුමාගේ පවුලේ සියලු දෙනාටත් අපගේ සංවේගය පළ කරන අතර, අපගේ ශෝකය පවුලේ අය වෙත දන්වා යවන මෙන් ඉල්ලා සිටිනවා. වෛද්‍යාචාර්යතුමකු මෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමකු වන ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාට අමාමහ නිවන් සුව අත්වේවා යි මා ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩබ්ලිව්.අයි. ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින් මමද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවේ මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු ලෙස කටයුතු කළ, වර්තමාන අතිරේක සොලිසිටර් ජෙනරාල්, ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මහතාගේ මාමණ්ඩිය හැටියට එතුමා පිළිබඳව දැන ගෙන සිටි මම පෞද්ගලිකවම ජයන්ත ජයසූරිය මැතිතුමා ඇතුළු එම පවුලේ සියලුම දෙනාට මගේ පෞද්ගලික ශෝකයත් පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි.

මෙම රැස්වීමට අදාළ හැන්සාඩ් නිල වාර්තාවේ පිටපතක් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට මම නියෝග කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The Adjournment Motion is to be moved by the Hon. Ranjith Madduma Bandara.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Sir, I rise to a point of Order. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් භාර දී ඇති සභාව කල් තැබීමේ යෝජනාවේ වස්තු විෂය වන කාරණා සියල්ලම පාහේ ඊයේ දවස පුරා පැවැති මුදල් අමාත්‍යාංශයට අදාළ යෝජනා පිළිබඳ විවාදයේ දී පූර්ණ වශයෙන්ම සාකච්ඡා වුණා. විශේෂයෙන්ම මේ වාහන බදු පිළිබඳව ප්‍රශ්නය ඇතුළු සියලු දේ වෙනම අයිතමයන් හැටියට එම යෝජනාවල සඳහන් වුණා. ඒ නිසා මා ඉතාම ගෞරවයෙන් ඔබතුමා වෙත සැලකර සිටින්නේ, අපේ ස්ථාවර නියෝග අනුව එසේ විවාද කළ කාරණයක් නැවත වතාවක් සභාව කල් තැබීමේ යෝජනාවක් ලෙස ගෙන විවාදයක් පැවැත්වීමට ඉඩකඩ නොමැති බවයි.

එම නිසා මෙම යෝජනාව යම් ආකාරයෙන් සංශෝධනය කරලා, එම විවාදයට අයත් නොවුණු කාරණා පිළිබඳව වෙනමම යෝජනාවක් ඉදිරිපත් කරනවා විනා, මේ ආකාරයෙන් සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට හැකියාවක් නොමැති බව ඔබතුමා වෙත මා ඉතාම ගෞරවයෙන් දන්වා සිටිනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ විවාදයට ගත්තේ වාහන බදු මුදල් සම්බන්ධ කාරණයයි. හිටි අඩියේ වාහන ආනයන බදු වැඩි කරපු නිසා මේ රටේ වාහන ගෙන්වපු දහස් ගණනකට වෙච්ච අසාධාරණයක් වෙනුවෙන් තමයි මම අද කථා කරන්න යන්නේ.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඊයේ ඒ සම්බන්ධව කථා කළා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ කථා කළේ වාහන ආනයන බදු සම්බන්ධවයි. නමුත් වාහන ආනයනය කරපු විශාල පිරිසක් අද අසීරු තත්ත්වයට පත් වෙලා තිබෙනවා, ආණ්ඩුව හිටි අඩියේ මේ වාහන තීරු බදු වැඩි කරපු නිසා. ඒ සම්බන්ධයෙනුයි මම කථා කරන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඊයේ දිනයේ වාහන බදු සම්බන්ධ කාරණය මේ ගරු සභාවේදී සාකච්ඡාවට භාජනය වුණා. ඊයේ දිනයේ සාකච්ඡා නොවුණු යම් කරුණක් මේ සභාවේ සාකච්ඡාවට ගැනීමට තිබෙනවා නම් එය යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්න. ඒ යෝජනාව සලකා බැලීමට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මේ අවස්ථාවේදීම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
නැහැ. මේ අවස්ථාවේදී නොවෙයි. ඒ අවස්ථාව පසුව ලබා දෙන්න කටයුතු කරනවා. ඒ අනුව මෙම යෝජනාව මේ අවස්ථාවේ සාකච්ඡාවට ගැනීමට අවසර ලබා දෙන්නේ නැහැ. ඔබතුමාට පුළුවන්, ඊයේ සාකච්ඡා නොවුණු කාරණා මත පදනම් වුණු යෝජනාවක් ඉදිරිපත් කිරීමට.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ සභානායකතුමාගෙන් මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. මට තිබෙන ප්‍රශ්නය මෙයයි. වාහන ගෙන්වන්න ණයවර ලිපි විවෘත කිරීමෙන් පසු වාහන බදු වැඩි කිරීම නිසා විශේෂයෙන්ම -මේ රටේ වාහන ගෙන්වන ව්‍යාපාරිකයන් නොවෙයි- පෞද්ගලිකව වාහන ගෙන්වීමට කටයුතු කළ රජයේ සේවකයන්, සාමාන්‍ය පන්තියේ පුද්ගලයන් අසීරු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි අහන්නේ රජයෙන් ඒකට සහනයක් දෙනවාද කියන එකයි. මොකද ඒ අය ණයවර ලිපි විවෘත කර වාහන ආනයනය කරන්න කටයුතු කළ වෙලාවේ තිබුණේ වෙන බදු ක්‍රමයකුයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන්නේ මේ කාරණය කෙටියෙන් විසඳා ගන්න පුළුවන් ඊයේ ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය මුදල් ඇමතිතුමාගේ පිළිතුරු කථාව ඇහුවා නම්. ඒ පිළිතුර කථාව තුළ එසේ පෞද්ගලිකව වාහන ආනයනය කරන ලද රජයේ සේවකයන් ඇතුළු අනෙක් අය වෙනුවෙන් දැන් යම් සමීක්ෂණයක් එතුමාගේ අමාත්‍යාංශය මගින් කර ගෙන යන බවත්, ඔවුන්ට සහන සැලසීම සඳහා ක්‍රියා මාර්ගයක් ගැනීමට යන බවත් ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම ඒ ගැන සොයා බලා ගෙන යනවා. කොච්චර ප්‍රමාණයක් එහෙම කරලා තිබෙනවාද, සත්‍ය වශයෙන්ම ඒ අය ඔවුන්ගේ පාවිච්චිය සඳහාම ගෙන එන ලද වාහනද යන්න පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවා. නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා වශයෙන් එතුමා ඊයේ ඒ ගැන ප්‍රකාශ කළා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ විවාදයේදී විවිධ අංග අතර විශේෂ මාතෘකාවක් වුණේ වාහන ආනයන බදු සම්බන්ධ කාරණයයි. කිහිප දෙනෙකුම මන්ත්‍රීතුමා අද මේ ගෙන එන යෝජනාවේ සඳහන් කරුණු විවාදයට ලක් කළා. ඒක සුවිශේෂ මාතෘකාවක්. ඒ අනුව පිළිතුරු කථාව කරපු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා පැහැදිලිවම කිව්වා, මේ මතයම මීට ඉස්සෙල්ලාත් මේ සභාවේ ඉදිරිපත් කරලා තිබෙනවාය, ඒක සැලකිල්ලට ගෙන විමර්ශනයක් කරලා අවසාන තීන්දුවක් ලබා දෙනවාය කියලා. ඒ නිසා ඒ ස්ථාවරයෙන් එහාට යන්න කිසි තත්ත්වයක් අද ඇති වෙලා නැහැ. ඒක විමර්ශනයට ලක් වන බව ඊයේ ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා. ඉතින් ඔබතුමාම විනිශ්චයක් කරන්න, මේ අවස්ථාවේදී මේ ප්‍රශ්නය විවාද කිරීමෙන් හරයක් තිබෙනවාද, නැද්ද කියලා. අපි ඒ යෝජනාවට විරුද්ධ නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ඉෂ්ට වෙනවා නම් මට කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ සභාවේ කාලය කා දැමීමට මට අවශ්‍ය නැහැ. මම අහන්නේ ඒ අයට යම් සහනයක් දෙන්න කටයුතු කරනවාද කියන එකයි. නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මීට මාසයකට ඉස්සෙල්ලාත් කිව්වා, ඒකට සහනයක් දෙනවා කියලා. නමුත් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා මේ සහනය දෙන්න විධියක් නැති බවක් කියා තිබෙනවා කියලා අපට දැන ගන්නට ලැබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මීට මාසයකට ඉස්සෙල්ලාත් කිව්වා මේකට සහනයක් දෙනවා කියලා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කියනවා, එහෙම දෙන්නේ නැහැ කියලා. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඔබතුමා මේ ප්‍රශ්නය නඟපු නිසා මම මෙහි වර්තමාන තත්ත්වය ඉතාම පැහැදිලිව කියන්නම්. තවමත් කිසිම තීන්දුවක් අරගෙන නැහැ එහෙම සහනයක් දෙන්න. නමුත් මේ විෂය ගැන තව දුරටත් සොයා බලන බව ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා ඊයේ ප්‍රකාශ කළා. ඒ අනුව මුදල් අමාත්‍යාංශය මේ ගැන අද නැවතත් විමර්ශනය කරලා කිසියම් අවසාන තීරණයක් ලබා දෙනවා ඇති.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ යෝජනාවේ එක කොටසක් තමයි, ඒ. ඒකෙම තව කොටසක් තිබෙනවා. [බාධා කිරීමක්] මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න කෝ. මේකේම තව කොටසක් තිබෙනවා. වාහන ආනයනය කරන්න ලක්ෂ 100ක බලපත්‍ර ගාස්තුවක් අය කරන්න යනවා කියලා. ඒ සම්බන්ධවත් මගේ යෝජනාවේ තිබෙනවා. ඒ ගැන මට කථා කරන්න පුළුවන්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඊයේ විවාද කළ අවස්ථාවේදී යම් යම් ඉල්ලීම් සිදු වුණා. අපි පැහැදිලිවම කියලා තිබෙනවා ඒවා ගැන සොයා බලනවා කියලා. ඊයේ සාකච්ඡා කළ දේ සම්බන්ධව අද අවසාන පිළිතුරක් දෙන්න විධියක් නැහැ. නමුත් ඒ සහනය දෙන්නත් අපි තීරණය කරලා නැහැ කියලා මම ඉතාම වග කීමෙන් කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව මා සතුව තිබෙනවා. මේ යෝජනාවේ හරය පිළිබඳව තීරණයක් ගැනීමට තමයි අවස්ථාව උදා වෙලා තිබෙන්නේ. හැන්සාඩ් වාර්තාව කියවා බලා ඊයේ දිනයේ සාකච්ඡාවට භාජනය නොවූ යම් කාරණාවක් තිබේ නම් ඒ කාරණා පදනම් කර ගෙන යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ඔබතුමාට දැනුම් දෙනවා. ඒ අනුව මෙම යෝජනාව අද දින සාකච්ඡාවට ගැනීමට අවසර ලබා දෙන්නේ නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.37ට, 2012 ජූනි මස 07වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 4.37 மணிக்கு பாராளுமன்றம், 2012 யூன் 07, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 4.37 p.m. until 1.00 p.m. on Thursday, 07th June, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.